3

ශ්‍රේණිය

## මූලික පිරිවෙන්

# සමාජ විද්‍යාව

## මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර

## Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර i-ii**



සමාජ විද්‍යාව - මධ්‍ය හා අවසාන වාර ප්‍රශ්න පත්‍ර

# සමාජ විද්‍යාව

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

**03 ශ්‍රේණිය / Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II — කාලය : පැය තුන යි
sociology I, II — Time : Three Hours

### සමාජ විද්‍යාව I

උපදෙස්

» මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

» එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.

» මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.

අංක 01 සිට අංක 15 තෙක් සෑම ප්‍රශ්නයකටම ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාල අංකය පිළිතුරු පත්‍රයෙහි ලකුණු කරන්න.

01. සමාජ විද්‍යාව ශීෂය ආරම්භ වන්නේ,

(i) 18 වන සියවසේ ය.
(ii) 20 වන සියවසේ ය.
(iii) 19 වන සියවසේ ය.
(iv) 15 වන සියවසේ ය.

02. "සමාජ විද්‍යාව" යන පදය මුලින් ම යොදාගත් සමාජ විද්‍යාඥයා කවුද?

(i) හර්බට් ස්පෙන්සර්ය
(ii) ඔගස්ට් කොම්ට්
(iii) කාල් මාක්ස්
(iv) සෙන්ට් සිමොන්

03. පුනරුද සමයේ දී කිතුණු ආගමට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීමට මුල් වූ පූජකවරයෙක් වන්නේ,

(i) මැල්කම් රංජිත් පියතුමා
(ii) මාටින් ලූතර් පූජක තුමා
(iii) එංගලන්ත බිෂොප් තුමා
(iv) කාදිනල් පියතුමා

04. ඔගස්ට්ස් කොම්ට් කුමන ජාතිකයෙක්ද?

(i) රුසියානු
(ii) ජර්මානු
(iii) ප්‍රංශ
(iv) ඇමරිකානු

05. පැරණි සමාජයේ ලක්ෂණයක් වන්නේ,

(i) ජන සංඛ්‍යාව සීමිත බවයි.
(ii) සිරිතට වඩා නීතියට වැඩි තැනක් ලැබීම යි.
(iii) දියුණු තාක්ෂණයක් යොදා ගැනීම යි.
(iv) විවෘත ආර්ථිකය යි.

06. ඔබ බස් රථයක නගරයට යන විට නූතන නාගරික ජනාවාස දකියි නම් එම තත්වය සමාජ විද්‍යානුකූලව ඔබ පැහැදිලි කර ගන්නේ මින් කුමන තත්වය යටතේ ද?

(i) සමාජානුයෝජනය
(ii) සමාජ සංවිධානය
(iii) සමාජ වෙනස්වීම
(iv) අධ්‍යාපන තත්වය

07. පැරණි සමාජය යාන්ත්‍රික ස්වරූපයෙන් තිබූ බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) ඔගස්ටස් කොම්ට් ය. (ii) මැක්ස් වේබර් ය.

(iii) එමිල් ඩුර්කයිම් ය. (iv) රැල්ෆ් ලින්ටන් ය.

08. වෙනස්වීම හෙවත් විපරිණාමය බුදු දහමේ විග්‍රහ වන්නේ කුමන සංකල්ප යටතේ ද?

(i) සතර අගතිය (ii) අනිත්‍ය

(iii) අටලෝ දහම (iv) දිව්‍ය සම්පත්

09. යහපත් පාලකයන් සතු කාර්යභාර්ය විස්තර වන බෞද්ධ සූත්‍රය වන්නේ කුමක් ද?

(i) අග්ගඤ්ඤ සූත්‍රය (ii) මංගල සූත්‍රය

(iii) වාසෙට්ඨ සූත්‍රය (iv) චක්කවත්ති සීහනාද සූත්‍රය

10. නූතන යුගයට අයත් පැරණිතම පිරිවෙන වන්නේ,

(i) රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන යි. (ii) අභයගිරි පිරිවෙන යි.

(iii) කැරගල පත්මාවති පිරිවෙන යි. (iv) මහා විහාර පිරිවෙන යි.

11. මරදානේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළ යතිවරයා වන්නේ,

(i) වලානේ සිද්ධාර්ථ හිමි (ii) රත්මලානේ ධම්මාලෝක හිමි

(iii) හික්කඩුවේ සුමංගල හිමි (iv) වැලිවිට සරණංකර හිමි

12. ප්‍රාචීන භාෂෝපකාර සංගමය පිහිටවූ වර්ෂය වන්නේ,

(i) 1955 දී ය. (ii) 1960 දී ය.

(iii) 1902 දී ය. (iv) 1981 දී ය.

13. පුද්ගලයෙකුගේ සමාජානුයෝජනයට මුලින් ම දායකත්වය දක්වන සමාජ සංස්ථාව වන්නේ,

(i) අධ්‍යාපන සංස්ථාව යි. (ii) සමවයස් කණ්ඩායම් ය.

(iii) පවුල් සංස්ථාව යි. (iv) ආගමික සංස්ථාව යි.

14. ලංකාවේ ප්‍රථමයෙන් ඉදිකරවන ලද වැව වන්නේ,

(i) නුවර වැව යි. (ii) තිසා වැව යි.

(iii) පරාක්‍රම සමුද්‍රය යි. (iv) මින්නේරි වැව යි.

15. ශ්‍රී ලංකාව බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ බෞද්ධ රාජ්‍යයක් බවට පත් වූයේ මින් කවර කරුණක් හේතුකොට ගෙන ද?

(i) ඉංග්‍රීසි පාලනයෙන් මිදුනු නිසායි. (ii) විජය රජුගේ පැමිණීම නිසායි.

(iii) මෙරට පැරණි පාලකයින් නිසායි. (iv) මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීම නිසායි.

16. බුදුරදුන් ප්‍රථමවරට ලක්දිවට වැඩම කළ ස්ථානය වන්නේ,

(i) කැළණිය යි. (ii) නාගදීපය යි. (iii) මහියංගනය යි. (iv) අනුරාධපුරය යි.

17. ධර්ම විජය ප්‍රතිපත්තිය යටතේ බුදුදහම වෙනත් රටවල ප්‍රචාරය කිරීමට අනුග්‍රහය දැක්වූ රජතුමා වන්නේ,

(i) අශෝක රජු ය.
(ii) උදේනි රජු ය.
(iii) අජාසත්ත රජු ය.
(iv) බිම්බිසාර රජු ය.

18. ශ්‍රී දන්ත ධාතුව මෙරටට රැගෙන ආවේ,

(i) සංඝමිත්තා තෙරණිය යි.
(ii) හේමමාලා හා දන්ත කුමරු යි.
(iii) අරිට්ඨ කුමරු ඇතුලු පිරිස යි.
(iv) මිහිඳු මහරහතන් වහන්සේ යි.

19. මින්නේරිය වැව ඉදි කළ රජතුමා කවුද?

(i) මහසෙන් රජතුමා
(ii) වසභ රජතුමා
(iii) ධාතුසේන රජතුමා
(iv) පරාක්‍රමබාහු රජතුමා

20. ලෝකයේ පැරණිම ආගම වන්නේ,

(i) බුදු දහම ය.
(ii) හින්දු ආගම ය.
(iii) කතෝලික ආගම ය.
(iv) රෙපරමාදු ආගම ය.

21. "වෙසක් උත්සවය" ජාත්‍යන්තර නිවාඩු දිනයක් බවට පත් කිරීමට සුවිශාල මෙහෙයක් ඉටු කරන ලද්දේ,

(i) මහින්ද රාජපක්ෂ මහතා ය.
(ii) ඩී. බී. ජයතිලක මහතා ය.
(iii) ලක්ෂ්මන් කදිරගාමර් මහතා ය.
(iv) ආනන්ද කුමාරස්වාමි මහතා ය.

22. ශ්‍රී ලංකාවට මුස්ලිම්වරු පැමිණියේ,

(i) ඉන්දියාවේ සිට යි.
(ii) අරාබියේ සිට යි.
(iii) ඉරාකයේ සිට යි.
(iv) පකිස්ථානයේ සිට යි.

23. පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි වර්ෂය කුමක් ද?,

(i) ක්‍රි.ව. 1666
(ii) ක්‍රි.ව. 1796
(iii) ක්‍රි.ව. 1505
(iv) ක්‍රි.ව. 1890

24. බෞද්ධයාගේ අත්පොත ලෙස සලකන්නේ,

(i) ජාතක කථා පොත යි.
(ii) පූජාවලිය යි.
(iii) ධම්මපදය යි.
(iv) බුත්සරණ යි.

25. කිසියම් ස්ථානයක රතු කොඩියක් ප්‍රදර්ශනයවේ නම්, එයින් සංකේතවත් වන්නේ,

(i) අනතුරක් බවයි.
(ii) මරණයක් බවයි.
(iii) ගිණි ගැනීමක් බවයි.
(iv) වාහන තද බදයක් බවයි.

26. පාසල නමැති ආයතනය අයත්වන සමාජ සංස්ථාව වන්නේ,

(i) ආගමික සංස්ථාවට ය.
(ii) අධ්‍යාපන සංස්ථාවට ය.
(iii) පවුල් සංස්ථාවට ය.
(iv) ආර්ථික සංස්ථාවට ය.

27. සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් නැගෙනහිර දිශාවෙන් .......................... සංකේතවත් වේ.

(i) ගුරුවරු (ii) අඹුදරුවන්

(iii) මව්පියන් (iv) මිතුරන්

28. සතර සංග්‍රහ වස්තුවලට අයත් නොවේ.

(i) අර්ථ චර්යාව (ii) දානය

(iii) ප්‍රිය වචනය (iv) සීලය

29. මහා මංගල සූත්‍රයේ මංගල කරුණු ...................................කි.

(i) තිස් අට (ii) විසි පහ

(iii) තිස් දෙක (iv) සිහ

30. පරාභව සූත්‍රයේ දැක්වෙන්නේ පුද්ගලයාගේ ................ කරුණුයි.

(i) පිරිහීමේ (ii) දියුණුවේ

(iii) දක්ෂවීමේ (iv) කීතිගරුක වීමේ

31. චාරිත්‍රයකට උදාහරණයක් වන්නේ,

(i) දෙමාපියන්ට සැලකීමයි (ii) වැඩිහිටි අවවාද පිළිගැනීමයි

(iii) සත්ව හිංසනයෙන් වැළකීමයි (iv) සෑම දෙනාටම මෛත්‍රිය වැඩීමයි

32. සමාජයක සමාජ පාලනය ක්‍රියාත්මක විය යුත්තේ .............................. උදෙසාය.

(i) වර්ධනය (ii) පරිහානිය

(iii) ගැටළු (iv) සතුට

33. සමාජ පාලන බලවේගයක් ලෙස නූතන සමාජවල බහුලව ක්‍රියාත්මක වන සාධකය වන්නේ,

(i) නීතිරීති (ii) සිරිත්විරිත්

(iii) දඬුවම් (iv) ඒකාධිපති පාලනය

34. පන්සල පැරණි අධ්‍යාපනයේ ........................................ කේන්ද්‍රස්ථානය විය.

(i) ද්විතීයික (ii) මූලික

(iii) සාමාන්‍යය (iv) තෙවැනි

35. සප්ත අපරිහානීය ධර්ම පිළිපදින ලද්දේ.

(i) බිම්බිසාර රජතුමාය. (ii) කොසොල් රජ්ජය.

(iii) අශෝක රජතුමාය. (iv) ලිච්ඡවී රජවරුන්ය.

36. මහා විහාරික භික්ෂු සමාජය, රාජ්‍ය පාලනය සඳහා රජුන්ට අනුශාසනා කළේ,

(i) දස පුන්‍ය ක්‍රියා යි. (ii) දසරාජ ධර්මය යි.

(iii) ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියා යි. (iv) දස පාරමිතා යි.

37. යහපත් දිවිපැවැත්ම අර්ථවත් කරන ආර්ය අෂ්ටාංගික මාර්ග අංගය ................................ වේ.

(i) සම්මා ආජීව
(ii) සම්මා සමාධි
(iii) සම්මා සතිය
(iv) සම්මා සංකප්ප

38. සමාජ විද්‍යාව පිළිබඳ දැනුම ඇති පුද්ගලයා සැම විටම සියලුම ජාතීන් සමඟ ................................ විසිය යුතුය.

(i) සතුටින්
(ii) සමඟියෙන්
(iii) ඉවසීමෙන්
(iv) වගකීමෙන්

39. භික්ෂූන් වහන්සේ සැම විටම සමාජයේ ...................................... විය යුතුය.

(i) පසු ගමන්කරුවා
(ii) විචාරකයා
(iii) විමසිලිමත් වන්නා
(iv) පෙර ගමන්කරුවා

40. අප සැම විට අන්‍ය ජාතීන්ට ...................................... විය යුතුය.

(i) අවනත
(ii) විචාරශීලී
(iii) විරුද්ධ
(iv) ගෞරව සම්ප්‍රයුක්ත

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය 2018

## Primary Piriven Mid Year Tearm Test - 2018

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**03 ශ්‍රේණිය/Grade 03**

| | |
|---|---|
| සමාජ විද්‍යාව I, II | කාලය : පැය තුන යි |
| sociology I, II | Time : Three Hours |

සමාජ විද්‍යාව II

සැලකිය යුතුයි

» පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
» පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
» මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.

01. i. සමාජ විද්‍යාව බිහිවීම සඳහා බලපෑ ඓතිහාසික හේතු දෙකක් දක්වන්න.

ii. සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න.

iii. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප දෙකක් නම් කරන්න.

iv. සමාජ පාලනය සිදුවන ප්‍රධාන ක්‍රම දෙක මොනවාද?

v. සමාජ පරිණාමය පිළිබඳ තොරතුරු සඳහන් බෞද්ධ සූත්‍ර දෙකක නම් ලියන්න.

vi. කෝට්ටේ යුගයේ පැවති පිරිවෙන් ආයතන දෙකක් දක්වන්න.

vii. හින්දු ආගමිකයන්ගේ ප්‍රධාන උත්සව දෙකක් දක්වන්න.

viii. ඉස්ලාම් ආගමේ ප්‍රධාන ඉගැන්වීම් දෙකක් සඳහන් කරන්න.

ix. සමාජයේ ධර්මතාවලින් පුද්ගලයා ඈත්වීම අනෝමිය තත්වය ලෙස හැඳින්වූ සමාජ විද්‍යාඥයා කවුද?

x. භික්ෂු සමාජය විසින් ගිහි සමාජය උදෙසා ඉටු කළ යුතු සේවාවන් දෙකක් නම් කරන්න.

(ලකුණු 2X10 = 20)

02. i. නූතන සමාජ ලක්ෂණ දෙකක් නම් කරන්න.

(ලකුණු 2)

ii. සමාජ පරිණාමය පිළිබඳව ඔගස්ටස් කොම්ට් පෙන්වා දුන් අවධි තුන මොනවාද?

(ලකුණු 3)

iii. සමාජ විද්‍යාව ඉගෙන ගැනීමෙන් භික්ෂූන් වහන්සේට අත්වන ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පහදන්න.

(ලකුණු 5)

03. i. වර්තමානයේ ස්ථාපිත පිරිවෙන් වර්ග තුන නම් කරන්න.

(ලකුණු 2)

ii. පිරිවෙන් අධ්‍යාපන ආයතන මගින් සමාජයට සිදු වන සේවාවන් තුනක් ලියන්න.

(ලකුණු 3)

iii. විහාරස්ථානය ඇසුරින් ගම තුළ සිදුවන වෙනස්වීම නිදසුන් දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 5)

04. i. සමාජානුයෝජනය යන්න කෙටියෙන් පහදන්න. (ලකුණු 2)

ii. මානව පවුල දරුවකු සමාජානුයෝජනය කිරීම සඳහා සිදු කරන ක්‍රියාවන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. අලුත පැවිදි වූ කුඩා සාමණේර නමක් විහාරස්ථානය තුළින් සමාජානුයෝජනය වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 5)

05. i. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන වර්ග තුන නම් කරන්න. (ලකුණු 2)

ii. 'ජන චර්යා' හා ශණචර්යා අතර වෙනස පහදන්න. (ලකුණු 3)

iii. සිරිත් විරිත් මගින් සමාජ පාලනය සිදුවන අයුරු නිදසුන් තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 5)

06. i. ඕනෑම සමාජයක පවතින පොදු සාරධර්ම දෙකක් ලියන්න. (ලකුණු 2)

ii. ධර්මතාවලට නොමැති ලක්ෂණ හතරක් නීතියට ඇත. එයින් දෙකක් ලියන්න. (ලකුණු 3)

iii. නීතිය ක්‍රියාත්මක කරන ආයතන දෙකක් නම් කර ඉන් එක් ආයතනයකින් සිදුවන සමාජ සේවාව විස්තර කරන්න. (ලකුණු 5)

07. i. සංස්කෘතිය පිළිබඳ අදහස් දක්වා ඇති සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 2)

ii. සංස්කෘතියක දක්නට ලැබෙන අංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. බුදු දහමින් දායාද වූ ගති ලක්ෂණ මත සිංහල සංස්කෘතිය බෞද්ධ සංස්කෘතිය බවට පත් වූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 5)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 03 ශ්‍රේණිය /Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II කාලය : පැය තුන යි
sociology I, II Time : Three Hours

**සමාජ විද්‍යාව I**

උපදෙස්

» **මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ.**
» **එය එක් එක් ප්‍රශ්නයට වරණ හතර බැගින් දී ඇත. නමුත් නිවැරදි පිළිතුර වන්නේ එක් වරණයක් පමණි. එම නිවැරදි වරණය තෝරා දී ඇති උපදෙස් අනුව පිළිතුරු ලකුණු කරන්න.**
» **මෙම කොටසට ලකුණු 40 ක් හිමි වේ.**

01. සමාජ විද්‍යාව යන පදය මුල් වරට යොදා ගනු ලැබූ වර්ෂය කුමක් ද?

(i) 1836 (ii) 1843
(iii) 1839 (iv) 1853

02. සමාජ විද්‍යාව බිහි වූයේ කිනම් සමාජයක් පදනම් කරගෙන ද?

(i) රුසියාව පදනම් කරගෙන (ii) ජර්මනිය පදනම් කරගෙන
(iii) එංගලන්තය පදනම් කරගෙන (iv) ප්‍රංශය පදනම් කරගෙන

03. සමාජ විද්‍යාවේ පියා ලෙස සැලකෙන්නේ,

(i) ඔගස්ට් කොම්ට් ය. (ii) එමිල් ඩූර්කයිම් ය.
(iii) මැක්ස් වේබර් ය. (iv) හර්බට් ඩිපෙන්සර් ය.

04. සමාජ අධ්‍යයනය කිරීමට විද්‍යාත්මක ක්‍රමවේදයක් හඳුන්වා දුන් ප්‍රංශ ජාතික සමාජ විද්‍යාඥයා කවුද?

(i) මැක්ස් වේබර් (ii) සිග්මන් ෆ්‍රොයිඩ්
(iii) හර්බට් ස්පෙන්සර් (iv) එමිර් ඩූර්කයිම්

05. කිතුණු ආගම සඳහා නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දුන්නේ,

(i) ඔගස්ට් කොම්ට් සහ හර්බට් ස්පෙන්සර් ය. (ii) මාර්ටින් ලූතර් සහ ජෝන් කැල්වින් ය.
(iii) කාල් මාක්ස් සහ මැක්ස් වේබර් ය. (iv) කාල් මාක්ස් හා එමිල් ඩූර්කයිම් ය.

06. සමාජ ක්‍රියාකාරිත්වය ඓන්ද්‍රීය (ඉන්ද්‍රීය) පද්ධතියට උපමා කළේ,

(i) මැක්ස් වේබර් ය. (ii) කාල් මාක්ස් ය.
(iii) ඔගස්ට් කොම්ට් ය. (iv) හර්බට් ස්පෙන්සර් ය.

07. සාම්ප්‍රදායික සමාජයක සිට තර්කානුකූලව කටයුතු කරන නූතන සමාජය දක්වා සමාජය වෙනස් වූ බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

(i) රැල්ෆ් ලින්ටන් (ii) මැක්ස් වෙබර්

(iii) බී.මැලිනොවුස්කි (iv) කාල් මාක්ස්

08. ධනවාදී අර්ථක්‍රමයක් තුළ ධනපතියා විසින් නිර්ධනයන් පීඩනයට ලක් කරන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,

(i) එමිල් ඩුර්කයිම් ය. (ii) ඔගස්ට් කොම්ට් ය.

(iii) කාල් මාක්ස් ය. (iv) හර්බට් ස්පෙන්සර් ය.

09. 'සමාජ භෞතික විද්‍යාව' ලෙස මුල් සමයේදී හඳුන්වා ඇත්තේ පහත කුමන විෂයක් ද?

(i) භෞතික විද්‍යාව (ii) ආර්ථික විද්‍යාව

(iii) වස්තු විද්‍යාව (iv) සමාජ විද්‍යාව

10. පුද්ගල සමාජානුයෝජනය සිදු වන මුල් ම සමාජ ඒකකය කුමක් ද?

(i) පාසල (ii) පවුල

(iii) පන්සල (iv) විශ්වවිද්‍යාලය

11. යුතුකම් හා වගකීම් ඉටු කිරීම පිළිබඳව උගන්වන බෞද්ධ සූත්‍රය කුමක් ද?

(i) මහාමංගල සූත්‍රය (ii) සිඟාලෝවාද සූත්‍රය

(iii) පරාභව සූත්‍රය (iv) කාලාම සූත්‍රය

12. සාමණේර භික්ෂූන් වහන්සේ නමක් ආරක්ෂා කළ යුතු සීලය වනුයේ,

(i) ආජීව අෂ්ටමක සීලය යි. (ii) දස ශීලය යි.

(iii) පංච සීලය යි. (iv) සතර සංවර සීලය යි.

13. පුරාණයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ පාලන ආයතනය ලෙස ක්‍රියාත්මක වූයේ,

(i) පාසල යි. (ii) පන්සල යි.

(iii) අධිකරණය යි. (iv) පොලීසිය යි.

14. භික්ෂූන් වහන්සේගේ පාලනය සඳහා බුදු රජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ විනය නීති ඇතුළත් වනුයේ,

(i) දස සීලයෝ ය. (ii) පංච සීලයේ ය.

(iii) සේඛියාවල ය. (iv) ආජීව අෂ්ටමක සීලයේ ය.

15. නීතිය තුළ දක්නට ඇති ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

(i) රජය මගින් ප්‍රකාශයට පත් කිරීම (ii) වරදකරුවන්ට දඬුවම් නියම කිරීම

(iii) ලේඛනගතව පැවතීම (iv) සාමූහික පිළිගැනීමක් නොතිබීම

16. භික්ෂු සමාජය විසින් ගිහි සමාජය උදෙසා ඉටු කළ යුතු සේවාවක් <u>නොවන්නේ</u> මින් කුමක් ද?

(i) සුචරිතයේ යෙදවීම
(ii) සුගතිගාමී මාර්ගය කියාදීම
(iii) සිව්පසය ලබාදීම
(iv) පව්කම්වලින් වැළැක්වීම

17. සමාජ සම්බන්ධතා තහවුරු වන කරුණු 38 ක් ඇතුළත් බෞද්ධ සූත්‍රය කුමක් ද?

(i) මහාමංගල සූත්‍රය
(ii) ව්‍යග්ගපජ්ජ සූත්‍රය
(iii) පරාභව සූත්‍රය
(iv) කාලාම සූත්‍රය

18. අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමෙන්,

(i) අසහනය ඇති වේ.
(ii) සැහැල්ලුභාවයක් ඇති වේ.
(iii) අතෘප්තිය ඇති වේ.
(iv) අහංකාරයක් ඇති වේ.

19. ලිච්ඡවී රජ දරුවන් රාජ්‍ය පාලනයේදී අනුගමනය කළ සමගිව රැස්වීම, සමගිව කටයුතු කිරීම යන කරුණු ඇතුළත් වන්නේ,

(i) දසරාජ ධර්මවලට ය.
(ii) සතර සංග්‍රහ වස්තුවලට ය.
(iii) සප්ත අපරිහානී ධර්මවලට ය.
(iv) දස සක්විතිවත්වලට ය.

20. ශ්‍රී ලංකාවේ පාලකයා අනිවාර්යෙන් ම බෞද්ධයෙකු විය යුතුය යන සම්මතය ඇති වූයේ,

(i) මහින්දාගමනයෙන් පසුව ය.
(ii) විජයාගමනයෙන් පසුව ය.
(iii) දුමින්දාගමනයෙන් පසුව ය.
(iv) ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ වැඩමවීමෙන් පසුව ය.

21. පරිණාමය යන සංකල්පය බුදු දහමේ ඉගැන්වීම්වලට අනුව දැක්වෙන්නේ,

(i) වෙනස්වීම ලෙස ය.
(ii) සංවර්ධනය ලෙස ය.
(iii) අනිත්‍යතාව ලෙස ය.
(iv) ගතිකත්වය ලෙස ය.

22. 'ආගමික ජීවිතයේ මූලික හරය' යන කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් ද?

(i) මාර්ටින් ලූතර්
(ii) එමිල් ඩුර්කයිම්
(iii) මැක්ස් වේබර්
(iv) හර්බට් ස්පෙන්සර්

23. යහපත් සමාජයක් නිර්මාණයවීම සඳහා පාලකයා සතු කාර්යභාරය ඇතුළත් සූත්‍රය කුමක් ද?

(i) චක්කවත්ති සීහනාද සූත්‍රය
(ii) පරාභව සූත්‍රය
(iii) සිඟාලෝවාද සූත්‍රය
(iv) ව්‍යග්ගපජ්ජ සූත්‍රය

24. සමාජයේ ආරම්භය සහ විකාශනය පිළිබඳ තොරතුරු ඇතුළත් බෞද්ධ සූත්‍රය කුමක් ද?

(i) චුල්ලහත්ථි පදෝපම සූත්‍රය (ii) වසල සූත්‍රය

(iii) අග්ගඤ්ඤ සූත්‍රය (iv) සිඟාලෝවාද සූත්‍රය

25. ලක්දිව පළමු පිරිවෙණ වන්නේ කුමක් ද?

(i) කාලප්‍රසාද පිරිවෙණ

(ii) පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ

(iii) කෑරගල පද්මාවතී පිරිවෙණ

(iv) දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙණ

26. පාහියන් වාර්තාව අනුව අභයගිරි විහාරයේ අධ්‍යාපනය ලැබූ භික්ෂූන් වහන්සේලා ප්‍රමාණය කොපමණ ද?

(i) 2000 (ii) 3000 (iii) 2500 (iv) 5000

27. කෝට්ටේ යුගයේ දී පිරිවෙන් අධ්‍යාපනය බිඳ වැටීමට බලපෑ ප්‍රධාන හේතුව කුමක් ද?

(i) සිංහල රජවරුන්ගේ අසමගිය

(ii) බටහිර ජාතීන්ගේ ආක්‍රමණ

(iii) පාසල් ආරම්භවීම

(iv) පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ උනන්දුව අඩුවීම

28. ගිරා සන්දේශය මගින් වර්ණනා කෙරෙනුයේ මින් කුමන පිරිවෙණ ගැන ද?

(i) කෑරගල පද්මාවතී පිරිවෙණ

(ii) වීදාගම සිරිඝනානන්ද පිරිවෙණ

(iii) දෙවිනුවර ඉරුගල්කුලතිලක පිරිවෙණ

(iv) තොටගමුවේ විජයබා පිරිවෙණ

29. ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආරම්භ කරන ලද්දේ,

(i) 1964 දී ය. (ii) 1906 දී ය.

(iii) 1902 දී ය. (iv) 1909 දී ය.

30. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා කවුද?

(i) හර්බට් ස්පෙන්සර්ය (ii) රැල්ෆ් ලින්ටන්

(iii) ඊ.බී.ටයිලර් (iv) ඔගස්ටස් කොම්ට්

31. හින්දු භක්තිකයන්ගේ උත්සවයක් වනුයේ,

(i) දීපාවලී උත්සවය යි. (ii) වෙසක් උත්සවය යි.

(iii) රාමසාන් උත්සවය යි. (iv) නත්තල් උත්සවය යි.

32. වෙසක් පොහොය දිනය ජාත්‍යයන්තර නිවාඩු දිනයක් බවට පත් කිරීමට විශාල කාර්යයක් සිදු කරන ලද්දේ,

(i) මර්සලින් ජයකොඩි පියතුමා ය.
(ii) ලක්ෂ්මන් කදිරගාමර් මහතා ය.
(iii) ආානන්ද කුමරස්වාමි මහතා ය.
(iv) ආනන්ද සමරකෝන් මහතා ය.

33. ඉස්ලාම් ආගමට අනුව අල්ලාහ් දෙවියන් විශ්වාස කිරීම සඳහා දිනකට පස් වතාවක් යාඥා කළ යුතුය. එය හඳුන්වන්නේ,

(i) සලාකය ලෙස යි.
(ii) රාමසාන් උපවාසය ලෙස යි.
(iii) සකාකය ලෙස යි.
(iv) හජ්ජි වන්දනාව ලෙස යි.

34. ක්‍රිස්තියානි ආගම ශ්‍රී ලංකාවට ගෙන එන ලද්දේ,

(i) පෘතුගීසි ජාතිකයන් ය.
(ii) ඉංග්‍රීසි ජාතිකයන් ය.
(iii) ලන්දේසි ජාතිකයන් ය.
(iv) ප්‍රංශ ජාතිකයන් ය.

35. සතර සංග්‍රහ වස්තුවට අයත් නොවන්නේ පහත කුමන කරුණ ද?

(i) දානය
(ii) ප්‍රිය වචනය
(iii) සමානාත්මතාව
(iv) අක්‍රෝධය

36. විධිමත් සමාජ පාලනය සිදු විය යුත්තේ,

(i) ධර්මතා මත ය.
(ii) නීතිය මත ය.
(iii) දණ්ඩනය මත ය.
(iv) ස්වාභාවික තත්ත්වය මත ය.

37. මහාබෝධි සංගමය ආරම්භ කිරීමට මූලික වූයේ කවුද?

(i) රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි
(ii) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
(iii) අනාගාරික ධර්මපාලතුමා
(iv) හෙන්ද්‍රි ස්ටීල් ඕල්කට්තුමා

38. බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව බෞද්ධ පිරිස නිරතුරුව අන්‍ය ආගමික පිරිස සමග ඇති කර ගත යුත්තේ,

(i) වෛරී සහගත භාවය යි.
(ii) අසමගිය යි.
(iii) සමගියෙන් ජීවත් වීම යි.
(iv) අවිශ්වාසය යි.

39. පොදු සාරධර්ම පද්ධතියට අයත් <u>නොවන්නේ</u> මින් කුමන ලක්ෂණය ද?

(i) සමානාත්මතාව
(ii) නිදහස
(iii) ප්‍රජාතන්ත්‍රවාදී බව
(iv) ජාතිවාදී බව

40. 'සිය දිවි නසා ගැනීම' නැමැති කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) සම්නර්
(ii) එමිල් ඩුර්කයිම්
(iii) මාර්ටින් ලූතර්
(iv) ඔගස්ට් කොම්ට්

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Term Test - 2019

### 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology I, II

**සමාජ විද්‍යාව II**

**සැලකිය යුතුයි**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- **මෙම කොටසට ලකුණු 60 ක් හිමි වේ.**

01. I. සමාජය දෙවියන්ගේ නිර්මාණයක් නොව මිනිසාගේ ම නිර්මාණයක් බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

II. සමාජ ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.

III. සමාජය අධ්‍යයනය සඳහා ක්‍රමවේද දෙකක් නම් කරන්න.

IV. නූතන සමාජයක ලක්ෂණ දෙකක් ලියන්න.

V. නියමකන්දේ පිරිවෙණ ආරම්භ කළ භික්ෂූන් වහන්සේ කවුද?

VI. ප්‍රාථමික සමාජ අවධියේ දී මිනිසා ඇඳහිලි නිර්මාණය කිරීමට මූලික වූ හේතු දෙකක් ලියන්න.

VII. සංඝමිත්තා තෙරණිය සමඟ හෙළදිවට පැමිණි ශිල්ප කුල දෙකක් සඳහන් කරන්න.

VIII. සමාජයක් නිර්මාණය වීමට පැවතිය යුතු ලක්ෂණ දෙකක් ලියන්න.

IX. සමාජය තුළ ක්‍රියාත්මක කිරීමේ බලවන්තභාවය අනුව චාරිත්‍ර, වාරිත්‍ර බෙදෙන කොටස් දෙක නම් කරන්න.

X. බෞද්ධ සමාජයේ දක්නට ලැබෙන ස්ථර හතර නම් කරන්න.

( ලකුණු 2 x 10 = 20 )

02. I. සමාජ විද්‍යාව බිහිවීමට බලපෑ ඓතිහාසික සාධක දෙකක් නම් කරන්න.

II. සමාජ විද්‍යාව සංවර්ධනයට දායකත්වය සැපයූ සමාජ විද්‍යාඥයන් තිදෙනෙක් නම් කරන්න.

III. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

03. I. සමාජ පරිණාමය යනු කුමක්ද?

II. සමාජ පරිණාමය සඳහා බලපාන සාධක තුනක් ලියන්න.

III. බුදු දහමට අනුව සමාජ පරිණාමය යන්න පැහැදිලි කරන්න. ( ලකුණු 2 + 3 + 5 = 10 )

04. I. ශ්‍රී ලංකාවේ පිරිවෙන් වර්ග කීය ද? ඒවා මොනවාද?

II. කෝට්ටේ යුගයේ ආරම්භ වූ පිරිවෙන් තුනක් නම් කරන්න.

III. 'පිරිවෙන් අධ්‍යාපනය තුළින් පරිපූර්ණ පුද්ගලයෙකු බිහි කළ හැකි ය.' ඔබේ අදහස් දක්වන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

05. I. සංස්කෘතිය පිළිබඳ අදහස් දැක්වූ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

II. සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න.

III. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාව තුළ සංස්කෘතිකමය වෙනසක් සිදු වූ ආකාරය පැහැදිලි කරන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

06. I. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග දෙකක් නම් කරන්න.

II. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ආගම් තුනක් නම් කරන්න.

III. ආගම් අතර අන්‍යෝන්‍ය බැඳීම ඇති කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග පහක් ලියන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

07. I. චාරිත්‍ර හා වාරිත්‍ර යන්නෙහි සරල තේරුම කුමක් ද?

II. නීතිය ක්‍රියාත්මක කිරීමේ දී දක්නට ලැබෙන ලක්ෂණ තුනක් නම් කරන්න.

III. යුතුකම් හා වගකීම් ඉටු කිරීම යහපත් සමාජ පැවැත්මට හේතු වේ. සිඟාලෝවාද සූත්‍රය ඇසුරින් පහදන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

08. I. සමාජානුයෝජනය යනු කුමක් ද?

II. විහාරස්ථානයක් ආශ්‍රයෙන් සිදුකරන සමාජයීය කාර්යයන් තුනක් ලියා දක්වන්න.

III. යහපත් දිවිපෙවතකට පංචශීලයෙහි ඇති වැදගත්කම පහදන්න.

( ලකුණු 2 + 3 + 5 = 10 )

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**NEW**

| 08 | S | I, II |
|---|---|---|

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

පැ තුනයි

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
**Mid Year Term Test - 2022**

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

**03 ශ්‍රේණිය**

**(08) සමාජ විද්‍යාව - I, II**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**සමාජ විද්‍යාව 1 පත්‍රය**

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **01** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

(ලකුණු 01×40=40 යි)

1. "සමාජ විද්‍යාව" නම් විෂය ලොවට හඳුන්වා දුන් දාර්ශනිකයා කවුද?

   (1) ඔගස්ට් කොම්ට් (2) හර්බට් ස්පෙන්සර් (3) එමිල් ඩුර්ක්හයිම් (4) මැක්ස් වෙබර්

2. සමාජ විද්‍යාව ආරම්භ වූයේ, ...................... සමාජ අධ්‍යනය කිරීමේ විෂයයක් ලෙස ය.

   (1) ග්‍රාමීය (2) නාගරික (3) ගෝත්‍රික (4) ප්‍රාථමික

3. සමාජ විද්‍යාවේ බිහිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන ඓතිහාසික සාධක **තුන** නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

   (1) ආගමික ප්‍රතිසංස්කරණ , බටහිරකරණය, කාර්මික විප්ලවය

   (2) කාර්මික විප්ලවය, දේශපාලන ප්‍රතිසංස්කරණ, නාගරීකරණය

   (3) ආගමික ප්‍රතිසංස්කරණ , කාර්මික විප්ලවය, දේශපාලන ප්‍රතිසංස්කරණ

   (4) දේශපාලන ප්‍රතිසංස්කරණ, නවීකරණය, නාගරීකරණය

4. ජීවියාගේ පැවැත්ම සඳහා ඉන්ද්‍රීය පද්ධතීන්ගේ ක්‍රියාකාරීත්වය වැදගත් වන්නා සේ ම සමාජයේ පැවැත්ම සඳහා සමාජ සංස්ථාවන්ගේ සාමූහික ක්‍රියාකාරීත්වය අත්‍යවශ්‍ය බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

   (1) ඔගස්ට් කොම්ට් (2) කාල් මාක්ස්

   (3) මැක්ස් වෙබර් (4) හර්බට් ස්පෙන්සර්

5. සමාජ අවශ්‍යතා ඉටුකරගැනීමේ අරමුණ ඇතිව ඒවාට ආවේණික සිරිත් විරිත් හා සාරධර්ම පද්ධතියක් මත සංවිධානය වූ විධිමත් සමාජ ඒකකය වන්නේ,

   (1) සමාජ සමූහය යි. (2) සමාජ සංස්ථා යි

   (3) සංස්කෘතිය යි. (4) සමාජ ස්ථාරායනය යි.

[2 වැනි පිටුව බලන්න.

6. සාධිත තත්ත්වය සඳහා නිදසුන් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
   (1) ගුරුවරයා, ස්ත්‍රිය, වෛද්‍යවරයා (2) ජාතිය, වඩු කාර්මිකයා, ගුරුවරයා
   (3) ගුරුවරයා, වඩු කාර්මිකයා, වෛද්‍යවරයා (4) ගායකයා, කුලය, ගුරුවරයා

- පහත සඳහන් සමාජ ලක්ෂණ අධ්‍යයනය කර 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A - ජන සංඛ්‍යාව අඩුයි.

  B - විවිධ ජන කණ්ඩායම්වලින් සමාජය සකස් වේ.

  C - සිරිත් විරිත්වලට වඩා නීතියට වැඩි තැනක් හිමි වේ.

  D - සරල තාක්ෂණයක් යොදා ගනී.

  E - පෞද්ගලිකත්වයට වැඩි තැනක් හිමි වේ.

  F - ශ්‍රම විභජනය අවම මට්ටමක පවතියි.

7. ඉහත සමාජ ලක්ෂණ අතුරින් ප්‍රාථමික සමාජවල බහුලව දක්නට ලැබෙන ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) A, B සහ C (2) A, B සහ E (3) A, D සහ F (4) A, E සහ F

8. ඉහත සමාජ ලක්ෂණ අතුරින් නූතන සමාජවල දක්නට ලැබෙන ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) A, C සහ E (2) B, C සහ E (3) B, C සහ F (4) D, E සහ F

9. වෙනස්වීම පිළිබඳ බුදුදහමේ ඉගැන්වෙන උප්පාද, ඨිති, භංග යන සංකල්පයේ සරල අර්ථය අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
   (1) ඇතිවීම, පැවතීම හා නැතිවීම (2) නැතිවීම, පැවතීම හා ඇතිවීම
   (3) පැවතීම, නැතිවීම හා ඇතිවීම (4) ඇතිවීම, නැතිවීම හා පැවතීම

10. සමාජයේ ආරම්භය හා විකාශනය සම්බන්ධ කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍රය මින් කුමක්ද?
    (1) මංගල සූත්‍රය (2) අග්ගඤ්ඤ සූත්‍රය (3) වසල සූත්‍රය (4) පරාභව සූත්‍රය

11. ශ්‍රී ලාංකේය ජන සමාජය ගුණාත්මක පරිවර්තනයකට මග පෑදූ මහින්දාගමනය සිදු වූයේ,
    (1) දුටුගැමුණු රාජ සමයේ ය. (2) පණ්ඩුකාභය රාජ සමයේ ය.
    (3) දෙවනපෑතිස් රාජ සමයේ ය. (4) වසභ රාජ සමයේ ය.

12. ප්‍රාචීන භාෂෝපකාර සමාගම ආරම්භ වූ වර්ෂය කුමක්ද?
    (1) 1848 (2) 1896 (3) 1900 (4) 1902

13. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මා හිමියන් විසින් ආරම්භ කළ පිරිවෙන මින් කුමක්ද?
    (1) නියමකන්දේ පිරිවෙන (2) මාලිගාකන්දේ පිරිවෙන
    (3) රත්මලානේ පිරිවෙන (4) පැපිලියානේ පිරිවෙන

14. මහා බෝධි සමාගම ආරම්භ කරන ලද්දේ,
    (1) ඕල්කට්තුමා විසිනි. (2) අනගාරික ධර්මපාලතුමා විසිනි.
    (3) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසිනි. (4) කැරගල වනරතන හිමියන් විසිනි.

[3 වැනි පිටුව බලන්න.

- පහත දැක්වෙන සමාජ පරිණාමය පිළිබඳ අදහස් හොඳින් කියවා තේරුම් ගෙන 15 සිට 18 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දේවවාදී සංකල්පයෙන් ඉවත්ව සමාජය දෙස යථාර්ථවාදීව බැලීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජ පරිණාමය සිදු විය.

B - පන්ති ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස සමාජ පරිණාමය සිදු විය.

C - අතාර්කික භාවයෙන් යුතු සමාජ තාර්කානුකූල සමාජ දක්වා වෙනස්වීම සමාජ පරිණාමයයි.

D - වැඩ බෙදාගෙන කටයුතු කිරීම හෙවත් ශ්‍රම විභජනයට යොමුවීම සමාජ පරිණාමයට හේතු වේ.

15. ඉහත අදහස් අතුරින් ඔගස්ට් කොම්ටේගේ මතවාදය නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A (2) B (3) C (4) D

16. ඉහත අදහස් අතුරින් එමිල් ඩුර්ක්හයිම් විසින් ඉදිරිපත් කළ අදහස දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A (2) B (3) C (4) D

17. මැක්ස් වේබර් දැක්වූ සමාජ පරිණාමය පිළිබඳ අදහස දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A (2) B (3) C (4) D

18. කාල් මාක්ස් පෙන්වා දුන් සමාජ පරිණාමය පිළිබඳ අදහස දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A (2) B (3) C (4) D

19. සංස්කෘතිය පිළිබඳ ඊ.බී ටයිලර් ඉදිරිපත් කළ නිර්වචනය තුළ ඇතුළත් අංග ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දැනුම, විශ්වාසය, කලාව (2) දැනුම, ස්වාභාවික කඳු, නීතිය

(3) සාරධර්ම, කලාව, ස්වාභාවික වනාන්තර (4) වන සත්ත්වයින්, විශ්වාසය, නීතිය

20. දෙමාපියන් පිළිගත් ධර්මතාවන් දරුවන් විසින් අභ්‍යන්තරීකරණය කර ගෙන සුපහන් සිතක් තනාගැනීමේ ක්‍රියාවලිය,

(1) සමාජ ක්‍රියාව ලෙස හැඳින්වේ. (2) සමාජානුයෝජනය ලෙස හැඳින්වේ.

(3) සමාජ පාලනය ලෙස හැඳින්වේ. (4) අනුනරණය ලෙස හැඳින්වේ.

21. දළදා පෙරහැර හා කඨින පූජෝත්සවය යන බෞද්ධ සංස්කෘතික උත්සව මෙරට ආරම්භ වූයේ මින් කුමන රජතුමාගේ කාලයේද?

(1) දෙවනපෑතිස් රජු (2) මහසෙන් රජු (3) ගජබා රජු (4) මහානාග රජු

22. හින්දු භක්තිකයින්ගේ වන්දනාවට ලක්වන දෙවිවරුන්ගේ නම් පමණක් දැක්වෙන පිළිතුරු මින් කුමක්ද?

(1) ශිව, ගනේෂ්, මුරුගා (2) ශිව, අල්ලා, මුරුගා

(3) ශිව, ගනේෂ්, යෙහෝවා (4) සියුස්, ගනේෂ්, මුරුගා

23. ඉස්ලාම් ආගමට අනුව ධනය ඇති අය දුප්පත් අයට උදව් උපකාර කිරීම හඳුන්වන්නේ,

(1) සලාකය ලෙසයි. (2) සකාතය ලෙසයි.

(3) උපවාසය ලෙසයි. (4) හජ්ජි වන්දනාව ලෙසයි.

24. රෙපරමාදු නිකාය ශ්‍රී ලංකා සමාජය තුළ ව්‍යාප්ත කරන ලද්දේ,

(1) පෘතුගීසි ජාතිකයින් ය. (2) ඉංග්‍රීසි ජාතිකයින් ය.

(3) ලන්දේසි ජාතිකයින් ය. (4) ප්‍රංශ ජාතිකයින් ය.

25. සමාජය යනු,

(1) අන්‍යෝන්‍ය සම්බන්ධතා මත ඒකරාශී වූ පුද්ගල එකතුවකි.

(2) පුද්ගලයින් රාශියක එකතුවකි.

(3) මිනිසුන්ගේ එකතුවකි.

(4) පුද්ගලයින් දෙදෙනෙකුට වැඩි පිරිසකි.

- පහත සඳහන් ප්‍රකාශ හොඳින් අධ්‍යයනය කර 26,27,28 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – අනෙකුත් සමාජවලින් වෙන්ව හුදකලාව ජීවත් වේ.
B – කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වේ.
C – විද්‍යාත්මක දැනුම මත සාමාජ සිදුවීම් තේරුම් ගනියි.
D – දඩයම්කිරීම ප්‍රධාන ජීවනෝපාය වේ.
E – සමාජ ක්‍රියාකාරකම් සඳහා දියුණු තාක්ෂණයක් යොදා ගනියි.
F - ආගමික ඉගැන්වීම්වලට අනුව සමාජ සිදුවීම් විග්‍රහ කරයි.

26. ගෝත්‍රික සමාජවල පමණක් දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) A, B (2) A, D (3) B, E (4) D, E

27. ගැමි සමාජවලට සුවිශේෂ ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A, C (2) B, D (3) B, F (4) C, F

28. කාර්මික සමාජවලට සුවිශේෂ ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) A, D (2) B, C (3) C, D (4) C, E

29. සදිසා නමස්කාරය ඔස්සේ සමාජ සම්බන්ධතා මනාව ඉටුකර ගැනීම සඳහා ක්‍රියා කළ හැකි ආකාරය පෙන්වා දුන් බෞද්ධ සූත්‍රය කුමක්ද?

(1) සිගාලෝවාද සූත්‍රය (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (3) කාලාම සූත්‍රය (4) පරාභව සූත්‍රය

30. සමාජ පාලනයක අවශ්‍යතාව සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) සාමාජිකයන් අතර අන්තර් සම්බන්ධතාව වර්ධනය කර ගැනීම සඳහා සමාජ පාලනය අවශ්‍ය වේ.

(2) සමාජය තුළ විසංවිධානකාරී තත්ත්වයක් ගොඩනැගීම වැළැක්වීමටත් ගොඩනැගුණු තත්ත්වයන් සමනය කර ගැනීමටත් සමාජ පාලනය අවශ්‍ය වේ.

(3) සමාජයේ සාමාජිකයින්ට දඬුවම් කිරීම සඳහා සමාජ පාලනය අවශ්‍ය වේ.

(4) සමාජයේ සිටින අපරාධකරුවන් පුනරුත්තාපනය කිරීම සඳහා සමාජ පාලනය අවශ්‍ය වේ.

- සමාජ සම්බන්ධතා යහපත් අයුරින් ගොඩනගා ගැනීම සඳහා බුදු දහමේ ඉගැන්වෙන කරුණු කිහිපයක් පහත දැක්වේ. ඒවා හොඳින් අධ්‍යයනය කර 31 - 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

  A - නොපැනවූ නීති නොපැනවීම හා පැනවූ නීති කඩ නොකිරීම

  B – පිදිය යුත්තන් පිදීම

  C – දානය, ශීලය, පරිත්‍යාගය, මෘදු බව, තපස

  D – දෙමාපියන්ට උපස්ථාන කිරීම

  E – සමගිව රැස්වීම, සාමූහිකව කටයුතු කිරීම හා සමාදානයෙන් විසිරී යාම

  F - අක්‍රෝධය, අවිහිංසාව, ඉවසීම, ඍජුබව, විරුද්ධ නොවීම

31. ඉහත ඉගැන්වීම් අතුරින් දස රාජ ධර්මයට අයත් කරුණු පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

    (1) A, B (2) B, C (3) C, F (4) D, F

32. ඉහත ඉගැන්වීම් අතුරින් සප්ත අපරිහානීය ධර්මයන් අයත් කරුණු කිහිපයක් දැක්වෙන පිළිතුර තෝරන්න.

    (1) A, C (2) A, E (3) B, E (4) E, F

33. ඉහත ඉගැන්වීම් අතුරින් මහා මංගල සූත්‍රයේ දැක්වෙන කරුණු පමණක් දැක්වෙන පිළිතුර වන්නේ,

    (1) B හා C ය. (2) B හා D ය. (3) C හා D ය. (4) E හා F ය.

- පහත සඳහන් සමාජ පාලන කාරක ඇසුරින් 34 හා 35 ප්‍රශ්පනවලට පිළිතුරු සපයන්න.

  A - සාරධර්ම  
  B - අපරාධ නීතිය  
  C - සිවිල් නීතිය  
  D - චාරිත්‍ර වාරිත්‍ර

34. ඉහත සමාජ පාලන කාරක අතුරින් අවිධිමත් සමාජ පාලන කාරක පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

    (1) A, B (2) A, C (3) A, D (4) B, D

35. විධිමත් සමාජ පාලන කාරක පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද?

    (1) A, B (2) A, C (3) A, D (4) B, C

- පහත සඳහන් චාරිත්‍ර වාරිත්‍ර අධ්‍යයනය කර 36 සහ 37 ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

  A – සිංහල අලුත් අවුරුදු සමයේ යෙදෙන නොනගත වේලාවේ පින්දහම්වල යෙදීම  
  B – අන්සතු දේ සොරකම් කිරීම  
  C – ලේ ඥාතීන් අතර විවාහ සිදුවීම  
  D – පූජනීය ස්ථානවලට ඇතුළුවීමේ දී හිස් වැසුම් හා පාවහන් ගැලවීම

36. ඉහත ඒවායින් ජනාචාර පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

    (1) A, B (2) A, C (3) A, D (4) B, D

37. ගණාචාර පමණක් ඇතුළත් පිළිතුර කුමක්ද?

    (1) A, B (2) A, C (3) A, D (4) B, C

38. නීතියේ බලාධිපත්‍යය යනුවෙන් අදහස් කෙරෙන්නේ,

(1) නීතිය මත ආරෝපණය කර ඇති උත්තරීතර භාවයයි.

(2) සාමූහික පිළිගැනීමකට යටත් වීමයි.

(3) සැමට සමානව ක්‍රියාත්මක වීමයි.

(4) නීතිය කඩන්නා දණ්ඩනයකට යටත් කිරීමයි.

- ගිහි-පැවිදි දෙපිරිස අතර සමාජ ඵලදායී සමාජ සම්බන්ධතා පවත්වාගැනීමේ දී ඉටු විය යුතු කාර්යයන් කිහිපයක් පහත දැක්වේ. ඒවා හොඳින් අධ්‍යයනය කර 39 සහ 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – යහපත් ක්‍රියාවන්වල යෙදවීම

B – ආමිසයෙන් සංග්‍රහ කිරීම

C – මෛත්‍රී සහගත සිතින් යුක්තවීම

D – නොදත් දේ කියාදීම

39. ඉහත ඒවායින් සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගිහියන් විසින් පැවිදි උතුමන්ට කළ යුතු යුතුකම් පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A, B (2) A, C (3) A, D (4) B, C

40. සිඟාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන් විසින් ගිහියන්ට කළ යුතු යුතුකම් පමණක් දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A, B (2) A, D (3) B, C (4) B, D

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

| | | |
|---|---|---|
| 08 | S | I, II |

**මධ්‍යවාර පරීක්ෂණය - 2022**
**இரண்டாம் தவணைப் பரீட்சை - 2022**
**Mid Year Term Test - 2022**

**(08) සමාජ විද්‍යාව - I, II**

**03 ශ්‍රේණිය**

**සමාජ විද්‍යාව II පත්‍රය**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක් ද** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01)

I. සමාජ විද්‍යාව මගින් සමාජය අධ්‍යයනය කරන ප්‍රධාන තේමා **දෙක** සඳහන් කරන්න.
II. සමාජ ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
III. ඔගස්ට් කොම්ට් පෙන්වාදුන් දේවවාදී සමාජ අවධියේ පැවති ලක්ෂණ **දෙකක්** ලියන්න.
IV. මහින්දාගමනයට පෙර ලංකාවේ පැවති ආගමික විශ්වාසයන් **දෙකක්** සඳහන් කරන්න.
V. හින්දූන්ගේ ප්‍රධාන උත්සව **දෙකක්** සඳහන් කරන්න.
VI. සමාජ සංස්ථා **දෙකක්** සඳහන් කරන්න.
VII. සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට බාධා ඇති කරවන කරුණු **දෙකක්** ලියන්න.
VIII. බුදු සිරිතෙන් ඉගැන්වෙන නායකත්ව ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.
IX. සමාජ පාලනය බිඳ වැටීමෙන් සමාජයට අත්වන හානිදායක තත්ත්වයන් **දෙකක්** සඳහන් කරන්න.
X. ශ්‍රී ලංකාවේ ජීවත්වන ජන වර්ග **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20යි)

02)

I. සමාජ විද්‍යාව විෂයේ සංවර්ධනයට දායක වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න. (ලකුණු 02 යි)
II. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
III. සමාජ ගැටලු නිරාකරණය සඳහා බුදු දහමින් ලැබෙන දායකත්වය නිදසුන් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

03)

I. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
II. සමාජානුයෝජන කාරක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
III. සමාජයක් සමඟ සුහදව කටයුතු කිරීම සඳහා භික්ෂූන්වහන්සේලාට සමාජ විද්‍යාත්මක දැනුම උපයෝගී කර ගත හැකි ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[8 වැනි පිටුව බලන්න.

04)

I. සමාජ පරිණාමය යනු කුමක්ද? (ලකුණු 02 යි)

II. සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

III. අග්ගඤ්ඤ සූත්‍රයේ දැක්වෙන සමාජය පරිණාමය සම්බන්ධ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

05)

I. සංස්කෘතිය පිළිබඳ අර්ථකථනයක් සපයන්න. (ලකුණු 02 යි)

II. සංඝමිත්තා තෙරණිය සමඟ මෙරට පැමිණි ශිල්පීය කුල **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

III. පැවිදි සමාජ සංස්කෘතියට අනුව හැඩගැසෙන සාමණේරයන්වහන්සේලා ගොඩනගා ගත යුතු පුරුදු **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

06)

I. ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන බහු සංස්කෘතික ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

II. පුද්ගලයෙකු සමාජගත කිරීම සඳහා ජනමාධ්‍ය මඟින් සිදු කෙරෙන කාර්යයන් **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

III. මහින්දාගමනයට පෙර සිංහල සංස්කෘතියේ පැවති ලක්ෂණ බුදු දහම ලැබීමෙන් පසු වෙනස් වූ ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් පහදන්න. (ලකුණු 05 යි)

07)

I. පුද්ගලයෙකුට හිමි තත්ත්වය හා කාර්යය කොටස යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 02 යි)

II. සමාජයේ සාමාජිකයින් අතර අනෝන්‍ය සම්බන්ධතා පවත්වාගෙන යාම පහසු කරවන සතර සංග්‍රහ වස්තු මොනවාද? (ලකුණු 03 යි)

III. සමාජ සාරධර්ම ආරක්ෂා කර ගැනීම සඳහා පංචශීලයෙන් සැලසෙන සේවය කරුණු **දෙකක්** ඇසුරින් අගය කරන්න. (ලකුණු 05 යි)

08)

I. ධර්මතාවලට නොමැති ලක්ෂණ හතරක් නීතියට ඇත. ඉන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

II. ඕනෑම සමාජයකට පොදු සාරධර්ම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

III. සමාජ පාලනය සඳහා භික්ෂූන් වහන්සේලාට කළ හැකි කාර්යභාරයන් **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

09)

I. බෞද්ධ ආගමික උත්සව **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

II. ආගමික උත්සව පැවැත්වීමෙන් සමාජයට සිදුවන සේවාවන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

III. ශ්‍රී ලාංකේය සමාජයේ සංවර්ධනය සඳහා විහාරස්ථාන මඟින් සිදු කෙරෙන සේවාවන් **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

* * *

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

| 08 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2023**

**03 ශ්‍රේණිය**

**(08) සමාජ විද්‍යාව - I, II**

පැය තුනයි

අමතර කියවීම් කාලයය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**සමාජ විද්‍යාව I පත්‍රය**

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට** ම පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යෙදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සමාජ විද්‍යාව නමැති විෂය බිහි වී ඇත්තේ කිනම් සමාජයක් පදනම් කරගෙන ද?
(1) අප්‍රිකානු සමාජය (2) බටහිර සමාජය (3) ආසියානු සමාජය (4) ඇමෙරිකානු සමාජය

2. සමාජ විද්‍යාව නමැති පදය යොදා ගැනීමට පෙර එකී විෂයය හැඳින්වීම සඳහා භාවිත කළ නාමය කුමක් ද?
(1) ආර්ථික සමාජ විද්‍යාව (2) ඓතිහාසික සමාජ විද්‍යාව
(3) සමාජ භෞතික විද්‍යාව (4) සමාජ මනෝ විද්‍යාව

3. සමාජ විද්‍යාවේ බිහි වීම කෙරෙහි බලපෑ මූලික හේතුවක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) දේශපාලනික ප්‍රතිසංස්කරණ (2) ආගමික පුනරුදය
(3) බටහිරකරණය (4) කාර්මික විප්ලවය

4. පැරණි සමාජ හැඳින්වීම සඳහා යොදා ගත හැකි පර්යාය නාමයක් වන්නේ මින් කුමක් ද?
(1) ග්‍රාමීය සමාජ (2) සාම්ප්‍රදායික සමාජ (3) කාර්මික සමාජ (4) සංකීර්ණ සමාජ

5. නූතන සමාජයක දැකිය හැකි මූලික ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) සිරිත් විරිත්වලට දැඩි උනන්දුවක් පැවතීම (2) ශ්‍රම විභජනය අවම වීම
(3) සමාජ සම්බන්ධතා සීමා සහිත වීම (4) පෞද්ගලිකත්වයට වැඩි තැනක් ලැබීම

6. සමාජය දෙවියන්ගේ නිර්මාණයක් නොව මිනිසාගේ ම නිර්මාණයක් බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?
(1) මැක්ස් වෙබර් (2) ඔගස්ට් කොම්ට් (3) හර්බට් ස්පෙන්සර් (4) එමිල් ඩුර්කයිම්

7. සමාජ පරිණාමය පිළිබඳව සවිස්තර කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?
(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) සිගාලෝවාද සූත්‍රය
(3) චක්කවත්තිසිහනාද සූත්‍රය (4) කාලාම සූත්‍රය

8. පුද්ගල සමාජානුයෝජනය සඳහා ඉතා ම වැදගත් වන ප්‍රාථමික සමාජානුයෝජන කාරකය වන්නේ,
(1) පාසලයි. (2) ජනමාධ්‍යයයි. (3) පවුලයි. (4) සම වයස් කණ්ඩායමයි.

9. න්‍යෂ්ටික පවුලට අයත් සාමාජිකයින් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුරු තෝරන්න.
(1) මව, පියා, පුතා (2) ආච්චි, මව, දුව
(3) පියා, බාප්පා, පුතා (4) නැන්දම්මා, මව, දුව

10. සමාජ සංස්ථා පමණක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) පවුල, අධ්‍යාපනය, ප්‍රාථමික සමූහ (2) දේශපාලනය, සම වයස් කණ්ඩායම්, පවුල
(3) ද්විතියික සමූහ, ආර්ථිකය, ආගම (4) පවුල, අධ්‍යාපනය, ආර්ථිකය

11. සමාජය, ජීවමාන ඉන්ද්‍රිය පද්ධතියකට උපමා කළ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා කවුද?
(1) හර්බට් ස්පෙන්සර් (2) කාල් මාක්ස් (3) එමිල් ඩුර්කයිම්. (4) ඔගස්ට් කොම්ට්

[2 වැනි පිටුව බලන්න.

- පහත (අ) තීරුවේ බෞද්ධ පංචසීලය ද (ආ) තීරුවේ සිල්පද අනුගමනය නොකිරීම නිසා ඇති වන සමාජ ගැටලු ද දැක්වේ. ඒ ඇසුරින් 12 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| (අ) තීරුව | (ආ) තීරුව |
|---|---|
| (1) පාණාතිපාතා වේරමණී සික්ඛාපදං | (A) සොරකම |
| (2) අදින්නාදානා වේරමණී සික්ඛාපදං | (B) මදිරාබාධය |
| (3) කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං | (C) සාවද්‍ය තොරතුරු |
| (4) මුසාවාදා වේරමණී සික්ඛාපදං | (D) ගණිකා වෘත්තිය |
| (5) සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං | (E) මනුෂ්‍ය ඝාතන |

12. ඉහත (ආ) තීරුවේ දැක්වෙන සිල්පද අනුගමනය නොකිරීම නිසා ඇති වන ගැටලු (අ) තීරුවේ අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන වඩාත් නිවැරදි වරණය තෝරන්න.
(1) A, B, C, E හා D (2) B, A, D, C හා E (3) C, B, E , A හා D (4) E, A, D, C හා B

13. බුද්ධිවාදී පෞරුෂයක් ඇති අයගේ චරිත ලක්ෂණයක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) අනුන්ගේ කීම් අනුව කටයුතු කිරීම (2) උගතුන් ඇසුරට රුචියක් දැක්වීම
(3) අමුතු දේ කල්පනා කිරීමට ඇලුම් කිරීම (4) ගැඹුරු දේ තේරුම් ගැනීමට සමත් වීම

- පහත දැක්වෙන තත්ත්වයන් උපයෝගී කරගෙන 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ස්ත්‍රිය
B - වෛද්‍යවරයා
C - සිංහලයා
D - නිළිය

14. ආරෝපිත තත්ත්වයන් පමණක් දැක්වෙන නිවැරදි වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

15. සාධිත තත්ත්වයන් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද ?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

16. බෞද්ධ සමාජ දර්ශනයට අනුව ඇගයීමට ලක් **නොවන** පුද්ගල චරිත ලක්ෂණය මින් කුමක් ද?
(1) පාප මිත්‍රයින් ඇසුරු කිරීම (2) කළගුණ සැලකීම
(3) මව්පියන්ට උපස්ථාන කිරීම (4) පිදිය යුත්තන් පිදීම

- පහත සඳහන් A, B, C හා D යන සිද්ධි යුගල අධ්‍යයනය කර අංක 17 සහ 18 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - (i) දන් දීම
(ii) ලෝභකම

B - (i) අඹු දරුවන්ට සංග්‍රහ කිරීම
(ii) පවුලේ සමගිය

C - (i) මෛත්‍රී සහගත චර්යා
(ii) තරහව

D - (i) නුවණැත්තන් ඇසුරු කිරීම
(ii) දැනුම්වත්භාවය

17. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) B සහ D ය.

18. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක තෝරන්න.
(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) C සහ D

19. පන්ති ගැටුම්වල ප්‍රතිඵලයක් ලෙස සමාජ පරිණාමය සිදු වන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා වන්නේ,
(1) කාල් මාක්ස් ය. (2) හර්බට් ස්පෙන්සර් ය. (3) එමිල් ඩුර්කයිම් ය. (4) ඔගස්ට් කොම්ට් ය.

[3 වැනි පිටුව බලන්න.

20. ප්‍රතිපත්ති ශාසනය යන්නෙන් අදහස් වන්නේ,
(1) ධර්මය පිළිබඳ බුද්ධිමය වැටහීමයි. (2) ධර්මානුකූල පැවැත්මයි.
(3) බුද්ධ වචනය පිළිබඳ දනුමයි. (4) ධර්මාවබෝධයයි.

21. කෝට්ටේ යුගයේ ආරම්භ වූ පිරිවෙන් පමණක් දැක්වෙන වරණය තෝරන්න.
(1) කාලප්‍රාසාද පිරිවෙන, ග්‍රන්ථාකාර පිරිවෙන, මයුරපාද පිරිවෙන
(2) ආලාහණ පිරිවෙන, පධානඝර පිරිවෙන, මයුරපාද පිරිවෙන
(3) නියමකන්දේ පිරිවෙන, පරමධම්මචේතිය පිරිවෙන, විද්‍යෝදය පිරිවෙන
(4) පද්මාවතී පිරිවෙන, සුනේත්‍රාදේවී පිරිවෙන, ඉරුගල් කුලතිලක පිරිවෙන

22. සංස්කෘතිය සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?
(1) මිනිසාගේ මැදිහත් වීම අනුව සිදු වන හා පවතින සියලු දේ සංස්කෘතියට අයත් වේ.
(2) ස්වාභාවිකව නිර්මාණය වී ඇති සියල්ල සංස්කෘතියට අයත් වේ
(3) මිනිසාගේ ප්‍රයෝජනය සඳහා නිර්මාණය කර ඇති උපකරණ පමණක් සංස්කෘතියට අයත් වේ.
(4) ලෝකයේ ඇති සියලු දේ සංස්කෘතියට අයත් වේ.

- පහත දැක්වෙන කාර්යයන් උපයෝගී කරගෙන 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - ජය පරාජය සමව ඉවසීමට හැකියාව ලබා දීම
  B - පින පව යන සංකල්ප පිළිබඳ දැනුම ලබා දීම
  C - නායකත්වය දැරීමට හා නායකත්වයට අවනත වීමට හුරු කිරීම
  D - සාරධර්ම හා අගනාකම් පිළිබඳ හැඟීමක් ලබා දීම

23. සමාජානුයෝජනයේ දී පන්සල මඟින් වඩාත් ම හොඳින් සිදු කෙරෙන කාර්යයන් පමණක් දැක්වෙන නිවැරදි වරණය වනුයේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) B හා D ය.

24. මිත්‍ර කණ්ඩායම් මගින් සමාජානුයෝජන කාර්යයේ දී ප්‍රබලම ම සිදු කෙරෙන කාර්යයන් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

- පහත දැක්වෙන සංස්කෘතිකාංග උපයෝගී කරගෙන 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - චෛත්‍ය වන්දනාව
  B - මියගිය අයට පින් දීම
  C - පර්වත වන්දනාව
  D - නෑ යකුන් පිදීම

25. ප්‍රාථමික සිංහල සංස්කෘතියේ පැවති චාරිත්‍ර පමණක් නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

26. සිංහල බෞද්ධ සංස්කෘතියට අයත් චාරිත්‍ර පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද ?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

27. විජය කුමරු ඇතුළු පරිවාර පිරිස ශ්‍රී ලංකාද්වීපයට පැමිණියේ,
(1) ක්‍රි. පූ. 6 වන සියවසේ දී ය. (2) ක්‍රි. පූ. 3 වන සියවසේ දී ය.
(3) . ක්‍රි. ව. 3 වන සියවසේ දී ය. (4) ක්‍රි. ව. 6 වන සියවසේ දී ය.

28. ශ්‍රී ලංකාව බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ රාජ්‍යයක් බවට පත්වීමට බලපෑ ප්‍රධාන සාධකය වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ ලංකා ගමනයයි. (2) සංඝමිත්තා තෙරණිය වැඩමවීමයි.
(3) මිහිඳු මාහිමියන්ගේ වැඩමවීමයි. (4) ශ්‍රී මහා බෝධිය වැඩමවීමයි.

29. ගුණාත්මක සමාජ සම්බන්ධතා සඳහා උපකාරී වන සතර සංග්‍රහ වස්තු නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා (2) දානය, සීලය, ඍජු බව, අක්‍රෝධය
(3) දානය, ප්‍රියවචනය, අර්ථචර්යාව, සමානාත්මතාව (4) භෝග සුඛ, අත්ථි සුඛ, අණන සුඛ, අනවජ්ජ සුඛ

30. රාජ්‍ය පාලනයේ දී වැදගත් වන සංකල්පයක් වන 'දස සක්විති වත්' අන්තර්ගත සූත්‍ර දේශනාව වන්නේ මින් කුමක් ද?
(1) මහා පරිනිබ්බාණ සූත්‍රය (2) චක්කවත්තිසීහනාද සූත්‍රය
(3) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය (4) අග්ගඤ්ඤ සූත්‍රය

31. ශ්‍රී ලංකේය පැරණි සමාජයේ ප්‍රධාන අවිධිමත් සමාජ පාලන ආයතනය ලෙස ක්‍රියාත්මක වූයේ කුමක් ද?
(1) පාසල (2) උසාවිය (3) පන්සල (4) පොලීසිය

32. සමාජ විද්‍යාඥයින් හඳුන්වා දී තිබෙන ප්‍රධාන සමාජ වර්ග තුන නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) ගෝත්‍රික සමාජ, ගැමි සමාජ, කාර්මික සමාජ (2) ගෝත්‍රික සමාජ, ගැමි සමාජ, ප්‍රාථමික සමාජ
(3) නාගරික සමාජ, ගැමි සමාජ, කාර්මික සමාජ (4) ගෝත්‍රික සමාජ, සංකීර්ණ සමාජ, කාර්මික සමාජ

පහත දැක්වෙන සමාජ පාලන ධර්ම ඇසුරින් 33 හා 34 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - නිතර රැස්වීම
B - ක්‍රෝධ නොකිරීම
C.- නොපැනවූ නීති නො පැනවීම
D - පරිත්‍යාගශීලීභාවය
E.- වැඩිහිටියන්ගේ උපදෙස් පිළිපැදීම
F - හිංසාවෙන් වැළකීම

33. රාජ්‍යයක ආරක්ෂාවට හා දියුණුවට හේතු වන සප්ත අපරිහානීය ධර්මයනට අයත් අංග පමණක් ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
(1) A, B හා C (2) A, C හා E (3) B, C හා D (4) B, E හා F

34. රාජ්‍ය පාලනය තුළ අන්තර්ගත විය යුතු දස රාජ ධර්මයට අයත් අංග පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) A, C හා E ය. (2) B, C හා E ය. (3) B, D හා F ය. (4) C, D හා F ය.

35. සමාජ ධර්මතාවලින් ඈත් වූ පුද්ගලයා සමාජයේ,
(1) ආදරයට හා ප්‍රතික්ෂේප කිරීමට භාජනය වේ. (2) ගෞරවයට හා ආදරයට භාජනය වේ.
(3) අවමානයට හා ගෞරවයට භාජනය වේ. (4) අවමානයට හා ප්‍රතික්ෂේප කිරීමට භාජනය වේ.

36. ගිහි ජීවිතයෙන් පැවිදි ජීවිතයට පැමිණි නවක සාමණේරයන් වහන්සේ, භික්ෂු සමාජයේ චාරිත්‍ර වාරිත්‍ර රටාවට හැඩ ගැසීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,
(1) අපේක්ෂිත සමාජානුයෝජන ලෙසයි. (2) සාවද්‍ය සමාජානුයෝජන ලෙසයි.
(3) ද්විතියික සමාජානුයෝජන ලෙසයි. (4) පුනර් සමාජානුයෝජන ලෙසයි.

37. ඉස්ලාම් භක්තිකයින්ගේ ප්‍රධාන ආගමික ග්‍රන්ථය වන්නේ මින් කුමක් ද?
(1) අල්කුරාණය (2) බයිබලය (3) භගවත් ගීතාව (4) ධම්මපදය

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
සමාජ පාලනය සඳහා චාරිත්‍ර වාරිත්‍රවල වැදගත්කම පිළිබඳ තොරතුරු ගවේෂණය කළ නන්දන පිරිවෙනේ තුන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අමිත හිමියන් අනාවරණය කර ගත් මූලික තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A - සමාජය තුළ ක්‍රියා කිරීමට සුදුසු යැ යි සම්මත නමුත් එය නොසලකා හැරීම හෝ බිඳලීමට එරෙහිව දැඩි සමාජ ප්‍රතික්‍රියා රහිත චර්යා සමුදායක් ඇති බව
B - සමාජය තුළ ක්‍රියා කිරීමට බල කරන එසේම ඒවා බිඳ හෙළීම හෝ නොතකා හැරීම සම්බන්ධව බර පතළ ප්‍රතික්‍රියා සහිත චර්යා සමුදායක් ඇති බව
C.- ඒ ඒ සමාජයට ආවේණික වන සේ චාරිත්‍ර වාරිත්‍ර ගොඩනැගී ඇති බව

38. ඉහත A අක්ෂරය යටතේ හඳුනාගත් චාරිත්‍ර වාරිත්‍ර සමාජ විද්‍යාත්මකව නම් කරන්නේ,
(1) ගණාචාර ලෙසයි. (2) ජනචර්යා ලෙසයි. (3) සාරධර්ම ලෙසයි. (4) නීති ලෙසයි.

39. අමිත හිමියන් අනාවරණය කර ගත් B අක්ෂරයට අදාළ චාරිත්‍ර වාරිත්‍ර හඳුන්වන්නේ කුමන නමකින් ද?
(1) ගණාචාර (2) ජනචර්යා (3) සාරධර්ම (4) නීති

40. ඉහත C අක්ෂරයේ දැක්වෙන චාරිත්‍ර වාරිත්‍රවල ආවේණික බව හා සම්බන්ධ ලක්ෂණයෙන් අදහස් වන්නේ,
(1) සෑම සමාජයක ම පවතින චාරිත්‍ර වාරිත්‍ර සමාන බවයි.
(2) සමාජයෙන් සමාජයට වෙනස් අනන්‍යතාවෙන් යුතු චාරිත්‍ර වාරිත්‍ර පවතින බවයි.
(3) චාරිත්‍ර වාරිත්‍ර පරම්පරාවෙන් පරම්පරාවට පවරාදීමක් සිදු කරන බවයි.
(4) සමාජ පාලනය සඳහා චාරිත්‍ර වාරිත්‍ර අත්‍යවශ්‍ය බවයි.

* * *

[5 වැනි පිටුව බලන්න.

සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය**

| 08 | S | I, II |
|---|---|---|

**මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය -2023**

**03 ශ්‍රේණිය**

**(8) සමාජ විද්‍යාව - II**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. i. සමාජ විද්‍යාවේ පිය ලෙස හැඳින්වෙන්නේ කවුද? ඔහු කුමන ජාතිකයෙක් ද?
   ii. සමාජ විද්‍යාව මූලික සංකල්ප **දෙකක්** ලියන්න.
   iii. සම්ප්‍රදායික කිතුනු ආගමට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දුන් පූජකවරු **දෙදෙනා** කවුද?
   iv. නාගරික සමාජවලට ආවේණික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
   v. සමාජ පරිණාමය පිළිබඳව කියැවෙන බෞද්ධ සංකල්ප **දෙකක්** සඳහන් කරන්න.
   vi. ශ්‍රී ලංකේය සමාජයේ වෙසෙන ජන වර්ග **දෙකක්** සඳහන් කරන්න.
   vii. ශ්‍රී ලාංකේය බෞද්ධ සමාජයේ සිදු කෙරෙන ආගමික උත්සව **දෙකක්** සඳහන් කරන්න.
   viii. පුද්ගලයා පිරිහීමට පත්වන කරුණු **දෙකක්** ලියන්න.
   ix. සමාජ පාලනය සිදුවන ප්‍රධාන ක්‍රම **දෙක** සඳහන් කරන්න.
   x. ඕනෑ ම සමාජයකට පොදුවේ පිළිගත හැකි සාරධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20යි)

2. i. සමාජ විද්‍යාව යනු කුමක් ද? (ලකුණු 02 යි)
   ii. සමාජ විද්‍යාව විෂය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. සමාජ ගැටලු නිවාරණය සඳහා භික්ෂූන් වහන්සේලාට සිදු කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

3. i. ඔගස්ට් කොම්ට් පෙන්වා දුන් සමාජ විද්‍යාවේ ප්‍රධාන තේමා **දෙක** මෙනවා ද? (ලකුණු 02 යි)
   ii. සමාජය අධ්‍යයනය කිරීමට යොදා ගත හැකි ක්‍රමවේද **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   iii. සමාජ නායකයෙකු ලෙස භික්ෂූන් වහන්සේ තුළ තිබිය යුතු ගුණාංග **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

4. i. සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක් වූ සමාජ විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න. (ලකුණු 02 යි)
   ii. ප්‍රාථමික සමාජයට ආවේණික ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   iii. මහින්දාගමනය නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

5. i. සමාජ වෙනස් වීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   ii. නූතන පිරිවෙන් අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක ප්‍රධාන පිරිවෙන් වර්ග **තුන** මොනවා ද? (ලකුණු 03 යි)
   iii. ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා විහාරස්ථාන මගින් සිදු කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

6. i. සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න. (ලකුණු 02 යි)
   ii. හින්දූන්ගේ ප්‍රධාන ආගමික උත්සව **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. නවක සාමණේරයන් වහන්සේලා හුරු පුරුදු විය යුතු ශාසනික පිළිවෙත් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

7. i. සමාජයක තිබිය යුතු මූලික ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   ii. සමාජ අවශ්‍යතා ඉටුකර ගැනීමට ගොඩනගාගෙන ඇති ආයතන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. දරුවන් විසින් දෙමව්පියන් වෙනුවෙන් සිදු කළ යුතු යුතුකම් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

8. i. සමාජ පාලන ක්‍රමයක් අවශ්‍ය වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   ii. නීතිය ක්‍රියාත්මක කිරීමේ දී දක්නට ලැබෙන මූලික කරුණු **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. සමාජ පාලනය සඳහා උපකාර වන බුදු දහමේ ඉගැන්වෙන සාරධර්ම **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

* * *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]
අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / fy;tp mikr;R - gpupntdhf;; fy;tpg; gpupT

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 04 ශ්‍රේණිය

## (08) සමාජ විද්‍යාව - I, II

පැය තුන යි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

### සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. **"න්‍යාය හා සංකල්පවලින් ඔබ්බට ගොස් සමාජයේ අවශ්‍යතා ඉටු කරන ප්‍රායෝගික විෂයක් බවට සමාජ විද්‍යාව පත් ව ඇත"** මෙම අදහසට වඩාත් සමීප වන්නේ පහත කුමන අදහසක් ද?
   (1) සමාජ විද්‍යාව පැරණි විෂයක් බව යි. (2) සමාජ විද්‍යාව නව විෂයක් බව යි.
   (3) සමාජ විද්‍යාව ගැඹුරු විෂයක් නො වන බව යි. (4) සමාජ විද්‍යාව න්‍යායන් ද හඳාරන ප්‍රායෝගික විෂයක් වන බව යි.

2. සමාජ විද්‍යාව පිළිබඳ **එල්. ටී. හොබ්හවුස්ගේ** අදහස අනුව වඩාත් ම ගැළපෙන ප්‍රකාශය මින් කුමක් ද?
   (1) සියලු ම සමාජ විද්‍යාවන්ගේ මව යි.
   (2) සමාජ විද්‍යාව මානව වංශ විද්‍යාවකි.
   (3) මිනිසාගේ සමස්ත සමාජ ජීවිතය විෂය කොට ගත් විෂයකි.
   (4) සමාජ විද්‍යාවන් අතර සුවිශේෂ විෂය සමාජ විද්‍යාව යි.

3. **"සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳ ව අධ්‍යයනය කරන විද්‍යාව යි."** යනුවෙන් දක්වා ඇත්තේ,
   (1) ඔගස්ට් කොම්ට් ය. (2) එමිල් ඩුර්කයිම් ය. (3) ජෝන් ස්ටුවර්ට් මිල් ය. (4) ඇන්තනී ගිඩ්න්ස් ය.

4. සමාජ විද්‍යාව විෂයේ ආරම්භ සම්බන්ධව නිවැරදි වරණය මින් කුමක් ද?
   (1) 18 වන සියවසේ මැද භාගයේ දී ප්‍රංශයේ දී ආරම්භ විය.
   (2) 19 වන සියවසේ මැද භාගයේ දී ප්‍රංශයේ දී ආරම්භ විය.
   (3) 19 වන සියවසේ මැද භාගයේ දී ජර්මනියේ දී ආරම්භ විය.
   (4) 20 වන සියවසේ මැද භාගයේ දී එංගලන්තයේ දී ආරම්භ විය.

5. බටහිර සමාජය විපර්යාසයට හේතු වූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ,
   (1) මාටින් ලූතර් හා මැක්ස් වේබර් විසිනි. (2) සෙන්ට් සිමෝන් හා ජෝන් කැල්වින් විසිනි.
   (3) මාටින් ලූතර් හා ජෝන් කැල්වින් විසිනි. (4) මැක්ස් වේබර් හා ජෝන් කැල්වින් විසිනි.

6. සමාජීය විද්‍යාවන් පමණක් සඳහන් නිවැරදි පිළිතුර මින් කුමක් ද?
   (1) මානව විද්‍යාව, මනෝවිද්‍යාව, ඉතිහාසය (2) මානව විද්‍යාව, පරිසර විද්‍යාව, ඉතිහාසය
   (3) රසායන විද්‍යාව, මනෝවිද්‍යාව, ඉතිහාසය (4) මානව විද්‍යාව, මනෝවිද්‍යාව, ජීව විද්‍යාව

7. යුරෝපීය සමාජයේ කර්මාන්ත ක්ෂේත්‍රයෙහි විපර්යාසයක් ඇති කිරීමට හේතු වූ ප්‍රධානතම සාධකය කුමක් ද?
   (1) දුම්රිය එන්ජිම නිපදවීම (2) බලවේග යන්ත්‍රය නිපදවීම
   (3) මියුල් යන්ත්‍රය නිපදවීම (4) හුමාල එන්ජිම නිපදවීම

8. වර්ෂ 1789 දී සිදු වූ ප්‍රංශ විප්ලවයේ වඩාත් ම වැදගත් සමාජ ප්‍රතිඵලය මින් කුමක් ද?
   (1) දහසයවන ලුවී රජු පාලන බලයෙන් නෙරපීම
   (2) කතෝලික පල්ලියේ ආධිපත්‍යයෙන් නිදහස් වීම
   (3) රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳවැටීම
   (4) පුද්ගල නිදහස පදනම් කර ගත් දේශපාලන දර්ශනයකට මග පෑදීම

[2 වැනි පිටුව බලන්න.

9. ආරෝපිත තත්ත්වයට අදාළ **නො වන්නේ** පහත කුමන තත්ත්ව කුලකය ද ?
(1) කුලය (2) ජාතිය (3) ගුරු වෘත්තිය (4) ස්ත්‍රී පුරුෂ භාවය

- පහත සඳහන් සමාජ ලක්ෂණ ඉතා හොඳින් අධ්‍යයනය කර 10 සහ 11 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - විමර්ශනශීලී නො වීම
B - නෛතික සම්බන්ධතා දක්නට ලැබීම
C - බිය මුසු ගෞරවයක් තිබීම
D - නිෂ්පාදන අතිරික්තයක් පැවතීම
E - ලෝකය දෙස විමර්නාත්මක ව බැලීම
F - ප්‍රාථමික ලක්ෂණ ඇති සමාජයක් තිබීම

10. ඔගස්ට් කොම්ට්ට අනුව දේවවාදී අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, C හා F (3) B, D හා E . (4) D, E හා F

11. ඔගස්ට් කොම්ට් දැක්වූ ලෙස පාර භෞතික අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,
(1) A, B හා C ය. (2) A, C හා F ය. (3) B, D හා E ය. (4) D, E හා F ය.

- පහත සඳහන් සමාජ ලක්ෂණ ඉතා හොඳින් අධ්‍යයනය කර 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - දේපළ පිළිබඳ පොදු අයිතියක් තිබීම
B - නිෂ්පාදන සාධකවල වැඩි අයිතිය ධනපතියා සතු ව තිබීම
C - ලාභය පදනම් කර ගෙන නිෂ්පාදනයන් සිදු වීම
D - පන්ති ස්තරායණයක් නොමැති වීම
E - ශ්‍රම සූරාකෑමක් නො වීම
F - සමාජයේ පන්ති ගැටුම් නිර්මාණය වීම

12. කාල් මාක්ස්ට අනුව ධනවාදී අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, C හා F (3) B, C හා F . (4) D, E හා F

13. කාල් මාක්ස් දැක්වූ ලෙස සමාජවාදී අවධියේ සමාජ ලක්ෂණයක් පමණක් සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,
(1) A, B හා C ය. (2) A, D හා E ය. (3) B, D හා E ය. (4) D, E හා F ය.

14. හර්බට් ස්පෙන්සර් දැක්වූ ලෙස සමාජ පරිණාම සිදු වූයේ,
(1) රණකාමී අවධියේ සිට කාර්මික අවධිය දක්වා ය. (2) කාර්මික අවධියේ සිට රණකාමී අවධිය දක්වා ය.
(3) රණකාමී අවධියේ සිට ඓන්ද්‍රීය අවධිය දක්වා ය. (4) යාන්ත්‍රික අවධියේ සිට කාර්මික අවධිය දක්වා ය.

15. ඔගස්ට් කොම්ට් දැක්වූ මානව සමාජ ප්‍රගතියේ උසස් ම අවධිය වූ යථානුභූත අවධියේ සමාජ ලක්ෂණක් **නො වන්නේ** මින් කුමක් ද ?
(1) විශ්වාසය මත නො ව දැනුම මත ක්‍රියා කිරීම
(2) ලෝකය විද්‍යාත්මක ව තේරුම් ගැනීම
(3) නිර්මාණාත්මක ව අලුත් තත්ත්වයන්ට මුහුණ දීම
(4) ස්වාභාවික සංසිද්ධීන්ට දේව බලයක් ආරෝපණය කිරීම

- පහත සඳහන් වගකීම් හොඳින් අධ්‍යයනය කර 16 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - රටවැසියන්ගේ ද පරිසරයේ ද ආරක්ෂාව සැලසීම
B - රටේ සාමය පවත්වා ගැනීම
C - දේව නියමයන්ට අනුව රාජ්‍ය පාලනය කිරීම
D - සාධාරණ ආර්ථික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

16. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ඉගැන්වීම්වලට අනුව රාජ්‍ය පාලකයාගේ වගකීම් පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

17. කාර්මීකරණයේ මූලික ලක්ෂණය **නො වන්නේ** මින් කුමක් ද ?
(1) තරගකාරී ආර්ථික ක්‍රමයක් තිබීම
(2) දියුණු ප්‍රවාහන පද්ධතියක් තිබීම
(3) සරල ආර්ථික ක්‍රමයක් තිබීම .
(4) සංකීර්ණ ශ්‍රම විභජනයක් තිබීම

- පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 18 ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - නවීකරණය
B - කාර්මීකරණය
C - නාගරීකරණය
D - දේශපාලනීකරණය

18. දීර්ඝ කාලීන සමාජ වෙනස් වීම කෙරෙහි බලපාන මූලික සාධක පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

- ආධිපත්‍ය සම්බන්ධ පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 19වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - සාම්ප්‍රදායික ආධිපත්‍යය
B - අනුභාසාත්මක ආධිපත්‍ය
C - අධි ස්වාභාවික ආධිපත්‍යය
D - නෛතික ආධිපත්‍යය

19. මැක්ස් වෙබර් නම් සමාජ විද්‍යාඥයාගේ අධිපත්‍ය වර්ගීකරණයට අයත් සංකල්ප තුන අයත් වරණය වනුයේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

20. පැරණි ශ්‍රී ලාංකේය ගොවි සමාජයේ දක්නට ලැබුණු **'කයිය'** යන සංකල්පයේ සමාජ විද්‍යාත්මක වටිනාකම දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) සියලු දෙනා එකට වැඩ කිරීම (2) අස්වැන්න සියලු දෙනා අතර බෙදා ගැනීම
(3) කන්නයට අනුව වැඩ ඇරඹීම (4) අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතු ව වැඩ කිරීම

21. "මිනිසාගේ මනෝකායික අවශ්‍යතාවන් සපුරා ගැනීමට ඇති කරගත් දෙය සංස්කෘතිය" යනුවෙන් සංකෘතිය යන්න නිර්වචනය කරන ලද්දේ,
(1) බ්‍රැනිස්ලෝ මැලිනොවුස්කි ය. (2) රේමන්ඩ් ෆර්ත් ය.
(3) රැල්ෆ් ලින්ටන් ය. (4) ඒ. ආර්. රැඩික්ලිෆ් බ්‍රවුන් ය.

22. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස සැලකෙනුයේ,
(1) රේමන්ඩ් ෆර්ත් ය. (2) ඇල්බට් කොහෙන් ය. (3) සිග්මන් ෆ්‍රොයිඩ් ය. (4) ඊ. බී. ටයිලර් ය.

23. ඉංග්‍රීසින් විසින් මුළු දිවයින ම යටත් විජිත පාලනය යටතට පත් කර ගන්නා ලද්දේ,
(1) 1815 දී ය. (2) 1818 දී ය. (3) 1833 දී ය. (4) 1948 දී ය.

- ප්‍රශ්න අංක 24 - 25 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සාධක උපයෝගී කර ගන්න.

A - කුල භේදය
B - අදහස්
C - සමාජ පන්ති
D - විශ්වාස
E - ඇදහිලි
F - ආගමික බෙදීම්

24. ආවෘත්ත සංස්කෘතික ස්වභාවය තේරුම් ගැනීමට අවශ්‍ය කරුණු පමණක් නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද ?
(1) A, B හා C ය. (2) A, B හා E ය. (3) B, D හා E ය. (4) C, E හා F ය.

25. විවෘත්ත සංස්කෘතික ලක්ෂණ පමණක් දක්නට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) A, B හා C (2) A, C හා F (3) B, D හා E (4) C, E හා F

26. අතීත ශ්‍රී ලාංකේය සමාජයේ කන්න තුනක් ගොවිතැන් කළ බව දැක්වෙන සෙල්ලිපිය කුමක් ද ?
(1) මිහින්තලා සෙල්ලිපිය (2) තෝණිගල සෙල්ලිපිය
(3) දිඹුලාගල සෙල්ලිපිය (4) රජගල සෙල්ලිපිය

27. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා ඇඟ බද්ද, ඔරු බද්ද, බලු බද්ද, සෙරෙප්පු බද්ද වැනි බදු වර්ග මෙරටට හඳුන්වා දෙන ලද්දේ කුමන පාලන යුගයේ දී ද?
(1) ලන්දේසි පාලන යුගය (2) ඉංග්‍රීසි පාලන යුගය
(3) චෝල පාලන යුගය. (4) පෘතුගීසි පාලන යුගය

[4 වැනි පිටුව බලන්න.

- පහත සඳහන් සිද්ධි යුගල ඉතා හොඳින් අධ්‍යයනය කර 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - (i) අටලෝදහමින් අකම්පිත වීම
(ii) මානව හිතවාදී චර්යා
B - (i) පාප මිත්‍ර සේවනය
(ii) පුද්ගල දියුණුව
C - (i) මව්පිය දූ දරු සම්බන්ධතා
(ii) මානව පවුලේ දියුණුව
D - (i) තෘෂ්ණාව
(ii) පරිත්‍යාගශීලී භාවය

28. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) වැඩි වීම කෙරෙහි බලපාන නිවැරදි සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) A සහ C ය. (3) B සහ C ය. (4) C සහ D ය.

29. පළමුවැන්නේ (i) වැඩි වීම දෙවැන්නේ (ii) අඩු වීම කෙරෙහි බලපාන වඩාත් නිවැරදි සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) C සහ D ය. (3) A සහ C ය. (4) B සහ D ය.

30. **"සාරධර්මවල බලපෑම තුළින් සමාජය වෙනස් වන බව"** පෙන්වා දෙමින් සාරධර්මවල වටිකම පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුරුන් ද ?
(1) ඒස්. පාර්ක් (2) එච්. පී. ෆෙයාවයිල්ඩ් (3) හැරී ඒම්. ජොන්සන් (4) ටැල්කොට් පාසන්ස්

- පහත සඳහන් සංක්‍රමණ හා ආක්‍රමණ හොඳින් අධ්‍යයනය කර 31වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - විජයාගමනය
B - එළාර ආක්‍රමණය
C - මහින්දාගමනය
D - ඉංග්‍රීසි ආක්‍රමණය

31. ශ්‍රී ලාංකේය සමාජයේ දීර්ඝ කාලීන හා පරිවර්තනීය සමාජ වෙනස් වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

32. "අගහස් දානය" ලෙස හැඳින්වෙන්නේ,
(1) අලුත් අවුරුදු උත්සවය යි. (2) තෛපොන්ගල් උත්සවය යි.
(3) වප්මගුල් උත්සවය යි. (4) අලුත්සහල් මංගල්‍යය යි.

- පහත සඳහන් සාධක හොඳින් අධ්‍යයනය කර 33වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - පරිපාලන කේන්ද්‍රස්ථාන
B - කර්මාන්ත පුරවර
C - සෞඛ්‍ය පහසුකම්
D - මුඩුක්කු නිවාස

33. ශ්‍රී ලාංකේය සමාජයේ නාගරීකරණය වේගවත් වීම කෙරෙහි බලපාන සාධක පමණක් සඳහන් නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D . (4) B, C හා D

34. ඉතිහාසඥ, **ගිබන්**ට අනුව පුද්ගලයෙකුට අධ්‍යාපනය ලබා ගත හැකි ක්‍රම අතුරින් වඩාත් වැදගත් ක්‍රමය කුමක් ද ?
(1) ගුරුවරුන්ගෙන් ලැබෙන අධ්‍යාපනය (2) තමාට තමාගෙන් ලැබෙන අධ්‍යාපනය
(3) දෙමාපියන්ගෙන් ලැබෙන අධ්‍යාපනය (4) වැඩිහිටියන්ගෙන් ලැබෙන අධ්‍යාපනය

35. **"යමෙකු තුළ ශරීරයෙහි, සිතෙහි සහ අධ්‍යාත්මයෙහි ඇති හොඳ ම දෙය පිටතට ඇද ගැනීම"** අධ්‍යාපනය ලෙස හඳුන්වන ලද්දේ,
(1) මහත්මා ගාන්ධිතුමා ය. (2) අනගාරික ධර්මපාලතුමා ය.
(3) ජවහර්ලාල් නේරුතුමා ය. (4) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය.

36. අතීතයේ දී ගම පාලනය කිරීම සඳහා 'ගමික' නමින් පිහිටුවන ලද තනතුරෙහි වර්තමාන නිල නාමය කුමක් ද?
(1) ග්‍රාම සේවක (2) ගම්මුලාදෑනි (3) ආරච්චිරාල (4) ග්‍රාම නිලධාරී

37. හින්දු ආගමික ඉගැන්වීම් අනුව **අධර්මානුකූල වූවන්ගේ නැසීම** සිදු කරනු ලබන්නේ,
(1) විෂ්ණු දෙවියන් විසිනි. (2) මහාබ්‍රහ්මයා විසිනි.
(3) ගණේෂ දෙවියන් විසිනි. (4) ශිව දෙවියන් විසිනි.

38. ඉස්ලාම් ආගමික සිරිත් විරිත් ගොඩනැගීමෙහි ලා මූලික වූ ආගමික ධර්මයක් වන **සලාතය** යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) නිරතුරුව ම නැමදීමෙහි යෙදීම යි. (2) දුප්පතුන් වෙනුවෙන් අනිවාර්ය දන් දීම යි.
(3) දිවා කාලයේ ආහාරයෙන් වැළකී සිටීම යි. (4) මක්කම වන්දනාවේ යෙදීම යි.

39. කතෝලික ආගමිකයින්ගේ සමාජ පාලනයේ පදනම වන **දස පනතට** අයත් කරුණක් **නො වන්නේ** මින් කුමක් ද?
(1) ප්‍රාණඝාතය නො කරව යන්න යි. (2) කාමයයෙහි වරදවා නො හැසිරෙව යන්න යි.
(3) අදත්තාදානය නො කරව යන්න යි. (4) තාගේ මවුපියන්ට ගෞරව පූජා නො කරව යන්න යි.

40. බුදු දහමේ ඉගැන්වීම් අනුව සමාජ පාලනයේ මූලික අඩිතාලම වනුයේ,
(1) පඤ්චශීලයට අනුගත ව ජීවත් වීම යි. (2) දහම් අධ්‍යාපනයට යොමු වීම යි.
(3) නිරතුරු ව ධර්මය ශ්‍රවණය කිරීම යි. (4) ආමිස පූජාවන් සිදු කිරීම යි.

* * *

[6 වැනි පිටුව බලන්න.

[ සියලුම හිමිකම් ඇවිරිණි]
[KOg; gjpg;Gupik cilaJ]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / fy;tp mikr;R - gpupntdhf; fy;tpg; gpupT

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2024

## 04 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - II

- පළමුවන ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරා ගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1.
   (i) පවුල් ජීවිතයේ බිඳ වැටීම නිසා ඇති වන ප්‍රධාන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
   (ii) ලෝකයේ පවතින විද්‍යාවන් වර්ග කළ හැකි ප්‍රධාන කොටස් **දෙක** මොනවා ද?
   (iii) සමාජ විද්‍යාඥයින් සමාජ සංවර්ධනය ප්‍රධාන අවධි **දෙකකට** ගොනු කර ඇත. ඒවා මොනවා ද?
   (iv) බුදු දහමට අනුව දියුණුව **දෙයාකාර** වේ. ඒ මොනවා ද?
   (v) සංස්කෘතියේ ප්‍රධාන කොටස් **දෙක** ලියන්න.
   (vi) සමාජ විද්‍යාඥයින්ට අනුව සෑම ආගමක ම පොදුවේ දැක ගත හැකි ලක්ෂණ **දෙක** සඳහන් කරන්න.
   (vii) ශ්‍රී ලාංකේය සමාජය තුළ ජීවත් වන ජනවර්ග **දෙකක්** සඳහන් කරන්න.
   (viii) රාජ්‍ය පාලනය සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ මූල ධර්ම දෙකක් ලියන්න.
   (ix) සමාජ පාලනයක් අවශ්‍ය වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.
   (x) සමාජ පාලන කාර්ය සඳහා නායකත්වය සපයන භික්ෂුවක් තුළ තිබිය යුතු ගුණාංග **දෙක** ලියන්න.

(ලකුණු 02 × 10 = 20යි)

2.
   (i) සමාජ විද්‍යාව පිළිබඳ ව අර්ථකථනයක් සපයන්න. (ලකුණු 02 යි)
   (ii) බටහිර සමාජය විපර්යාසයන්ට ලක් වීමට බලපෑ හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   (iii) බුදු දහමේ සමාජ සම්බන්ධතා පිළිබඳ දැක්වන ආකල්පය, සිගාලෝවාද සූත්‍රයේ කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

3.
   (i) ප්‍රාථමික සමාජ සමූහයක දක්නට ලැබෙන ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
   (ii) සමාජ විද්‍යාවේ උපවිෂය ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (iii) මානව පවුලේ කාර්යභාරයන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

4.
   (i) සමාජ පරිණාම අධ්‍යයනය කිරීමට උපයොගි කර ගත හැකි සමාජයානුබද්ධ සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) නවීකරණයේ අංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (iii) ශීලය පදනම් ව ගොඩනැගී ඇති බෞද්ධ සමාජ පන්ති ක්‍රමයේ වටිනාකම කරුණු **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

5.
   (i) සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් සපයන්න. (ලකුණු 02 යි)
   (ii) සංස්කෘතිය මගින් සිදු වන සේවාවන් තුනක් ලියන්න. (ලකුණු 03 යි)
   (iii) බුදු දහම නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[7 වැනි පිටුව බලන්න.

6.

(i) සමාජයක් යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ii) බටහිර ආක්‍රමණ නිසා ශ්‍රී ලාංකේය සමාජයේ ඇති වූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) යහපත් රාජ්‍ය පාලන ක්‍රමයක් ගොඩනැගීම සඳහා දසරාජධර්ම උපයෝගි කර ගැනීමේ වැදගත්කම කරුණු **දෙකක්** ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

7.

(i) තත්ත්වයෙහි කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සරල හෙවත් ග්‍රාමීය සමාජවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) යහපත් සමාජ ජීවිතයක් සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** පැහැදිලි කරන්න.(ලකුණු 05 යි)

8.

(i) නගරික සමාජය තුළ දක්නට ලැබෙන සමාජ ගැටලු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පූර්ණ අධ්‍යාපනයක් තුළින් බිහි කෙරෙන පුරවැසියෙකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලාංකේය සමාජ පාලනය සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට සිදු කළ හැකි කාර්යභාරයන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

* * *

# සමාජ විද්‍යාව

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven Year End Tearm Test - 2018

### 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව **I, II** කාලය : පැය තුන යි

**Sociology I, II** **Time : Three Hours**

සමාජ විද්‍යාව **I**

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. (මෙම කොටස සඳහා ලකුණු 40ක් හිමි වේ).

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

01. සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් ලෙස බිහි වූයේ, කිනම් සමාජයක් පදනම් කර ගෙන ද?

i. ආසියානු සමාජය
ii. මැදපෙරදිග සමාජය
iii. අප්‍රිකානු සමාජය
iv. බටහිර සමාජය

02. සමාජ විද්‍යාවේ පියා ලෙස විරුදාවලිය ලැබුයේ,

i. ඔගස්ට් කොම්ට් ය.
ii. හර්බට් ස්පෙන්සර් ය.
iii. කාල් මාක්ස් ය.
iv. එමිල් ඩුර්කයිම් ය.

03. සමාජ විද්‍යාව යන පදය මුලින් ම භාවිතයට පැමිණි වර්ෂය වන්නේ,

i. 17 වන සියවසේ දී ය.
ii. 18 වන සියවසේ දී ය.
iii. 20 වන සියවසේ දී ය.
iv. 19 වන සියවසේ දී ය.

04. සමාජය පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා නිවැරදි ක්‍රමවේද සඳහන් පිළිතුර වන්නේ,

i. නිරීක්ෂණ, නිගමන, පර්යේෂණ
ii. නිරීක්ෂණ, සම්පරීක්ෂණ, සමීක්ෂණ
iii. සම්පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන
iv. නිගමන, සම්පරීක්ෂණ, පර්යේෂණ

05. සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ විෂයයක් වන්නේ,

i. භෞතික විද්‍යාව යි.
ii. ජීව විද්‍යාව යි.
iii. දේශපාලන විද්‍යාව යි.
iv. තාරකා විද්‍යාව යි.

06. සමාජ පරිණාමය වීමට බලපානු ලබන මූලික හේතුව පුද්ගලයා තුළ පවතින,

i. ගතික ස්වභාවය යි.
ii. සංකීර්ණ ස්වභාවය යි.
iii. අනාත්ම ස්වභාවය යි.
iv. ස්ථිතික ස්වභාවය යි.

07. පැරණි සමාජය තුළ ඉස්මතු වී තිබූ ප්‍රධාන ගුණය නම්,

i. ප්‍රජාතාන්ත්‍රික බව යි.
ii. ආරෝපිත තත්ත්වය යි.
iii. කාර්මිකත්වය යි.
iv. සාධික තත්ත්වය යි.

08. දේවවාදී සංකල්පය උපත ලැබුවේ,

i. ප්‍රාථමික සමාජය තුළ ය.
ii. නූතන සමාජය තුළ ය.
iii. ප්‍රංශ සමාජය තුළ ය.
iv. ආසියානු සමාජය තුළ ය.

09. ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ ධනපතියා විසින් නිර්ධනයන් පීඩනයට ලක්කරන බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

i. එමිල් ඩුර්කයිම් ය.
ii. කාල් මාක්ස් ය.
iii. හර්බට් ස්පෙන්සර් ය.
iv. ඔගස්ට් කොම්ට් ය.

10. වෙනස්වීම නිසා හටගන්නා වූ දුක බුදුදහමේ හඳුන්වනු ලබන්නේ,

i. පියේහි විප්පයෝග දුක්ඛ ලෙස ය.
ii. අප්‍රිය සම්පයෝග දුකඛ ලෙස ය.
iii. ජාතිපි දුක්ඛ ලෙස ය.
iv. විපරිණාම දුක්ඛ ලෙස ය.

11. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලබන්නේ,

i. රැල්ෆ් ලින්ටන් ය.
ii. රේමන්ඩ් විලියම්ස් ය.
iii. ඊ. බී. ටයිලර් ය.
iv. බී. මැලිනොව්ස්කි ය.

12. සංස්කෘතිය යන්නට නූතන සමාජ විද්‍යාඥයින් දක්වන පර්යාය පදයක් වන්නේ,

i. සමාජ වෙනස් වීම යි.
ii. සමාජ උරුමය යි.
iii. සමාජ චර්යාව යි.
iv. සමාජ චාරිත්‍ර විධි යි.

13. ශාස්ත්‍රානුසාරයෙන් ගොඩනැගුණු, විමර්ශනශීලිත්වයක් නොතිබුණු, පැරණි සමාජයේ පුරවැසියා පරිසරය දේවත්වයෙන් පිදීමට උත්සාහ කළ බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා කවුද?

i. කාල් මාක්ස් ය.
ii. ඔගස්ට් කොම්ට් ය.
iii. මැක්ස් වේබර් ය.
iv. ඊ. බී. ටයිලර් ය.

14. ඉංග්‍රීසි ජාතිකයින් ශ්‍රී ලංකාව යටත් කර ගත් වර්ෂය කුමක් ද?

i. 1818
ii. 1948
iii. 1718
iv. 1815

15. සමාජ හා මානව විද්‍යාඥයින් විසින් ලෝකයේ තිබෙන සමාජ ප්‍රධාන වර්ග තුනකට බෙදා දක්වා ඇත. එම වර්ගීකරණයට අයත් නොවන්නේ,

i. ගෝත්‍රික සමාජය යි.
ii. ධනවාදී සමාජය යි.
iii. ගැමි සමාජය යි.
iv. කාර්මික සමාජය යි.

16. වෙසක් දිනය ජාත්‍යන්තර නිවාඩු දිනයක් බවට පත් කිරීමට විශාල වෙහෙසක් දරන ලද්දේ,

i. ආනන්ද කුමාරස්වාමි ය.
ii. ලක්ෂ්මන් කදිරගාමර් ය.
iii. මොහිදීන් බෙග් ය.
iv. මර්සලින් ජයකොඩි ය.

17. පුද්ගල සමාජානුයෝජනය සිදුවන මුල් ම කාරකය වනුයේ,

i. පාසල යි.
ii. පන්සල යි.
iii. පවුල යි.
iv. පොලීසිය යි.

18. සමාජ යුතුකම් සහ අයිතිවාසිකම් පිළිබඳ උගන්වන බෞද්ධ සූත්‍රය වන්නේ,

i. සිඟාලෝවාද සූත්‍රය යි.
ii. මහා මංගල සූත්‍රය යි.
iii. පරාභව සූත්‍රය යි.
iv. කාලාම සූත්‍රය යි.

19. සාමණේර භික්ෂූන් වහන්සේගේ පාලනය සඳහා බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ විනය නීති වූයේ,

i. දසසිල් ය.
ii. උපසම්පදා සිල් ය.
iii. පන්සිල් ය.
iv. සේඛියා ය.

20. අතීතයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ පාලන බලවේගයක් ලෙස ක්‍රියාත්මක වූයේ,

i. පාසල යි.
ii. පන්සල යි.
iii. අධිකරණය යි.
iv. පොලීසිය යි.

21. සමාජ චාරිත්‍ර වාරිත්‍රවලින් නීතිරීති පද්ධතිය වෙනස්වීමේ ප්‍රධානත ම ලක්ෂණය වනුයේ,

i. පිළිපැදීමට අපහසුවීම යි.
ii. ලේඛනගත ව පැවතීම යි.
iii. පහසුවෙන් ඉගනීමට හැකිවීම යි.
iv. දඬුවමකට යටත්වීම යි.

22. නීතිය උල්ලංඝණය කිරීම,

i. ඇගයීමට හේතු වේ.
ii. සාමයට හේතු වේ.
iii. දණ්ඩනයට හේතු වේ.
iv. පිළිගැනීමට හේතු වේ.

23. නීතියේ පවතින ''සාමාන්‍යතාව'' යනු,

i. සැමට සමානව ක්‍රියාත්මක වීම යි.
ii. පෞද්ගලිකව ක්‍රියාත්මක වීම යි.
iii. අනිවාර්යයෙන් පිළිපැදිය යුතු යන්න යි.
iv. වරද නිවැරදි කරගැනීම යි.

24. සමාජ පාලනයේ ප්‍රධාන උපක්‍රමයක් ලෙස චාරිත්‍ර වාරිත්‍රවල ඇති වැදගත්කම පෙන්වාදුන් සමාජ විද්‍යාඥයා වන්නේ,

i. ඔගස්ට් කොම්ට් ය.
ii. ෆර්ඩිනන් ටෝනිස් ය.
iii. හර්බට් ස්පෙන්සර් ය.
iv. ඊ. බී. ටයිලර් ය.

25. ප්‍රකට සමාජ විද්‍යාඥයකු වූ ''සම්නර්'' පෙන්වා දෙන සමාජ පාලක කොටස් ද්විත්වය නම්,

i. සිරිත් හා විරිත් ය.
ii. ප්‍රාථමික චර්යා හා නව චර්යා ය.
iii. ජනචර්යා හා ගණ චර්යා ය.
iv. අධිකරණ හා පොලීසිය ය.

26. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සංගමය ආරම්භ වූ වර්ෂය කුමක් ද?

i. 1880 ii. 1956 iii. 1902 iv. 1979

27. ලිච්ඡවී රජ දරුවන් රාජ්‍ය පාලනයේ දී අනුගමනය කළ සමගිව රැස්වීම, සාමූහිකව කටයුතු කිරීම යන කරුණු ඇතුළත් වන්නේ,

i. දසරාජ ධර්මවලට අයත් ය. ii. සප්ත අපරිහානිය ධර්මවලට ය.

iii. සතර සංග්‍රහ වස්තුවලට ය. iv. ත්‍රිවිධ පුණ්‍යක්‍රියාවලට අයත් ය.

28. ''යහපත් දිවි පැවැත්ම'' අර්ථවත් කරනු ලබන ආර්ය අෂ්ටාංගික මාර්ග අංගය වනුයේ,

i. සම්මා සති වේ. ii. සම්මා සමාධි වේ.

iii. සම්මා සංකප්ප වේ. iv. සම්මා ආජීව වේ.

29. ''අන් අයෙකුට බාධාවක් නොවනසේ කටයුතු කිරීම'' යන්න සතර සංග්‍රහ වස්තු අතර සඳහන් වන්නේ,

i. අර්ථ චර්යාව ලෙස යි. ii. සමානාත්මතාව ලෙස යි.

iii. දානය ලෙස යි. iv. ප්‍රිය වචනය ලෙස යි.

30. උට්ඨාන වීර්යය නැති බව, නිදන සුලු බව, අසත් පුරුෂයන්ට ප්‍රිය වීම ආදී කරුණු නිසා පුද්ගලයා පිරිහීමට පත්වන බව සඳහන් සූත්‍ර දේශනාව වන්නේ,

i. සිඟාලෝවාද සූත්‍රය යි. ii. කරණීය මෙත්ත සූත්‍රය යි.

iii. පරාභව සූත්‍රය යි. iv. මහා මංගල සූත්‍රය යි.

31. සමාජ ප්‍රශ්නයක් හඳුනා ගත හැකි ලක්ෂණයක් වන්නේ,

i. එක් පුද්ගලයකුට දැඩි බලපෑම් සිදු වීම යි. ii. කිහිපදෙනෙකුට පමණක් බලපෑම් සිදුවීමයි.

iii. පවුල් සංස්ථාවට බලපෑම් සිදු වීම යි. iv. සමාජයේ වැඩි දෙනෙකුට අයහපත් ලෙස බලපෑම් සිදුවීම යි.

32. සමාජ ප්‍රශ්නයක් ලෙස සැලකිය නොහැක්කේ මින් කුමක් ද?

i. අපරාධ ii. ස්වභාවික මරණ

iii. අපචාර iv. සියදිවි නසාගැනීම

33. ''ආගමික ජීවිතයේ මූලික හරය'' යන කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

i. මාර්ටින් ලූතර් විසින් ය. ii. එමිල් ඩුර්කයිම් විසින් ය.

iii. රැග්නාර් නර්ක්ස් විසින් ය. iv. හර්බට් ස්පෙන්සර් විසින් ය.

34. දුගී බව නැති කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන උපාය මාර්ගයක් වන්නේ,

i. සමෘද්ධි ව්‍යාපාරය යි. ii. රක්ෂණාවරණ ලබාදීම යි.

iii. විශ්‍රාම වැටුප් ගෙවීම යි. iv. රෝහල් ඉදිකිරීම යි.

35. ශ්‍රී ලංකාවේ ජනගහනය අතරින් වයස් ගතවූවන් සේ සැලකෙන්නේ වයස අවුරුදු කීය ඉක්ම වූවන් ද?

i. අවුරුදු 60 ii. අවුරුදු 65

iii. අවුරුදු 55 iv. අවුරුදු 70

36. පහත සඳහන් සාධක අතුරින් සමාජ ප්‍රශ්නයක් ඇති වීමට බලපාන හේතු සාධක ඇතුළත් පිළිතුර තෝරන්න.

A - නූගත්කම

B - නීතිරීති පිළිබඳ නොදැනුවත්කම

C - ආර්ථික සහයෝගීතාව

D - මානසික අසහනය

i. A, B හා C

ii. A, C හා D

iii. A, B හා D

iv. B, C හා D

37. සමාජයක ඇති වන විසංවිධානකාරී තත්ත්වය බලපානු ලබන්නේ,

i. පවුල් සංස්ථාවට පමණි.

ii. පුද්ගලයකුට පමණි.

iii. සමස්ත සමාජයට ම ය.

iv. කිහිප දෙනෙකුට පමණි.

38. රජය මගින් දුගීන්ට සහනාධාර සැපයීම, සමාජය තුළ කම්මැලිකම වර්ධනය වීමට හේතු වන බව පෙන්වා දුන් සමාජ විද්‍යාඥයා කවුද?

i. රැග්නාර් නර්ක්ස්

ii. හර්බට් ස්පෙන්සර්

iii. රැල්ෆ් ලින්ටන්

iv. කාල් මාක්ස්

39. බුදු සසුනේ පැවැත්ම සඳහා වඩාත් ම වැදගත් සම්බන්ධතාව වන්නේ,

i. මව්පිය - දූ දරු සබඳතා ය.

ii. ගුරු - සිසු සබඳතා ය.

iii. අඹු - සැමි සබඳතා ය.

iv. ගිහි - පැවිදි සබඳතා ය.

40. ශ්‍රී ලංකා සමාජය බටහිර ජාතීන්ගේ බලපෑමට ලක් වූයේ, 16 වන ශතවර්ෂයේ,

i. පෘතුගීසීන්ගේ පැමිණීමත් සමග ය.

ii. ලන්දේසීන්ගේ පැමිණීමත් සමග ය.

iii. ප්‍රංශ ජාතිකයින්ගේ පැමිණීමත් සමග ය.

iv. ඉංග්‍රීසීන්ගේ පැමිණීමත් සමග ය.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය 2018

## Primary Piriven Year End Tearm Test - 2018

**03 ශ්‍රේණිය/**Grade **03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව **I, II**

**Sociology I, II**

සමාජ විද්‍යාව **II**

**සැලකිය යුතුයි :**

i. **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**

ii. **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

iii. **මෙම කොටසට ලකුණු 60ක් හිමි වේ.**

---

**A** කොටස

01)

i. දහසය වෙනි සියවස තෙක් බටහිර යුරෝපා සමාජයේ පැවති සාම්ප්‍රදායික කිතුණු ආගම පරිවර්තනයකට බඳුන් කළ කතෝලික පූජකවරුන් දෙදෙනා කවුරුන් ද?

ii. දසරාජ ධර්මයෙහි සඳහන් ධර්මිෂ්ඨ පාලකයකු තුළ තිබිය යුතු ධර්මතා දෙකක් සඳහන් කරන්න.

iii. සමාජ විද්‍යාවේ මූලික සංකල්ප දෙකක් සඳහන් කරන්න.

iv. ත්‍රිවිධ ශාසනය නම් කරන්න.

v. මිහිඳු මහරහතන් වහන්සේ සමඟ ලංකාවට වැඩම කළ රහතුන් වහන්සේලා දෙදෙනෙකුගේ නම් ලියන්න.

vi. හින්දු ආගමේ ඉගැන්වෙන ත්‍රිමූර්තිය නම් කරන්න.

vii. දුගී බවේ විෂම චක්‍රයෙහි ඇතුළත් අංග දෙකක් නම් කරන්න.

viii. ශ්‍රී ලංකාවේ වර්තමාන පිරිවෙන් වර්ග තුන මොනවාද?

ix. ශ්‍රී ලංකාවේ පවතින උප සංස්කෘතීන් දෙකක් නම් කරන්න.

x. රොබට් නොක්ස් පෙන්වා දී ඇති පරිදි නුවර යුගයේ මෙරට වැඩසිටි භික්ෂු දෙපිරිස සඳහන් කරන්න.

(ලකුණු 2x10 =20)

**B** කොටස

02)

i. සමාජ විද්‍යාව යනු කුමක් දැයි හැඳින්වීමට නිර්වචනයක් සපයන්න. (ලකුණු 02)

ii. සමාජ විද්‍යාව නැමැති විෂයය බිහිවීම කෙරෙහි බලපෑ ඓතිහාසික සාධක තුන සඳහන් කරන්න. (ලකුණු 03)

iii. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් භික්ෂුන් වහන්සේලාට අත්වන ප්‍රයෝජන දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

03)

i. සමාජ පරිණාමය පිළිබඳ සඳහන් බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. සමාජ පරිණාමය පිළිබඳ අදහස් දැක්වූ සමාජ විද්‍යාඥයින් තිදෙනෙකුගේ නම් ලියන්න. (ලකුණු 03)

iii. පැරණි සමාජවල ලක්ෂණයක් සහ නූතන සමාජවල ලක්ෂණයක් බැගින් ගෙන එම සමාජවල ස්වභාවය පිළිබඳ පැහැදිලි කරන්න.
(ලකුණු 05)

04)

i. සංස්කෘතිකය පිළිබඳ නිර්වචනයක් ගෙනහැර දක්වන්න. (ලකුණු 02)

ii. සමාජානුයෝජනය මගින් කුඩා කාලයේදී ම පවරා දෙන සංස්කෘතික වටිනාකම් තුනක් සඳහන් කරන්න.
(ලකුණු 03)

iii. මහින්දාගමනයෙන් මෙරටට ලැබුණු සංස්කෘතික දායාද දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

05)

i. පැරණි ලාංකික සමාජය තුළ දක්නට ලැබුණු අවිධිමත් සමාජ පාලන ක්‍රම දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)

ii. පැවිදි සමාජය මගින් ගිහි සමාජය උදෙසා ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. සමාජ පාලනයෙහිලා චාරිත්‍ර වාරිත්‍රවල ඇති වැදගත්කම උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

06)

i. සමාජ ප්‍රශ්න විසඳාගැනීම සඳහා උපයෝගී කරගත හැකි බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. දුගී බව නිර්වචනය කළ හැකි මාර්ග තුන සඳහන් කරන්න. (ලකුණු 03)

iii. ශ්‍රී ලංකාවේ වයස්ගතභාවය සමාජ ප්‍රශ්නයක් නොවන ආකාරයෙන් විසඳා ගැනීමට රජය මගින් ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07)

i. සමාජයක් යනු කුමක් ද යන්නට නිර්වචනයක් සපයන්න. (ලකුණු 02)

ii. බුද්ධ ශාසනයේ පැවැත්ම තහවුරු කෙරෙන බෞද්ධ සමාජ ව්‍යුහය සඳහන් කරන්න. (ලකුණු 03)

iii. සමාජ යහපත සඳහා වර්තමාන භික්ෂුවගෙන් සිදුවිය යුතු කාර්යභාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

08)

i. සමාජානුයෝජනය යනු කුමක් දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)

ii. සමාජ අවශ්‍යතාව ඉටු කිරීම සඳහා ගොඩනැගී ඇති සමාජ ආයතන තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

iii. සමාජ සම්බන්ධතා වර්ධනයෙහිලා පංචශීල ප්‍රතිපදාවේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.
(ලකුණු05)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019

## Primary Piriven Year End Tearm Test - 2019

**03 ශ්‍රේණිය/Grade 03**

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

කාලය : පැය තුන යි
**Time : Three Hours**

### සමාජ විද්‍යාව I

සැලකිය යුතුයි :

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමිවේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (i), (ii), (iii), (iv) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. සමාජ විද්‍යාවේ පියා හැටියට හඳුන්වනු ලබන්නේ කවුරුන් ද ?

i. හර්බට් ස්පෙන්සර් ii. ඔගස්ට් කොම්ට්
iii. කාල් මාර්ක්ස් iv. එමිල් ඩූර්කයිම්

02. සමාජ විද්‍යාව බිහි වූයේ කිනම් රටක් පදනම් කරගෙන ද ?

i. එංගලන්තය පදනම් කරගෙන ii. රුසියාව පදනම් කරගෙන
iii. ප්‍රංශය පදනම් කරගෙන iv. ජර්මනිය පදනම් කරගෙන

03. සමාජ විද්‍යාව බිහිවීම සඳහා බලපෑ ඓතිහාසික හේතුවක් වනුයේ,

i. රුසියා අර්බුදය යි. ii. ජාතික පුනරුදය යි.
iii. කාර්මික විප්ලවය යි. iv. සංක්‍රමණික අර්බුදය යි.

04. පොතෙස්තන්ත නමින් නිකායක් හඳුන්වා දෙනු ලැබුයේ,

i. හර්බට් ස්පෙන්සර් සහ ඔගස්ට් කොම්ට් ය.

ii. මාර්ටින් ලූතර් සහ ජෝන් කැල්වින් ය.

iii. මාර්ටින් ලූතර් කිං සහ කාල් මාක්ස් ය.

iv. ජොන් කැල්වින් සහ හර්බට් ස්පෙන්සර් ය.

05. "ආගමික ජීවිතයේ මූලික ස්වරූපය "යන කෘතිය රචනා කරණ ලද්දේ,

i. හර්බට් ස්පෙන්සර් විසිනි ii. මැක්ස් වෙබර් විසිනි
iii. කාල් මාක්ස් විසිනි iv. එමිල් ඩූර්කයිම විසිනි

06. "යථානුභූත දර්ශනය" ග්‍රන්ථය රචනා කරණ ලද්දේ,

i. කාල් මාක්ස් ය. ii. මැක්ස් වෙබර් ය.

iii. ඔගස් කොම්ට් ය. iv. හර්බට් ස්පෙන්සර් ය.

07. සමාජ ව්‍යුහය හා ක්‍රියාකාරීත්වය සත්ව ශරීරයට සමාන කළේ,

i. මැක්ස් වෙබර් ය. ii. රොබට් නොක්ස් ය.

iii. හර්බට් ස්පෙන්සර් ය. iv. ඔගස්ට් කොම්ට් ය.

08. මුල් යුගයේ දී පාලි භාෂාවෙන් "පරිවේන" නමින් හඳුන්වා ඇත්තේ

i. පන්සල යි. ii. පාසල යි.

iii. පිරිවෙණ යි. iv. භික්ෂූන් වහන්සේලා වැඩ සිටි කුටිය යි.

09. කෝට්ටේ යුගයේ ආරම්භ වූ පිරිවෙනක් වන්නේ,

i. පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන යි. ii. මහා විහාරීය මහා පිරිවෙන යි.

iii. සංඝ බෝධි මහා පිරිවෙන යි. iv. පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන යි.

10. වැලිවිට අසරණ සරණ සංඝරාජ මා හිමිපාණන් වහන්සේ,

i. අන්ත අසරණ වූ භික්ෂුවකි.

ii. ජාතිය ගොඩනැංවීමට කැප වූ භික්ෂුවකි.

iii. වැළලී ගිය ධර්ම අධ්‍යාපනයත් සඟ සසුනත් ගොඩනැගූ භික්ෂුවකි.

iv. විජාතීය බලවේග හමුවේ නොසැලී ඔවුන් සමග සටන් කළ භික්ෂුවකි.

11. විද්‍යෝදය පිරිවෙන මූලික කරගෙන ආරම්භ වූ විශ්වවිද්‍යාලය වනුයේ,

i. රුහුණු විශ්වවිද්‍යාලය යි. ii. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය යි.

iii. කැලණිය විශ්වවිද්‍යාලය යි. iv. කොළඹ විශ්වවිද්‍යාලයයි.

12. රත්මලානේ ශ්‍රී ධම්මාලෝක මාහිමියන් ආරම්භ කරන ලද පිරිවෙන කුමක් ද ?

i. තොටගමුවේ විජයබා පිරිවෙන ii. වීදාගම සිරිඝනානන්ද පිරිවෙන

iii. විද්‍යාලංකාර පිරිවෙන iv. පැපිලියානේ සුනෙත්‍රාදේවී පිරිවෙන

13. ප්‍රාචීන භාෂෝපකාර සංගමය ආරම්භ කළ වර්ෂය කුමක් ද?

i. 1913 ii. 1902 iii. 1983 iv. 1934

14. බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස විරුදාවලිය ලබනුයේ,

i. ඊ. බී. ටයිලර් ය.

ii. රැල්ෆ් ලින්ටන් ය.

iii. හර්බට් ස්පෙන්සර් ය.

iv. රේමන්ඩ් විලියම් ය.

15. කුඩා දරුවාගේ සමාජානුයෝජනයට දායක වන මූලික ආයතනය කුමක් ද ?

i. පවුල

ii. පාසල

iii. පංසල

iv. මිතුරු කණ්ඩායම

16. ශ්‍රී ලංකාව බෞද්ධ රාජ්‍යයක් බවට පත් වූයේ මින් කවර කරුණක් හේතුකොටගෙන ද?

i. ඉංග්‍රීසි පාලනයෙන් මිදුනු නිසා ය.

ii. විජය රජුගේ පැමිණීම නිසා ය.

iii. මෙරට පැරණි පාලකයින් නිසා ය.

iv. මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීම නිසා ය.

17. ත්‍රිමූර්ති සංකල්පය ඉගැන්වෙන ආගම වන්නේ,

i. බෞද්ධ ආගම යි.

ii. කතෝලික ආගම යි.

iii. හින්දු ආගම යි.

iv. ඉස්ලාම් ආගම යි.

18. හින්දු ආගමික නොවන උත්සවයක් ඇතුළත් ඛාණ්ඩය වන්නේ,

i. තෛපොංගල් උත්සවය, මහා ශිවරාත්‍රී උත්සවය, දීපාවලී උත්සවය

ii. මහා ශිව රාත්‍රිය, වෙසක් උත්සවය, දීපාවලී උත්සවය

iii. දීපාවලී උත්සවය, මහා ශිව රාත්‍රිය, තෛපොංගල් උත්සවය

iv. හොලි උත්සවය, දීපාවලී උත්සවය, වෙල් උත්සවය

19. ඉස්ලාම් භක්තිකයන් දිනකට සලාතය (දෙවියන් ඇදහීම) කී වරක් කළ යුතුද ?

i. දිනකට 3 වතාවයි.

ii. දිනකට 2 වතාවයි.

iii. දිනකට 4 වතාවයි.

iv. දිනකට 5 වතාවයි.

20. පෘතුග්‍රීසි ජාතිකයන් ශ්‍රී ලංකාවට පැමිණියේ,

i. 1506දී ය.

ii. 1505දී ය.

iii. 1509දී ය.

iv. 1.

21. දස පනත ඉගැන්වෙන ආගම කුමක් ද ?

i. ක්‍රිස්තියානි ආගම

ii. කතෝලික ආගම

iii. බෞද්ධ ආගම

iv. ඉස්ලාම් ආගම

22. ආගම මගින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්ය වන්නේ,

i. මිනිසුන් අපාගත වීම වලකාලයි. ii. යහ මගෙහි යොදවයි.

iii. සීලයෙහි පිහිටුවයි. iv. නිසි මාර්ගය පෙන්වා සුගතියට ළඟා කරවීම යි.

23. සමාජ සාරධර්මයන්හි පැවැත්ම උදෙසා සාමාජිකයා විසින් පංචසීලය,

i. ආරක්‍ෂා කළ යුතු ය. ii. පිළිපැදිය යුතු ය.

iii. අනුගමනය කළ යුතු ය. iv. අවබෝධ කර ගත යුතු ය.

24. සිඟාලෝවාද සූත්‍රයේ පෙන්වා දී ඇති සදිසා නමස්කාරයෙන් අර්ථවත් වන්නේ,

i. මෙලොව පරලොව සුගතිය ලඟා කර ගැනීම යි.

ii. කුසල් අකුසල් තෝරා බේරා ගෙන කටයුතු කිරීම යි.

iii. මෙලොව පරලොව සතුටු විය හැකි ක්‍රියාකාරකම් මුදුන්පත් කර ගැනීම යි.

iv. යුතුකම් සහ වගකීම මත අන්‍යොන්‍ය සබැඳියාව වර්ධනය කර ගැනීම යි.

25. සතර සංග්‍රහ වස්තුවලට අයත් නොවන අංගය සහිත වරණය තෝරන්න.

i. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව

ii. දානය, ප්‍රිය වචනය, සමානාත්මතාව, අර්ථ චර්යාව

iii. දානය, ප්‍රිය වචනය, සීලය, සමානාත්මතාව

iv. දානය, අර්ථ චර්යාව, සමානාත්මතාව, ප්‍රිය වචනය

26. භික්‍ෂුන් වහන්සේ සැම විට ම දායකයා කෙරෙහි ඇති කර ගත යුත්තේ,

i. අනුකම්පා සහගත විය යුතුය

ii. දයා හරිත විය යුතුය

iii. නිසි මග පෙන්විය යුතුය

iv. තම සේවකයා ලෙස සැළකිය යුතු ය

27. රාජ්‍ය පාලනය පිළිබඳ ව විස්තර වෙන සූත්‍රය වෙනුයේ,

i. පරාභව සූත්‍රය යි.

ii. රතන සූත්‍රය යි.

iii. චක්කවත්ති සීහනාද සූත්‍රය යි.

iv. කලාම සූත්‍රය යි.

28. සමාජ ගැටලුවක ලක්ෂණයක් නොවන්නේ මින් කුමක් ද?

i. සමාජය තුළින් ම උපත ලැබීම　　ii. මුළු සමාජයට ම බලපෑම

iii. සමාජයට යහපත් ලෙස බලපෑම　　iv. එය විසඳාලිය යුතුය යන අවශ්‍යතාව සාමාජිකයින් තුළ පැවතීම

29. වෙසක් පොහොය දිනය ජාත්‍යන්තර නිවාඩු දිනයක් බවට පත් කිරීමේ මහඟු කාර්යයට මූලිකත්වය ගෙන ක්‍රියා කරන ලද්දේ,

i. මර්සලින් ජයකොඩි පියතුමා

ii. ලක්ෂ්මන් කදිරගාමර් මහතා

iii. ආනන්ද කුමාරස්වාමි මහතා

iv. ආනන්ද සමරකෝන් මහතා

30. මහා බෝධි සංගමය ආරම්භ කිරීමට මූලික වූයේ කවුද ?

i. රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමිපාණෝ

ii. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ

iii. අනගාරික ධර්මපාල තුමා

iv. හෙන්රි ස්ටීල් ඔල්කට් තුමා

අංක 31 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට A, B. C. D යනුවෙන් දෙන ලද පිළිතුරු හතර අතුරෙන් දෙකක් පමණක් නිවැරදි ය. එම නිවැරදි පිළිතුරු දෙක ඇතුළත් අංකය යටින් ඉරක් අඳින්න.

31. වයස් ගත භාවය සමාජ ගැටලුවකි. එයට පිළියම ලෙස යෙදිය හැක්කේ,

A : වයස්ගත වූවන් මරා දැමීම

B : වයස්ගත වූවන් රටින් නෙරපා හැරීම

C : වයස්ගත වූවන් රැක බලා ගැනීම

D : වයස්ගත වූවන් පෝෂණය කිරීම

i. A හා C ය.　　ii. B හා D ය.

iii. C හා D ය.　　iv. A හා D ය.

32. ශ්‍රී ලංකාව තුළ පවතින දුගීභාවය නැති කිරීමට ගත හැකි ඵලදායි ක්‍රියා මාර්ග ඇතුළත් පිළිතුර කුමක් ද?

A : දුප්පත් ජනතාවට මුදල් ලබා දීම

B : ආදායම් මාර්ග සලසා දීම

C : වියලි ආහාර ලබා දීම සහ නිවාස ඉදි කිරීම

D : රැකීරක්ෂා ඇති කරලීම

i. A හා B　　ii. B හා D

iii. B හා C　　iv. C හා A

33. සෑම ආගමකට පොදු ලක්ෂණ ඇතුළත් පිළිතුර කුමක් ද?

A : ආගමික සංවිධාන

B : ආගමික පුදපූජා

C : ආගමික යාඥා

D : ආගමික විශ්වාස

i. A හා B  ii. B හා C

iii. B හා D  iv. A හා D

34. භික්ෂූන් වහන්සේ තම <u>දායකයන්ට නොකළ යුතු යැයි</u> දේශනා කරුණු ලබන්නේ,

A : පර පණ නැසීම

B : භාවනා කිරීම

C : අන්‍යයන්ට උදව් කිරීම

D : අනිකුත් ආගම්වලට ගැරහීම

i. A හා C ය.  ii. B හා D ය.

iii. B හා C ය.  iv. A හා D ය.

35. සංස්කෘතිය යන්න හඳුන්වා දීමට මුල් වූ මානව විද්‍යාඥයින් වන්නේ.

A : ඔගස්ට් කොමට්

B : ඊ.බී. ටයිලර්

C : එමිල් ඩුර්කයිම්

D : රැල්ෆ් ලින්ටන්

i. A හා C ය.  ii. B හා D ය.

iii. A හා D ය.  iv. B හා C ය.

36. මහින්දාගමනයෙන් පසු ලංකාවට ලැබුන දායද වනුයේ,

A : බෞද්ධාගමික පුනරුදය ඇති විම

B : අනිකුත් ආගම් පළවා හැරීම

C : ලංකාවේ යක්ෂයින් දමනය කිරීම

D : කුලය මත පදනම් වූ ශිල්පීය ශ්‍රේණි 18ක් පැමිණීම

i. A හා D ය.  ii. A හා C ය.

iii. C හා D ය.  iv. B හා D ය.

37. ශ්‍රී ලංකාවේ අපනයන භෝග ලෙස හඳුන්වනු ලබන්නේ,

A : කුරුඳු

B : සහල්

C : ගම්මිරිස්

D : බඩ ඉරිඟු

i. A හා D ය.

ii. B හා C ය.

iii. A හා C ය.

iv. C හා D ය.

38. පෘතුග්‍රීසින් පෙරදිගට පැමිණීමට හේතු වූ ප්‍රධාන සාධක සේ සැලකෙනුයේ,

A : ක්‍රිස්තියානි ආගම පැතිර වීම

B : කුළු බඩු මිළ දී ගැනීම

C : වැරදි කරුවන්ට දඩුවම් දීම

D : නීති පද්ධතිය ඇති කරලීම

i. A හා C ය.

ii. B හා D ය.

iii. A හා B ය.

iv. C හා D ය.

39. බුදුරජාණන් වහන්සේ දේශනා කළ පරිදි සිව්වණක් පිරිස වන්නේ,

A : භික්ෂු, භික්ෂුණී

B : ශ්‍රාවක, ශ්‍රාවිකා

C : උපාසක, උපාසිකා

D : සාමණේර සහ උපසම්පදා භික්ෂුව

i. A හා C ය.

ii. B හා D ය.

iii. C හා D ය.

iv. A හා D ය.

40. සාමණේර භික්ෂුන් වහන්සේ නමක් විසින් ආරක්ෂා කළ යුතු සීලය වන්නේ,

i. පංච සීලය යි.

ii. සාමණේර දස සීලය යි.

iii. ආජීව අෂ්ඨමක සීලය යි.

iv. සතර සංවර සීලය යි.

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019**<br>Primary Piriven Year End Term Test - 2019<br>**03 ශ්‍රේණිය/Grade 03**<br>සමාජ විද්‍යාව I, II<br>sociology Science I, II |

සමාජ විද්‍යාව II

සැලකිය යුතුයි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01.

i සමාජය විසංවිධානය වීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න.

ii. සමාජ විද්‍යා විෂය සංවර්ධනයට දායක වූ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න.

iii. සමාජ විද්‍යා විෂය බිහි වීමට බලපෑ ඓතිහාසික සාධක දෙකක් නම් කරන්න.

iv. සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා ක්‍රමවේද දෙකක් ලියන්න.

v අනුරාධපුර යුගයේ දී ආරම්භ වූ පිරිවෙන් දෙකක් නම් කරන්න.

vi ශ්‍රී ලංකාවේ ජීවත්වන ප්‍රධාන ජන වර්ග දෙකක් නම් කරන්න.

vii සමාජනු යෝජනය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?.

viii ඉස්ලාම් භක්තිකයන්ගේ ප්‍රධාන ඉගැන්වීම් දෙකක් නම් කරන්න.

ix සමාජ සම්බන්ධතා පිළිබඳ ඉගැන්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් ලියන්න.

x ගිහි සමාජය විසින් භික්ෂු සංඝයා විෂයෙහි ඉටු කළ යුතු සේවාවන් දෙකක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10)

## II කොටස

02

i "සමාජ විද්‍යාව" යන්න අර්ථකථනය කරන්න.

ii සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.

iii "සමාජවිද්‍යාවේ" විෂය ක්ෂේත්‍රයට අයත් සංකල්ප දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

03

i  සමාජ පරිණාමය යනු කුමක් ද ?

ii  සමාජ පරිණාමය කෙරෙහි බලපාන හේතු සාධක තුනක් ලියන්න.

iii  බුදුදහමෙහි "පරිණාමය" යන්න විස්තර කරණ අයුරු පහදන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04

i  පිරිවෙන් වර්ග කීය ද? ඒවා මොනවා ද?

ii  විහාරස්ථානය මගින් ඉටු කරන සේවාවන් තුනක් සඳහන් කරන්න.

iii  "පිරිවෙන යනු තවත් එක් අධ්‍යාපන ආයතනයක් පමණක් නොවේ" ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05

i  "සංස්කෘතිය" යන්නට නිර්වචනයක් ලියන්න.

ii  සමාජය සහ සංස්කෘතිය අතර ඇති සබැඳියාව කෙටියෙන් විස්තර කරන්න.

iii  මහින්දාගමනයෙන් පසු ලාංකීය සමාජයෙහි ඇති වූ සංස්කෘතික විපර්යාසය පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06

i  රටක් පාලනය කිරීම සඳහා උපයෝගීකර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් සඳහන් කරන්න.

ii  භික්ෂූන් වහන්සේගේ කාර්ය භාරය කෙටියෙන් පහදන්න.

iii  මනා සමාජ සම්බන්ධතා පැවැත්වීමට නම් බුදු දහමේ ඉගැන්වෙන සූත්‍ර ධර්ම ඉවහල් කර ගත යුතු ය. ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07

i සමාජ පාලනයට අදාළ කරුණු දක්වෙන බෞද්ධ සූත්‍ර දෙකක් නම් කරන්න.

ii විධිමත් සහ අවිධිමත් සමාජ පාලනය යනු කුමක් ද ?

iii සමාජ පාලනය නිසි අයුරින් පවත්වා ගත හැක්කේ නම් අපරාධ අවම කර ගත හැකි ය. බුදු දහමේ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

08

i ලංකාව ආක්‍රමණය කළ බටහිර ජාතීන් දෙකක් නම් කරන්න.

ii බටහිර ජාතීන් ලංකාවට පැමිණීමෙන් පසු මුදුන්පත් කර ගැනීමට අපේක්ෂා කරන ලද අරමුණු තුනක් සඳහන් කරන්න.

iii බටහිර ජාතීන්ගේ ආගමනය හේතුවෙන් ලංකා සමාජයෙහි ඇති වූ සමාජ වෙනස කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

## Primary Piriven Year End Test - 2020

### 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II — කාලය : පැය තුන යි

sociology Science I, II — Time : Three Hours

**සමාජ විද්‍යාව I**

සැලකිය යුතු යි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම කොටසට ලකුණු 40ක් හිමි වේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට අදාළ කවය තුළ (X) ලකුණ යොදන්න.

iv. එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද, සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයක් ලෙස බිහි වුයේ කිනම් සමාජයක් පදනම් කරගෙන ද?

1. ආසියානු සමාජය
2. මැදපෙරදිග සමාජය
3. අප්‍රිකානු සමාජය
4. බටහිර සමාජය

02. සමාජ විද්‍යාව යන පදය මුලින් ම භාවිතයට පැමිණි සියවස වන්නේ,

1. 17 වන සියවස යි.
2. 18 වන සියවස යි.
3. 20 වන සියවස යි.
4. 19 වන සියවස යි.

03. සමාජ විද්‍යාවේ පියා ලෙස විරුදාවලිය ලැබුවේ,

1. ඔගස්ට් කොම්ට් ය.
2. හර්බට් ස්පෙන්සර් ය.
3. කාල් මාක්ස් ය.
4. එමිල් ඩුවර්කයම් ය.

04. ඔගස්ට් කොම්ට් කුමන ජාතිකයෙක් ද?

1. රුසියානු ජාතිකයෙක්.
2. ජර්මානු ජාතිකයෙක්.
3. ප්‍රංශ ජාතිකයෙක්.
4. ඇමරිකානු ජාතිකයෙක්.

05. පැරණි සමාජයේ ලක්ෂණයක් වන්නේ,

1. ජන සංඛ්‍යාව සීමිත වීම යි.
2. සිරිතට වඩා නීතියට වැඩි තැනක් ලැබීම යි.
3. දියුණු තාක්‍ෂණයක් යොදා ගැනීම යි.
4. විවෘත ආර්ථිකයක් පැවතීම යි.

06. වර්ෂ 1873 දී මරදානේ විද්‍යෝදය පිරිවෙණ ආරම්භ කළ නායක හිමියන් වන්නේ,

1. වැලිවිට සරණංකර හිමි ය.
2. රත්මලානේ ධර්මාලෝක හිමි ය.
3. වලානේ සිද්ධාර්ථ හිමි ය.
4. හික්කඩුවේ සුමංගල හිමි ය.

07. පුද්ගල සමාජානුයෝජනය සිදුවන මුල්ම සමාජනුයෝජන කාරකය කුමක් ද?

1. පාසල ය. 2. පන්සල ය.

3. පවුල ය. 4. පොලිසිය ය.

08. වෙනස්වීම හෙවත් විපරිණාමය බුදු දහමේ විග්‍රහ වන්නේ කුමන සංකල්ප යටතේ ද?

1. සතර අගති 2. අනිත්‍යය

3. අටලෝ දහම 4. සතර සංග්‍රහ වස්තු

09. නූතන යුගයට අයත් පැරණිතම පිරිවෙණ කුමක් ද?

1. රත්මලානේ පරමධම්මචෛතිය පිරිවෙණ 2. කැරගල පද්මාවතී පිරිවෙණ

3. නියමකන්දේ පිරිවෙණ 4. විද්‍යාලංකාර පිරිවෙණ

10. සමාජ පරිණාමය සඳහා බලපානු ලබන මූලික හේතුව පුද්ගලයා තුළ පවතින,

1. ගතික ස්වභාවය යි. 2. සංකීර්ණ ස්වභාවය යි.

3. අනාත්ම ස්වභාවය යි. 4. ස්ථිතික ස්වභාවය යි.

11. සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළ විෂයක් වන්නේ,

1. භෞතික විද්‍යාව යි. 2. ජීව විද්‍යාව යි.

3. දේශපාලන විද්‍යාව යි. 4. තාරකා විද්‍යාව යි.

12. දේවවාදී සංකල්පය උපත ලැබූයේ,

1. ප්‍රාථමික සමාජය තුළ ය . 2. නූතන සමාජය තුළ ය.

3. ප්‍රංශ සමාජය තුළ ය. 4. ආසියානු සමාජය තුළ ය.

13. ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ ධනපතියා විසින් නිර්ධනයන් පීඩනයට ලක් කරන බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා වන්නේ,

1. එමිල් ඩුර්කයිම් ය. 2. කාල් මාක්ස් ය.

3. හර්බට් ස්පෙන්සර් ය. 4. ඕගස්ට් කොම්ට් ය.

14. පැරණි සමාජය තුළ ඉස්මතු වී තිබූ ප්‍රධාන ගුණය නම්,

1. ප්‍රජාතාන්ත්‍රික බව යි. 2. ආරෝපිත තත්ත්වය යි.

3. කාර්මිකත්වය යි. 4. සාධිත තත්ත්වය යි.

15. සංස්කෘතිය යන්නට නූතන සමාජ විද්‍යාඥයින් දක්වන පර්යාය පදයක් වන්නේ,

1. සමාජ වෙනස් වීම යි. 2. සමාජ උරුමය යි.

3. සමාජ චර්යාව යි. 4. සමාජ චාරිත්‍ර වාරිත්‍ර යි.

16. ඉංග්‍රීසී ජාතිකයින් ශ්‍රී ලංකාව යටත් කර ගත් වර්ෂය කුමක් ද?

1. ක්‍රි.ව. 1818
2. ක්‍රි.ව. 1948
3. ක්‍රි.ව. 1718
4. ක්‍රි.ව. 1815

17. සමාජ හා මානව විද්‍යාඥයින් විසින් ලෝකයේ තිබෙන සමාජ ප්‍රධාන වර්ග තුනකට බෙදා දක්වා ඇත. එම වර්ගීකරණයට අයත් **නොවන්නේ,**

1. ගෝත්‍රික සමාජය යි.
2. ධනවාදි සමාජය යි.
3. ගැමි සමාජය යි.
4. කාර්මික සමාජය යි.

18. නූතන සමාජ ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

1. ජන සංඛ්‍යාව අඩුවීම.
2. සරල තාක්ෂණයක් යොදා ගැනීම.
3. අධ්‍යාපනය අනිවාර්ය වී උසස් අධ්‍යාපනයක් ලැබීම.
4. සිරිත් විරිත් රැකගැනීමට වැඩි උනන්දුවක් තිබීම.

19. '' උට්ඨාන විරියය නැති බව, නිදන සුලු බව, අසත් පුරුෂයන්ට ප්‍රිය කිරීම පුද්ගල දියුණුවට බාධාවකි'' මේ බව සඳහන් බෞද්ධ සූත්‍රය වන්නේ,

1. වසල සූත්‍රය යි.
2. සිගාලෝවාද සූත්‍රය යි.
3. පරාභව සූත්‍රය යි.
4. කූටදන්ත සූත්‍රය යි.

20. '' මිනිසා පරපුරෙන් පරපුරට දායාදයක් වශයෙන් ගෙනයන ජීවන රටා සමුදාය සංස්කෘතිය යි '' මේ ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ,

1. රැල්ෆ් ලින්ටන් ය.
2. ඊ. බී. ටයිලර් ය.
3. රේමන්ඩ් ෆර්ත් ය.
4. රෙමන්ඩ් විලියම්ස් ය.

21. භික්ෂූන් වහන්සේලාගේ සමාජ කාර්යය පාලනය උදෙසා බුදුරදුන් විසින් පනවන ලද සමූහයක් වූයේ,

1. දසසිල් ය.
2. තුදුස්වත් ය.
3. පන්සිල් ය.
4. සේඛියා ය.

22. අතීතයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ පාලන බලවේගය ලෙස ක්‍රියාත්මක වූයේ

1. පාසල යි.
2. පන්සල යි.
3. අධිකරණය යි.
4. පොලිසිය යි.

23. ලෝකයේ පැරණිතම ආගම වන්නේ,

1. බෞද්ධ ආගම යි.
2. කතෝලික ආගම යි.
3. රෙපරමාදු ආගම යි.
4. හින්දු ආගම යි.

24. ධර්ම විජය ප්‍රතිපත්තිය යටතේ බුදුදහම වෙනත් රටවල ප්‍රචාරය කිරීමට අනුග්‍රහය දැක්වූ රජතුමා වන්නේ,

1. අශෝක රජු ය.
2. උදේනි රජු ය.
3. අජාසත්ත රජු ය.
4. බිම්බිසාර රජු ය.

25. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ මෙරටට වැඩම කරන ලද්දේ,

1. සංඝමිත්තා තෙරණිය විසිනි.
2. හේමමාලා සහ දන්ත කුමරු විසිනි.
3. අරිට්ඨ කුමරු ඇතුළු පිරිස විසිනි.
4. මිහිඳු මහා රහතන් වහන්සේ විසිනි.

26. ''පන්සලේ පියතුමා '' ලෙස විරුදාවලිය ලද කතෝලික පූජකවරයා වන්නේ,

1. අර්නස්ට් පෝරුතොට පියතුමා ය.
2. මැල්කම් රංජිත් පියතුමා ය.
3. මර්සලින් ජයකොඩි පියතුමා ය.
4. ජෝන් කැල්වින් පියතුමා ය.

27. ලෝකයේ වැඩි ම අනුගාමිකයන් සිටින ආගම වන්නේ,

1. ක්‍රිස්තියානි ආගම ය.
2. හින්දු ආගම ය.
3. ඉස්ලාම් ආගම ය.
4. බෞද්ධ ආගම ය.

28. කෝට්ටේ යුගයට අයත් **නොවන** පිරිවෙණක් වන්නේ,

1. කැරගල පද්මාවති පිරිවෙණ
2. පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙණ
3. විදාගම සිරි සනානන්ද පිරිවෙණ
4. පැල්මඩුල්ල පූරාණ විහාර පිරිවෙණ

29. 16 වන සියවසේ දී කිතුනු ආගමට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දීමට මුල් වූයේ,

1. මැක්ස් වෙබර් ය.
2. කාල් මාක්ස් ය.
3. මාර්ටින් ලූතර් ය.
4. රේමන් විලියම්ස් ය.

30. පැරණි ලාංකික සමාජයේ සාධාරණ ලෙස ශ්‍රමය හුවමාරු කර ගැනීම සඳහා පැවති ක්‍රමය හැඳින්වූයේ,

1. අත්තම් ක්‍රමය ලෙස ය.
2. රාජකාරි ක්‍රමය ලෙස ය.
3. ශ්‍රම සංචලතාව ලෙස ය.
4. අධ්‍යාත්මික සම්බන්ධතා ලෙස ය.

31. බුදුරජාණන් වහන්සේ ප්‍රථම වරට ලක්දිවට වැඩම කළ ස්ථානය වන්නේ,

1. කැලණිය යි.
2. නාගදීපය යි.
3. මහියංගණය යි.
4. අනුරාධපුරය යි.

32. අනුරාධපුරයේ පිහිටා ඇති රුවන්වැලි මහා සෑය නිර්මාණය කළේ,

1. කාවන්තිස්ස මහ රජතුමා ය. 2. මහසෙන් රජතුමා ය.

3. වසභ රජතුමා ය. 4. දුටුගැමුණු රජතුමා ය.

33. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය ලෙස නම් කර ඇත්තේ,

1. නිල් මහනෙල් මල ය. 2. නෙළුම් මල ය.

3. ඕළු මල ය. 4. මානෙල් මල ය.

34. ජාතික ගීයේ නිර්මාතෘවරයා නම් කරන්න.

1. පී. බී. ඉලංගසිංහ මහතා 2. ආනන්ද සමරකෝන් මහතා

3. ඩබ්. ඩී. අමරදේව මහතා 4. ඩී. එස්. සේනානායක මහතා

35. ශ්‍රී ලංකාව බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ බෞද්ධ රාජ්‍යයක් බවට පත් වූයේ මින් කවර කරුණක් හේතු කොට ගෙන ද?

1. ඉංග්‍රීසි පාලනයෙන් මිදුණු නිසා ය. 2. මෙරට පැරණි පාලකයින් නිසා ය.

3. විජය රජුගේ පැමිණීම නිසා ය. 4. මිහිඳු මහ රහතන් වහන්සේ ගේ වැඩමවීම නිසා ය.

36. කොවිඩ් 19 රෝගයෙන් ආරක්ෂා වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

1. මුඛ ආවරණ පැළඳීම. 2. දෙදෙනෙකු අතර පරතරය මීටරයක්වත් තබා ගැනීම.

3. සබන් යොදා දෑත් පිරිසිදු කිරීම. 4. මිතුරන් ඇසුරු නොකිරීම.

37. ශ්‍රී ලංකාවේ දුප්පත්කම නැති කිරීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රධාන උපාය මාර්ගයක් වන්නේ,

1. සමෘද්ධි ව්‍යාපාර ය. 2. විශ්‍රාම වැටුප් ගෙවීම යි.

3. රෝහල් ඉදිකිරීම යි. 4. රක්ෂණාවරණ ලබාදීම යි.

38. සමාජ විද්‍යාත්මක පර්යේෂණයක දී අරමුණු මුදුන්පත් කර ගැනීමට වැදගත් **නොවන්නේ**,

1. විෂය ප්‍රවීනත්වය යි. 2. විධික්‍රම පිළිබඳ සැලකිලිමත් වීම යි.

3. කාර්යක්ෂමතාවය යි. 4. අසම්මත ක්‍රම භාවිතය යි.

- පහත ප්‍රකාශ අධ්‍යයනය කරන්න.

A සෞඛ්‍ය පහසුකම් ඉහළ මට්ටමක පැවතීම

B වැඩිහිටි මරණ අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම

C සාක්ෂරතා ඉහළ මට්ටමක පැවතීම

D වැඩිහිටි සුභසාධන ක්‍රියාවලිය ඉහළ මට්ටමකින් පැවතීම

39. ඉහත ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ වයස්ගත ජනගහනය වැඩිවීමට බලපා ඇති හේතු සාධක පමණක ඇතුළත් පිළිතුර තෝරන්න.

1. A, B, C ය. 2. A, B, D ය.

3. A, C, D ය. 4. B, C, D ය.

- පහත ප්‍රකාශ අධ්‍යයනය කරන්න.

A සැලසුම් සහගත ව ක්‍රියා නොකිරීම

B අඩු ආදායම් තත්ත්වයක් පැවතීම

C ඉතිරිකිරීම් වැඩි කිරීම

D අනවශ්‍ය දේ සඳහා වැඩියෙන් වියදම් කිරීම

40. ඉහත ප්‍රකාශ අතුරින් ශ්‍රී ලංකාවේ දුගී බව වැඩිවීමට බලපාන හේතු සාධක පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

1. A, B, C ය. 2. A, B, D ය.

3. A, C, D ය. 4. B, C, D ය.

# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020

# Primary Piriven Year End Test - 2020

## 03 ශ්‍රේණිය/Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

සමාජ විද්‍යාව I, II
sociology Science I, II

සමාජ විද්‍යාව II

සැලකිය යුතු යි :

i. පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

01.
(i) සමාජ පරිණාමය පිළිබඳ ව අදහස් ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

(ii) සමාජ ශාස්ත්‍ර දෙකක් දක්වන්න.

(iii) සමාජ විද්‍යාවේ මූලික සංකල්ප දෙකක් සඳහන් කරන්න.

(iv) මිහිඳු මහරහතන් වහන්සේ සමග ලංකාවට වැඩම කළ රහතන් වහන්සේලා දෙදෙනෙකුගේ නම් ලියන්න.

(v) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන පිරිවෙන් වර්ග තුන මොනවා ද?

(vi) සමාජ සංවර්ධනය ගැන ඉගැන්වෙන බෞද්ධ සූත්‍ර ධර්ම දෙකක් ලියන්න.

(vii) "සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන්" කාගේ කෘතියක් ද?

(viii) බුදු දහමේ සඳහන්වන සමාජ ස්තර හතර නම් කරන්න.

(ix) බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා නම් කව්ද?

(x) හින්දු ආගමිකයන්ගේ ප්‍රධාන උත්සව දෙකක් දක්වන්න ? (ලකුණු 2 × 10 = 20)

II කොටස

02
(i) සමාජ විද්‍යාව යනු කුමක් දැ යි හැඳින්වීමට නිර්වචනයක් සපයන්න

(ii) සමාජ විද්‍යාව නැමැති විෂයය බිහිවීම කෙරෙහි බලපෑ ඓතිහාසික සාධක තුන සඳහන් කරන්න

(iii) සමාජ විද්‍යාව ඉගෙනීමෙන් භික්ෂූන් වහන්සේලාට අත්වන ප්‍රයෝජන දෙකක් පැහැදිලි කරන්න.
(ලකුණු 2 + 3+ 5 = 10)

03
(i) "සමාජය" යන්න අර්ථ කථනය කරන්න.

(ii) සමාජ සංස්ථා තුනක් නම් කරන්න.

(iii) යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීම සඳහා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3+ 5 = 10)

04

(i) සමාජ පාලනය සිදු වන ප්‍රධාන ක්‍රම දෙක සඳහන් කරන්න.

(ii) නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පැවතිය යුතු මූලික ලක්ෂණ තුන මොනවා ද?

(iii) සමාජ පාලනයේ දී භික්ෂුවගෙන් සිදු විය යුතු කාර්යභාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

05

(i) සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියන්න.

(ii) පැවිදි සමාජය මගින් ගිහි සමාජය උදෙසා ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න

(iii) මහින්දාගමනයෙන් මෙරටට ලැබුණු සංස්කෘතික දායාද දෙකක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

06

(i) සමාජ පරිණාමය යනු කුමක් ද?

(ii) කෝට්ටේ යුගයේ පැවති ප්‍රසිද්ධ පිරිවෙන් ආයතන තුනක් නම් කරන්න.

(iii) සමාජ පරිණාමය පිළිබඳ සඳහන්වන බෞද්ධ ඉගැන්වීම් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

07

(i) කොවිඩ් 19 (නව කොරෝනා) රෝගය බෝවිය හැකි අවස්ථා දෙකක් දක්වන්න.

(ii) කොවිඩ් 19 රෝග ලක්ෂණ තුනක් ලියන්න.

(iii) කොවිඩ් 19 රෝගය වළක්වා ගැනීමට ඔබට කළ හැකි දේ පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

08

(i) බටහිර ජාතීන් පෙරදිග රටවලට පැමිණීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(ii) බටහිර ජාතීන් ශ්‍රී ලංකාවට පැමිණීම හේතුවෙන් මෙරට සමාජයේ ඇති වූ වෙනස්කම් තුනක් සඳහන් කරන්න.

(iii) යහපත් සමාජයක් ගොඩ නැගීම උදෙසා විහාරස්ථානය මුල්කර ගෙන සිදු කරනු ලබන කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

**දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**පැය තුනයි**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.**

**සමාජ විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - I

**සැ.යු.**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- **අංක 01 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

(1) සමාජ විද්‍යාව විෂය ධාරව හඳුන්වාදීමේ ගෞරවය හිමිවන්නේ,
(1) කාල් මාක්ස්ට ය. (2) එමිල් ඩුර්කයිම්ට ය.
(3) ඔගස්ට් කොම්ට්ට ය. (4) ඊ. බී. ටයිලර්ට ය.

(2) සමාජ විද්‍යාව නම් වූ විෂය ප්‍රභවය වූයේ කුමන සමාජ මූලික කරගෙන ද?
(1) ආසියාතික සමාජ පදනම් කරගෙන ය. (2) ප්‍රාථමික සමාජ පදනම් කරගෙන ය.
(3) බටහිර සමාජ පදනම් කරගෙන ය. (4) ගැමි සමාජ පදනම් කරගෙන ය.

(3) "යථානුභූත දර්ශනය" නම් කෘතිය රචනා කළේ කවුද?
(1) හර්බට් ස්පෙන්සර් (2) මැක්ස් වේබර්
(3) එමිල් ඩුර්කයිම් (4) ඔගස්ට් කොම්ට්ට

(4) පහත සඳහන් දෑ අතුරින් සමාජ සංස්ථාවක් **නොවන්නේ** මින් කුමක් ද?
(1) සමාජය (2) ආගම (3) අධ්‍යාපනය (4) පවුල

(5) පුද්ගල පෞරුෂ සංවර්ධනය කෙරෙහි පාරිසරික හා සංස්කෘතික සාධක ප්‍රමුඛ වන බවට නිදසුන් වන්නේ,
(1) සත්තිගුම්බ ජාතකය යි. (2) චුල්ලහංස ජාතකය යි.
(3) ගුත්තිල ජාතකය යි. (4) චුල්ලසෙට්ඨි ජාතකය යි.

(6) "මානව සමාජයක්" යන්න සමාජ විද්‍යාඥයින් අර්ථ නිරූපණය කරන්නේ,
(1) පුද්ගල එකතුවකි. (2) පුද්ගල සමූහයකි.
(3) පුද්ගලයින් දෙදෙනෙකුට වැඩි පිරිසකි. (4) අන්තර් පුද්ගල සබඳතා පවත්වන එකතුවකි.

(7) ආරෝපිත තත්ත්වය ප්‍රබල සාධකයක් ලෙස ඉස්මතු වූයේ,
(1) ප්‍රාථමික සමාජවල ය. (2) සංකීර්ණ සමාජවල ය.
(3) නූතන සමාජවල ය. (4) බටහිර සමාජවල ය.

(8) දේවවාදී සංකල්පයෙන් ඉවත් ව සමාජය දෙස යථාර්තවාදී ව බැලීමේ ප්‍රතිඵලයක් ලෙස නූතන සමාජ බිහි වූ බව,
(1) එමිල් ඩුර්කයිම්ගේ අදහසයි. (2) ඊ.බී. ටයිලර්ගේ අදහසයි.
(3) ඔගස්ට් කොම්ට්ගේ අදහසයි. (4) බී. මැලිනොවුස්කි ගේ අදහසයි.

(9) නීතිය මූලික වශයෙන් යොදාගෙන සමාජ පාලනය කිරීම,
(1) නූතන සමාජයේ ලක්ෂණයකි. (2) පැරණි සමාජයේ ලක්ෂණයකි.
(3) ග්‍රාමීය සමාජයේ ලක්ෂණයකි. (4) ගෝත්‍රික සමාජයේ ලක්ෂණයකි.

(10) සමාජ ආරම්භය හා විකාශනය සම්බන්ධ කරුණු දක්වන බෞද්ධ සූත්‍ර දේශනාව කුමක් ද?
(1) චක්කවත්තිසීහනාද සූත්‍රය (2) පරාභව සූත්‍රය
(3) අග්ගඤ්ඤ සූත්‍රය (4) මහා පරිනිබ්බාණ සූත්‍රය

(11) ශ්‍රී ලාංකික සමාජයේ විහාරස්ථාන සම්බන්ධ ව වඩාත් ගැළපෙන ප්‍රකාශය කුමක් ද?
(1) බහු කාර්ය ආයතනයකි. (2) අධ්‍යාපනය ලබා දෙන ආයතනයකි.
(3) විමුක්ති මාර්ගය හෙළි කරන සමාජයකි. (4) සියලු බෞද්ධයින් වැඳුම් පිදුම් කරන ස්ථානයකි.

(12) බ්‍රිතාන්‍ය මානව විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන්නේ කවුද?
(1) ඔගස්ට් කොම්ට් (2) ඊ.බී. ටයිලර් (3) හෙරඩෝටස් (4) මාටින් ලූතර්

(13) ප්‍රාථමික සමාජානුයෝජන කාරකය අයත් වරණය කුමක් ද?
(1) සමවයස් කණ්ඩායම් (2) මානව පවුල (3) පාසල (4) පන්සල

(14) "මනෝ කායික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඇති කරගත් දෙය සංස්කෘතිය යි." යනුවෙන් සංස්කෘතිය නිර්වචනය කළේ කවුද?
(1) ඊ.බී. ටයිලර් (2) රැල්ෆ් ලින්ටන් (3) බී. මැලිනොවුස්කි (4) රේමන්ඩ් විලියම්ස්

(15) නබිනායකතුමාගේ උපන් බිම වන්දනා කිරීම හැඳින්වෙන්නේ,
(1) හෝලි ලෙස යි. (2) හජ්ජි ලෙස යි. (3) දීපවාලි ලෙස යි. (4) රාමසාන් ලෙස යි.

(16) පන්සලේ පියතුමා ලෙස අන්වර්ථ නාමයෙන් පිදුම් ලැබුවේ,
(1) පෝරුතොට පියතුමා ය. (2) මැල්කම් රංජිත් කාදිනල් පියතුමා ය.
(3) මර්සලින් ජයකෝඩි පියතුමා ය. (4) ගාමිණී රංජිත් පියතුමා ය.

(17) පෙර පාසල, පාසල, සමවයස් කණ්ඩායම්, ජනමාධ්‍ය යන මේවා, සමාජ විද්‍යාත්මකව හඳුන්වනු ලබන්නේ,
(1) සමාජ පාලන ආයතන ලෙස යි. (2) සමාජානුයෝජන ආයතන ලෙස යි.
(3) මාර්ගෝපදේශ ආයතන ලෙස යි. (4) අධ්‍යාපන ආයතන ලෙස යි.

(18) ලේ ඥාතිත්වය ප්‍රධාන කොටගෙන ගොඩනැගෙන සමාජ සංස්ථාව කුමක් ද?
(1) පවුල් සංස්ථාව (2) දේශපාලන සංස්ථාව (3) විවාහ සංස්ථාව (4) ආගමික සංස්ථාව

- ප්‍රශ්න අංක 19 සහ 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් කරුණු උපයෝගී කරගන්න.

A - උපදේශනය ලබා දීම B - යහපතේ යෙදවීම
C - නීති සම්පාදය D - යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(19) භික්ෂූන් වහන්සේගේ තත්ත්වයට අදාළ ප්‍රධාන කාර්යයන් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A හා B (2) A හා C (3) A හා D (4) B හා D

(20) රාජ්‍ය පාලනයේ දී ඉටු විය යුතු මූලික කාර්යයන් පමණක් දැක්වෙන වරණය කුමක් ද?
(1) A හා C (2) B හා C (3) C හා D (4) B හා D

(21) ස්ත්‍රී පුරුෂ තත්ත්වය සමාජ විද්‍යාවට අනුව,

(1) ස්ත්‍රී පුරුෂ වෙන්කිරීමේ තත්ත්වයකි. (2) ආරෝපිත තත්ත්වයකි.

(3) සාධිත තත්ත්වයකි. (4) ලිංග භේද තත්ත්වයකි.

(22) අල්පේච්ඡ භාවයට පත්වීමෙන්,

(1) අසහනය වර්ධනය වේ. (2) අහංකාරය ඇති වේ.

(3) සිත සැහැල්ලු වේ. (4) අතෘප්තිය ඇති වේ.

(23) සමාජයක සංස්කෘතිය රඳා පවතින්නේ, සාරධර්ම නිසා බව ප්‍රකාශ කළ සමාජ විද්‍යාඥයා කවුද?

(1) එමිල් ඩුර්කයිම් (2) කාල් මාක්ස්

(3) හර්බට් ස්පෙන්සර් (4) ෆර්ඩිනන්ඩ් ටොනිස්

(24) කුල දරුවන් පැවිදි කිරීමෙන් පසු සාමණේර අවධියේ දී ම මූලික වශයෙන් අපේක්ෂා කෙරෙන්නේ,

(1) සාමණේර දස සීලය ආරක්ෂා කිරීම යි. (2) භික්ෂු ජීවිතයට අවශ්‍ය වත් පිළිවෙත් සපිරීම යි.

(3) පස්පව්වලින් වැළකීම යි. (4) ත්‍රිපිටකය වනපොත් කිරීම යි.

(25) දේවවාදී විශ්වාසයෙන් තොරව සහකම්පනය හා සුබ නම්‍ය යහ පැවැත්ම උදෙසා සමාජ මෙහෙයවන ප්‍රබල ආගමික දර්ශනයක් අන්තර්ගත වන්නේ,

(1) බුදු දහම තුළ යි. (2) හින්දු දහම තුළ යි.

(3) ඉස්ලාම් දහම තුළ යි. (4) කතෝලික දහම තුළ යි.

(26) මානව චින්තනයේ නිදහස පිළිබඳ අවධාරණය කෙරෙන ප්‍රධාන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?

(1) අග්ගඤ්ඤ සූත්‍රය (2) මහා මංගල සූත්‍රය (3) කරණීයමෙත්ත සූත්‍රය (4) කාලාම සූත්‍රය

(27) සමාජ ප්‍රශ්න පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය අන්තර්ගත වරණය තෝරන්න.

(1) ළමා අපයෝජනය සමාජ ප්‍රශ්නයක් වේ.

(2) රටක යාචකයන් බහුල වීම සමාජ ප්‍රශ්නයක් වේ.

(3) ජනවර්ග අතර ගැටුම් ඇති වීම සමාජ ප්‍රශ්නයක් වේ.

(4) පුද්ගලයින් ස්වභාවිකව ම මරණයට පත්වීම සමාජ ප්‍රශ්නයක් වේ.

(28) ශ්‍රී ලංකාවේ දුගී බව පිටු දැකීම සඳහා වර්තමාන රාජ්‍ය යාන්ත්‍රණයේ ප්‍රධාන උපාය මාර්ගය වන්නේ මින් කුමක් ද?

(1) සමෘද්ධි වැඩසටහන් සංකල්පය (2) ජනසවිය වැඩසටහන් සංකල්පය

(3) උදාගම් වැඩසටහන් සංකල්පය (4) විශ්‍රාම වැටුප් සංකල්පය

(29) එක්සත් ජාතීන්ගේ වාර්තාවලට අනුව යැපෙන්නන් වැඩි වශයෙන් සිටින රටවල් අතර ප්‍රධාන ස්ථානයක් ශ්‍රී ලංකාවට හිමි වේ. වර්ෂ 2036 වන විට වර්ධනය වේ යැයි අපේක්ෂිත වයෝවෘධ ජනගහනයේ ප්‍රතිශතය වන්නේ,

(1) 30% කි. (2) 48% කි. (3) 72% කි. (4) 90% කි.

- අංක 30 හා 31 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත කරුණු උපයෝගී කරගන්න.

A - සදිසා නමස්කාරය  B - නිතර රැස්වීම

C - නො පැනවූ නීති නො පැනවීම  D - සතර සංග්‍රහ වස්තු

(30) ඉහත කරුණු අතුරින් සිගාලෝවාද සූත්‍රයේ ඉගැන්වීම් පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) A හා B  (2) A හා C  (3) A හා D  (4) B හා D

(31) ඉහත කරුණු අතරින් සප්ත අපරිහාණීය ධර්මයන්ට අයත් අංග පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B  (2) A හා C  (3) A හා D  (4) B හා C

- අංක 32 හා 33 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත කරුණු උපයෝගී කරගන්න.

A - මව් පියන්ට උපස්ථාන කිරීම  B - පිදිය යුත්තන් පිදීම

C - අසත් පුරුෂයන්ට ප්‍රිය වීම  D - උට්ඨාන වීර්යය නැති වීම

(32) ඉහත කරුණු අතරින් මහා මංගල සූත්‍රයේ දැක්වෙන ඉගැන්වීම් පමණක් අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) A හා B  (2) A හා C  (3) A හා D  (4) B හා D

(33) ඉහත කරුණු අතරින් පරාභව සූත්‍රයේ දැක්වෙන කරුණු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1)A හා B  (2) A හා C  (3) B හා C  (4) C හා D

(34) ශ්‍රී ලංකාවේ වයස්ගත වූවන් සේ සලකන්නේ කුමන වයස අවුරුද්ද ඉක්මවූවන් ද?

(1) අවුරුදු 55  (2) අවුරුදු 60  (3) අවුරුදු 70  (4) අවුරුදු 80

(35) බෞද්ධ සමාජ ව්‍යුහය තුළ දක්නට ලැබෙන කණ්ඩායම් ප්‍රධාන වශයෙන්,

(1) තුනකි.  (2) හතරකි.  (3) පහකි.  (4) හයකි.

(36) "භාග්‍යවතුන් වහන්ස, දැන් පිරිනිවන් පාන සේක්වා. පිරිනිවන් පෑමට දැන් කාලය පැමිණ ඇත." මෙම ප්‍රකාශය අන්තර්ගත සූත්‍ර දේශනාව කුමක් ද?

(1) කරණීයමෙත්ත සූත්‍රය  (2) මහා පරිණිබ්බාණ සූත්‍රය

(3) අග්ගඤ්ඤ සූත්‍රය  (4) තිරෝකුඩ්ඩ සූත්‍රය

(37) "බොහෝ දෙනාගේ හිතසුව පිණිස චාරිකාවේ හැසිරෙන්න." යන ප්‍රකාශය සිදු කරනු ලැබුවේ,

(1) ආනන්ද මහතෙරුන් වහන්සේ ය.  (2) මුගලන් මහරහතන් වහන්සේ ය.

(3) මිහිඳු මහරහතන් වහන්සේ ය.  (4) ගෞතම බුදුරජාණන් වහන්සේ ය.

(38) ශ්‍රී ලංකාව මුළුමනින් ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වූයේ කිනම් වර්ෂයේ ද?

(1) 1615 දී  (2) 1715 දී  (3) 1815 දී  (4) 1915 දී

(39) "මන්දාරම් පුර පුවතෙහි" විස්තරය නිවැරදි ව ප්‍රකාශිත වරණය තෝරන්න.

(1) කොනප්පු බණ්ඩාර මරා දැමූ බව යි.

(2) භික්ෂූන් වහන්සේලා හැට එක් නමක් මරා දැමූ බව යි.

(3) පළමුවන රාජසිංහ රජු මරා දැමූ බව යි.

(4) මද්දුම බණ්ඩාර කුමරු මරාදැමූ බව යි.

(40) විද්‍යාත්මක ක්‍රමය උපයෝගී කරගෙන සිදු කෙරෙන පර්යේෂණයක පළමු පියවර වන්නේ මින් කුමක් ද?

(1) ගැටලුව හඳුනා ගැනීම  (2) කල්පිත ගොඩනැගීම

(3) දත්ත එකතු කිරීම  (4) දත්ත විශ්ලේෂණය කිරීම

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையுஜடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - பிரிவேனா கல்விக் கிளை
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

**සමාජ විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - II

**සැලකිය යුතුයි.**

- **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) සමාජ විද්‍යාව විෂය බිහිවූයේ කිනම් සියවසේ ද?
(ii) සමාජීය විද්‍යාවන් **දෙකක්** සඳහන් කරන්න.
(iii) සමාජ පරිණාමය වන්නේ අසමාන සමාජ පන්ති අතර ඇති වන ගැටුම හේතුවෙන් බව දැක්වූ සමාජ විද්‍යාඥයා කවුද?
(iv) මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ පැවති ආගමික විශ්වාස **දෙකක්** සඳහන් කරන්න.
(v) ශ්‍රී ලාංකේය සමාජයේ පවතින ආගමික සංස්කෘති **දෙකක්** සඳහන් කරන්න.
(vi) සමාජ වෙනස්වීම අධ්‍යයනය කිරීමේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන සංකල්ප **දෙකක්** ලියන්න.
(vii) යහපත් සමාජයක් ගොඩනගා ගැනීමට උපකාරී වන බෞද්ධ ඉගැන්වීම් දැක්වෙන බෞද්ධ සූත්‍ර **දෙකක** නම් ලියන්න.
(viii) සමාජ පාලනය සිදු වන ප්‍රධාන ක්‍රම **දෙක** නම් කරන්න.
(ix) සමාජ පාලනය සිදු නො වීමෙන් ඇතිවන ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
(x) සමාජය අධ්‍යයනය කිරීමට යොදා ගන්නා පර්යේෂණ ක්‍රමවේද **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) සමාජ විද්‍යාව අර්ථකථනය කරන්න. (ලකුණු 02)
(ii) සමාජ විද්‍යාවේ ප්‍රභවය කෙරෙහි බලපෑ ඓතිහාසික සාධක **තුන** සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **පහක්** ලියන්න. (ලකුණු 05)

03. (i) සමාජ පරිණාමය යනු කුමක් ද? (ලකුණු 02)
(ii) සමාජ පරිණාමය අධ්‍යයනය කරන දෘෂ්ටි කෝණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) සමාජ පරිණාමය පැහැදිලි කෙරෙන බෞද්ධ ඉගැන්වීම් **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) කෝට්ටේ රාජධානි යුගයේ පැවති කීර්තිමත් පිරිවෙන් **දෙකක** නම් ලියන්න. (ලකුණු 02)
(ii) පිරිවෙන් අධ්‍යාපනයේ මූලික පරමාර්ථ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) සමාජ සංවර්ධනය සඳහා පිරිවෙනෙන් සිදු වන සේවාවන් **පහක්** ලියන්න. (ලකුණු 05)

05. (i) සමාජානුයෝජනය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) සංස්කෘතියක අන්තර්ගත පොදු ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සිංහල සංස්කෘතිය පෝෂණය වීමට බුදු දහමෙන් ලැබුණු දායාද **පහක්** ලියන්න. (ලකුණු 05)

06. (i) චාරිත්‍ර වාරිත්‍ර ක්‍රියාත්මක කිරීමේ බලවන්තභාවය අනුව බෙදෙන ප්‍රධාන කොටස් **දෙක** මෙනවාද?

(ලකුණු 02)

(ii) නීතිය ක්‍රියාත්මක කිරීමේ දී දක්නට ලැබෙන මූලික ලක්ෂණ **තුන** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) සමාජ පාලනය සඳහා මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)

07. (i) සමාජ ගැටලුවක හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) සමාජයක දුගී භාවය ඇතිවීම කෙරෙහි බලපාන සාධක **තුනක්** පෙන්වා දෙන්න. (ලකුණු 03)

(iii) වයස්ගතවූවන්ගේ සමාජ ගැටලුව නිරාකරණය සඳහා බුදු දහමේ දැක්වෙන ඉගැන්වීම් **තුනක්** සඳහන් කර, ඉන් **එකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

08. (i) සමාජ විද්‍යාත්මක පර්යේෂණ බෙදෙන මූලික කොටස් **දෙක** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) සමාජ විද්‍යාත්මක පර්යේෂණ මගින් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) පර්යේෂණයක් සිදු කිරීමේ දී අනුගමනය කළ යුතු මූලික පියවර **පහ** සඳහන් කරන්න. (ලකුණු 05)

09. (i) බුදුරජාණන් වහන්සේ දේශනා කළ සදිසාවන්ට අයත් සමාජ කණ්ඩායම් **දෙකක** නම් ලියන්න.

(ලකුණු 02)

(ii) ශ්‍රී ලාංකේය ජන සමාජයේ ජීවත් වන ජනවර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) "භික්ෂුව" යන තත්ත්වයට අදාළ ව සිදු කළ යුතු කාර්යභාරයන් **පහ** සඳහන් කරන්න. (ලකුණු 05)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය තුනයි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

**සමාජ විද්‍යාව - I , II** **3 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - I

**සැ.යු.**

- ❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.**
- ❖ **අංක 01 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- ❖ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
- ❖ **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.**

01. සමජ විද්‍යාව විෂය ලොවට හඳුන්වා දුන් දාර්ශනිකයා වන්නේ,
    (1) චාල්ස් කූරියර් ය. (2) ඔගස්ට් කොම්ට් ය. (3) රොබට් ඕවන් ය. (4) සෙන්ට් සිමෝන් ය.

02. 19 වන සියවස මැද භාගයේ දී පමණ බටහිර සමාජය තාර්කිකවාදී සමාජයක් බවට පරිවර්තනය වීමට බලපෑ ඓතිහාසික සාධක පමණක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) ආගමික පුනරුදය , බටහිරකරණය , කාර්මීකරණය
    (2) දේශපාලන ප්‍රතිසංස්කරණ , කාර්මික විප්ලවය , ආර්ථික ප්‍රතිසංස්කරණ
    (3) ආගමික පුනරුදය , කාර්මික විප්ලවය , දේශපාලන ප්‍රතිසංස්කරණ
    (4) කාර්මික විප්ලවය , බටහිරකරණය , නාගරීකරණය

03. ''සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන් නම් කෘතිය තුළින් සමාජය අධ්‍යයනය කිරීම සඳහා'' ක්‍රමවේදයක් හඳුන්වා දුන් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා වන්නේ,
    (1) ඔගස්ට් කොම්ට් ය. (2) එමිල් ඩුර්කයිම් ය. (3) කාල් මාක්ස් ය. (4) මැක්ස් වේබර් ය.

04. සමාජය හා අනුබද්ධ මූලික සංකල්ප රැසක් සමාජ විද්‍යාඥයින් විසින් සමාජ විද්‍යා විෂය ක්ෂේත්‍රයට හඳුන්වා දී ඇත. එසේ හඳුන්වා දී ඇති මූලික සංකල්ප අතරට අයත් **නො වන්නේ** මින් කුමක් ද?
    (1) සමාජ සංස්ථා (2) සමාජානුයෝජනය (3) සමාජ සමූහ (4) දේශපාලනය

05. සමාජීය විද්‍යාවන් අතර ජනප්‍රිය විෂය බවට පත් ව ඇති සමාජ විද්‍යාව ආරම්භ වූයේ කුමන සමාජ අධ්‍යයනය කිරීම අරමුණු කර ගෙන ද?
    (1) ගෝත්‍රික සමාජ (2) ගැමි සමාජ (3) ප්‍රාථමික සමාජ (4) නාගරික සමාජ

06. සමාජ පරිණාමය සඳහා බලපාන මූලික හේතුව වන්නේ පුද්ගලයා තුළ පවතින,
    (1) ස්ථිතික ස්වභාවය යි. (2) මානව හිතවාදී ස්වභාවය යි.
    (3) සමාජශීලී ස්වභාවය යි. (4) ගතික ස්වභාවය යි.

07. සමාජ විද්‍යාඥයින්ගේ නම් 'අ' තීරුවේ ද සමාජ පරිණාමය පිළිබඳ ඔවුන් දැක්වූ අදහස් 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. ඔගස්ට් කොම්ට් | A. ශ්‍රම විභජනය සමාජ පරිණාමය සඳහා හේතු වේ. |
| 2. එමිල් ඩූර්කයිම් | B. තාර්කානුකූල ව කටයුතු කිරීම සමාජ පරිණාමයට හේතු වේ. |
| 3. මැක්ස් වේබර් | C. සමාජය දෙස යථාර්ථවාදී ව බැලීම සමාජ පරිණාමයට හේතු වේ. |
| 4. කාල් මාක්ස් | D. නිෂ්පාදන ක්‍රමයේ වෙනස්කම් සමාජ පරිණාමයට හේතු වේ. |

ඉහත 'අ' තීරුවේ සඳහන් සමාජ විද්‍යාඥයින් සමග 'ආ' තීරුවේ දැක්වෙන සමාජ පරිණාමය පිළිබඳ අදහස් නිවැරදි ව ගැළපූ විට ලැබෙන වරණය තෝරන්න.

(1) A , B , C හා D (2) B , C , D හා A (3) C , A , B හා D (4) D , C , B හා A

08. වෙනස් වීම නම් සංකල්පය බුදු දහමේ මූලික ඉගැන්වීමකි. බුදු දහමට අනුව කාලයත් සමග සිදු වන වෙනස් වීම නිසා හටගන්නා දුක හඳුන්වනු ලබන්නේ,

(1) දුක්ඛ දුක්ඛ ලෙස ය. (2) සංඛාර දුක්ඛ ලෙස ය.
(3) විපරිණාම දුක්ඛ ලෙස ය. (4) ව්‍යාධි දුක්ඛ ලෙස ය.

09. ආරෝපිත තත්ත්වයට අදාළ තත්ත්ව කුලකයන් පමණක් නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?

(1) පුරුෂයා, බෞද්ධ, සිංහල (2) මුස්ලිම්, පියා, රියැදුරා
(3) ගුරුවරයා, දෙමළ, හින්දු (4) ස්ත්‍රිය, ගොවිගම, වෛද්‍යවරිය

➢ **අංක 10 සිට 11 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත නම් සඳහන් පිරිවෙන් උපයෝගී කර ගන්න.**

(A) කාළප්‍රාසාද පිරිවෙන (B) තොටගමුවේ විජයබා පිරිවෙන
(C) ග්‍රන්ථාකර පිරිවෙන (D) කැරගල පද්මාවතී පිරිවෙන

10. අනුරාධපුර රාජධානි සමයේ ආරම්භ වූ පිරිවෙන් ආයතන දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A හා B (2) A හා C (3) B හා D (4) C හා D

11. කෝට්ටෙ රාජධානි සමයේ බිහි වූ කීර්තිමත් පිරිවෙන් දෙකක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A හා C (2) B හා C (3) B හා D (4) C හා D

12. සමාජයේ පහළවීම පිළිබඳ ව මෙන් ම සමාජයේ විකාශනය පිළිබඳවත් කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍ර දේශනාව මින් කුමක් ද?

(1) වසල සූත්‍රය (2) පරාභව සූත්‍රය (3) අග්ගඤ්ඤ සූත්‍රය (4) කාලාම සූත්‍රය

13. බටහිර ජාතීන්ගේ බලපෑම නිසා බිඳ වැටුණු පිරිවෙන් අධ්‍යාපනය නැවත ගොඩනැගීමට මූලිකත්වය ගනු ලැබූ භික්ෂූන් වහන්සේ කවුද?

(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි (2) වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි
(3) වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ හිමි (4) රත්මලානේ ශ්‍රී ධම්මාලෝක හිමි

14. සමාජ හා මානව විද්‍යාඥයින් විසින් බෙදා දක්වා ඇති ලෝකයේ පවතින ප්‍රධාන සමාජ වර්ග තුන අතරට අයත් **නො වන්නේ,**

(1) ධීවර සමාජ යි. (2) ගෝත්‍රික සමාජ යි. (3) ගැමි සමාජ යි. (4) කාර්මික සමාජ යි.

15. සදිසා නමස්කාරය මගින් සමාජ කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා අර්ථවත් ව පවත්වා ගැනීමේ වැදගත්කම පෙන්වා දී ඇති බෞද්ධ සූත්‍ර ධර්මය වන්නේ,

(1) චක්කවත්තිසීහනාද සූත්‍රය යි. (2) අග්ගඤ්ඤ සූත්‍රය යි.

(3) කාලාම සූත්‍රය යි. (4) සිඟාලෝවාද සූත්‍රය යි.

- **අංක 16 සිට 17 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන කාර්යයන් උපයෝගී කර ගන්න.**

(A) විශ්ව දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබා දීම

(B) ආහාර චාරිත්‍ර හුරු කිරීම

(C) හොඳ නරක පිළිබඳ දැනුම ලබා දීම

(D) තොරතුරු දැන ගැනීමට අවස්ථාව නිර්මාණය කිරීම

16. 'පවුල' නම් සමාජානුයෝජන කාරකයේ ප්‍රධාන කාර්යයන් පමණක් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

17. ජනමාධ්‍යය මගින් ඉටු කරනු ලබන ප්‍රමුඛ සමාජානුයෝජන කර්යයන් පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) A හා B (2) A හා D (3) B හා C (4) C හා D

18. ශ්‍රී ලංකාව බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ රාජ්‍යයක් බවට පත්වීමට බලපෑ ප්‍රධාන හේතුව මින් කුමක් ද?

(1) ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩමකරවීම (2) මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීම

(3) සංඝමිත්තා තෙරණියගේ වැඩමවීම (4) දළදා වහන්සේ වැඩමකරවීම

19. ශ්‍රී ලාංකේය සමාජයේ දක්නට ලැබෙන ප්‍රධාන ආගම් හතරක් 'අ' තීරුවේ ද ආගමික උත්සව හතරක් 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. බෞද්ධ | A. මහාශිවරාත්‍රි |
| 2. ක්‍රිස්තියානි | B. වෙසක් |
| 3. හින්දු | C. හජ්ජි |
| 4. ඉස්ලාම් | D. නත්තල් |

ඉහත 'අ' තීරුවේ දැක්වෙන ආගම් හා 'ආ' තීරුවේ දැක්වෙන ආගමික උත්සව නිවැරදි අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

(1) A , B , C හා D (2) B , A , C හා D (3) B , D , A හා C (4) B , C , A හා D

20. මහා මංගල සූත්‍රයෙහි දැක්වෙන මංගල කරුණක් **නො වන්නේ** මින් කුමක් ද?
(1) පිදිය යුත්තන් පිදීම (2) බාලයන් ඇසුරු කිරීම
(3) මව් පියන්ට උපස්ථාන කිරීම (4) සුදුසු ප්‍රදේශයක වාසය කිරීම

21. බුදුන් දවස ලිච්ඡවී රජදරුවන් විසින් තම රාජ්‍යයේ පැවැත්ම අඛණ්ඩ ව පවත්වාගෙන යනු ලැබූයේ මින් කුමන දහම් කරුණු අනුගමනය කිරීමෙන් ද?
(1) සප්ත අපරිහානි ධර්ම (2) දස රාජ ධර්ම
(3) දස සක්විති වත් (4) සතර සංග්‍රහ වස්තු

22. සරල කෘෂිකාර්මික කටයුතුවල යෙදෙන හා සරල දිවි පෙවතක් දක්නට ලැබෙන්නේ කුමන සමාජවල ද?
(1) නාගරික සමාජ (2) ගෝත්‍රික සමාජ (3) කාර්මික සමාජ (4) ගැමි සමාජ

23. 'සියදිවි නසා ගැනීම' නම් කෘතිය රචනා කළ සමාජ විද්‍යාඥයා කවුද?
(1) එමිල් ඩුර්කයිම් (2) ඔගස්ට් කොම්ට් (3) හර්බට් ස්පෙන්සර් (4) කාල් මාක්ස්

24. දියුණු කාර්මික සමාජවල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වන්නේ මින් කුමක් ද?
(1) සරල තාක්ෂණය භාවිතයට ගැනීම (2) විද්‍යාත්මක දැනුම භාවිතයට ගැනීම
(3) චාරිත්‍ර වාරිත්‍රවලට මුල් තැනක් ලැබීම (4) කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය වීම

25. සමාජ පාලනය උදෙසා නීතිය ක්‍රියාත්මක කිරීමේ දී මූලික ලක්ෂණ තුනක් කැපී පෙනේ. ඒ අතුරින් බලාධිපත්‍යය යනුවෙන් හැඳින්වන්නේ,
(1) නීතිය සමාජ පාලන බලවේගයක් ලෙස පිළිගැනීම යි.
(2) නීතිය පොදු සම්මතයක් බවට පත්වීම යි.
(3) නීතිය මත ආරෝපණය කර ඇති උත්තරීතර භාවය යි.
(4) නීතිය සැමට සමාන ව ක්‍රියාත්මක වීම යි.

➢ අංක 26 – 27 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන කරුණු උපයෝගි කර ගන්න.

A (i) මෛත්‍රී සහගත චර්යා
(ii) ජනතාව අතර සමගිය

B (i) නීතිගරුක බව
(ii) සමාජ අපගාමී චර්යා

C (i) භික්ෂූන් වහන්සේලාගේ අල්පේච්ඡතාව
(ii) ශාසනික පරිහානිය

D (i) සමාජ විසංවිධානය
(ii) සමාජ ගැටලු

26. අංක (i) හි වැඩි වීම අංක (ii) හි වැඩි වීම කෙරෙහි බලපෑම් කරන සිද්ධි යුගල දෙක දැක්වෙන වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

27. අංක (i) හි වැඩි වීම අංක (ii) හි අඩු වීම කෙරෙහි බලපෑම් කරන සිද්ධි යුගල දෙක ඇතුළත් වරණය තෝරන්න.
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

28. සමාජ පාලනය සඳහා වැදගත් වන දස රාජ ධර්ම අතරට අයත් **නො වන්නේ** මින් කුමක් ද?

(1) අවිහිංසාව (2) පරිත්‍යාගය (3) විරුද්ධ වීම (4) මෘදු බව

29. නූතන සමාජවල සමාජ පාලන බලවේගයක් ලෙස බහුල ව ක්‍රියාත්මක වන්නේ මින් කුමක් ද?

(1) සාරධර්ම (2) ජනචර්යා (3) ගණචර්යා (4) නීතිරීති

30. සමාජ ගැටලුවක ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

(1) එක් පුද්ගලයෙකුට බලපෑම (2) සමාජයට යහපත් ලෙස බලපෑම

(3) සමාජය තුළින් ම උපත ලැබීම (4) විසඳුම් නොමැති වීම

31. ශ්‍රී ලංකාවේ වර්තමාන සමාජය තුළ උද්ගත වී ඇති සමාජ ගැටලු කිහිපයක් 'අ' තීරුවේ ද ඒවා නිරාකරණයට මැදිහත් වන රාජ්‍ය ආයතන 'ආ' තීරුවේ ද දැක්වේ.

| 'අ' | 'ආ' |
| --- | --- |
| 1. ඒඩ්ස් රෝගය | A. සමෘද්ධි අධිකාරිය |
| 2. අවිධිමත් කසළ කළමනාකරණය | B. ප්‍රාදේශීය සභාව |
| 3. දුගී බව | C. ළමා ආරක්ෂක අධිකාරිය |
| 4. ළමා අපයෝජනය | D. සෞඛ්‍ය අමාත්‍යාංශය |

ඉහත 'අ' තීරුවේ සඳහන් සමාජ ගැටලු හා ඒවා නිරාකරණයට මැදිහත් වන 'ආ' තීරුවේ ඇති රාජ්‍ය ආයතන සමග නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

(1) A , B , C හා D (2) B , A , D හා C (3) C , B , A හා D (4) D , B , A හා C

32. දුගී බව වැඩි වීමට හේතු සාධකයක් **නො වන්නේ** මින් කුමක් ද?

(1) ආදායම සැලසුම් සහගත ව වියදම් කිරීම (2) අඩු ආදායම් තත්ත්වයක් පැවතීම

(3) ඉතිරි කිරීමේ හැකියාව අඩු වීම. (4) අනවශ්‍ය දේ සඳහා වියදම් කිරීම

33. උට්ඨාන වීර්යය නැති බව, නිදන සුලු බව, අසත් පුරුෂයන්ට ප්‍රිය කිරීම වැනි පුද්ගල දියුණුවට බාධා වන කරුණු දැක්වෙන බෞද්ධ සූත්‍ර දේශනාව වන්නේ,

(1) වසල සූත්‍රය යි. (2) සිඟාලෝවාද සූත්‍රය යි. (3) පරාභව සූත්‍රය යි. (4) කූටදන්ත සූත්‍රය යි.

34. සමාජ ගැටලුවක් ඇති වීමට බලපාන ප්‍රධාන හේතුව වන්නේ මින් කුමන කරුණ ද?

(1) නූගත්කම (2) මිත්‍ර කණ්ඩායම් ඇසුර

(3) ජනමාධ්‍ය භාවිතය (4) ආගමික ක්‍රියාකාරකම්

35. 'රජය මගින් දුප්පතුන්ට සහනාධාර සැපයීම සමාජය තුළ කම්මැලිකම වර්ධනය වීමට හේතු වන බව' පෙන්වා දුන් සමාජීය විද්‍යාඥයා කවුද?

(1) රුග්නාර් නර්ක්ස් (2) හර්බට් ස්පෙන්සර් (3) රල්ෆ් ලින්ටන් (4) කාල් මාක්ස්

36. සමාජ විද්‍යා පර්යේෂණයක පළමු පියවර දැක්වෙන වරණය කුමක් ද?

(1) දත්ත විශ්ලේෂණය (2) දත්ත එකතු කිරීම

(3) කල්පිත ගොඩනැගීම (4) ගැටලුව හඳුනා ගැනීම

37. සමාජ විද්‍යා පර්යේෂණවල පර්යේෂණාගාරය වන්නේ,

(1) විද්‍යාගාරය යි. (2) සමාජය යි. (3) අභ්‍යවකාශය යි. (4) ශල්‍යාගාරය යි.

38. ශ්‍රී ලංකා සමාජය බටහිර ජාතීන්ට නතු වීම ආරම්භ කරමින් පෘතුගීසීන් මෙරටට පැමිණියේ කුමන වර්ෂයේ දී ද?

(1) ක්‍රි. ව. 1505 දී ය. (2) ක්‍රි. ව. 1658 දී ය. (3) ක්‍රි. ව. 1796 දී ය. (4) ක්‍රි. ව. 1815 දී ය.

39. සමාජ විද්‍යා පර්යේෂණයක් සඳහා දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රමයක් **නො වන්නේ** මින් කුමක් ද?

(1) සම්මුඛ සාකච්ඡා (2) නිරීක්ෂණය (3) නියැදි (4) ප්‍රශ්න මාලා

40. සමාජීය විද්‍යා විෂය කාණ්ඩයට අයත් විෂයක් වන්නේ මින් කුමක් ද?

(1) රසායන විද්‍යාව (2) මානව විද්‍යාව (3) ජීව විද්‍යාව (4) තාරකා විද්‍යාව

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

**වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)**
Year End Term Test – 2022 (2023)

**සමාජ විද්‍යාව - I, II** **3 ශ්‍රේණිය**

## සමාජ විද්‍යාව - II

**සැලකිය යුතුයි.**
❖ **පළමුවන** ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න **හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

01. (i) සාම්ප්‍රදායික කිතුනු ආගමට නව ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දුන් පූජකවරුන් **දෙදෙනා** කවුරුන් ද?
(ii) සමාජ විද්‍යා විෂයේ දී සමාජය අධ්‍යයනය කරනු ලබන ප්‍රධාන තේමාවන් **දෙක** මොනවා ද?
(iii) බෞද්ධ විහාරස්ථාන මගින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.
(iv) සංස්කෘතිය මගින් ඉටු කෙරෙන කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.
(v) මහින්දාගමනයට පෙර පැවති මෙරට වැසියන්ගේ ආගමික විශ්වාස **දෙකක්** ලියන්න.
(vi) සමාජ පාලනය සිදු වන ප්‍රධාන ක්‍රම **දෙක** මොනවා ද?
(vii) වත්මන් සමාජය තුළ දක්නට ඇති සමාජ ගැටලු **දෙකක්** සඳහන් කරන්න.
(viii) මහාපරිනිර්වාණ සූත්‍රයට අනුව බුදු සසුන තහවුරු වීම සඳහා ශ්‍රාවකයින් තුළ සංවර්ධනය විය යුතු කුසලතා **දෙකක්** සඳහන් කරන්න.
(ix) ඕනෑ ම සමාජයකට පොදු සාරධර්ම **දෙකක්** සඳහන් කරන්න.
(x) සමාජ විද්‍යාත්මක පර්යේෂණයකින් ලබා ගත හැකි ප්‍රයෝජන **දෙකක්** ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

02. (i) "සමාජ විද්‍යාව" යන්නෙහි අර්ථය සඳහන් කරන්න. (ලකුණු 02)
(ii) සමාජ විද්‍යාවේ මූලික සංකල්ප **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) සමාජ විද්‍යාව විෂය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** විස්තර කරන්න (ලකුණු 05)

03. (i) සමාජ වෙනස්වීම කෙරෙහි බලපාන සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 02)
(ii) නූතන සමාජවල දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) මහින්දාගමනය නිසා ශ්‍රී ලාංකේය සමාජය වෙනස් වූ ආකාරය නිදසුන් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04. (i) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ සමාජීය විද්‍යාඥයින් **දෙදෙනෙකුගේ** නම් ලියන්න.

(ලකුණු 02)

(ii) සංස්කෘතියට අයත් අංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) බටහිර ජාතීන්ගේ ආක්‍රමණ නිසා සිංහල සංස්කෘතියෙහි ඇති වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න.

(ලකුණු 05)

05. (i) දුම්රියක ගමන් ගන්නා මගීන් සමාජයක් ලෙස **නො පිළිගන්නේ** ඇයි? හේතු **දෙකක්** දක්වන්න.

(ලකුණු 02)

(ii) සමාජ ආයතන **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(iii) පුද්ගල පෞරුෂය වර්ධනය කෙරෙහි පංචශීල ප්‍රතිපදාව වැදගත් වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

06. (i) සමාජ පාලනය අවශ්‍ය වන්නේ ඇයි? හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(ii) සමාජ පාලනය නිසි පරිදි ක්‍රියාත්මක නො වීමෙන් ඇති වන ගැටලු **තුනක්** සඳහන් කරන්න.

(ලකුණු 03)

(iii) සමාජ පාලනය සඳහා බුදු දහමින් ලැබෙන පිටිවහල බෞද්ධ ඉගැන්වීම් **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

07. (i) දුගී බව අවම කිරීමට ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) සමාජ ගැටලු නිවාරණයට ඉවහල් වන බෞද්ධ ඉගැන්වීම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) මත්ද්‍රව්‍ය උවදුර දුරු කිරීමට සුදුසු යෝජනා **පහක්** කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

.

08. (i) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් බෙදනු ලබන ප්‍රධාන කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 02)

(ii) සමාජය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම අවශ්‍ය වන්නේ ඇයි? හේතු **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) සමාජ විද්‍යාත්මක පර්යේෂණයක මූලික පියවර **පහ** කෙටියෙන් දක්වන්න. (ලකුණු 05)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக் கல்விப் பிரிவு

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 03 ශ්‍රේණිය

## (08) සමාජ විද්‍යාව - I, II

පැ තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

### සමාජ විද්‍යාව I පත්‍රය

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40 ක්** ලැබේ.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. සමාජ විද්‍යාව නම් විෂය බිහි කිරීමට මූලික ව ක්‍රියා කළ දාර්ශනිකයා කවුද?
(1) ඔගස්ට් කොම්ට් (2) එමිල් ඩුර්කයිම් (3) හර්බට් ස්පෙන්සර් (4) ටැල්කොට් පාර්සන්ස්

2. සාම්ප්‍රදායික කිතුනු ආගමට නව ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීමට පුරෝගාමී වූයේ,
(1) කාල් මාක්ස් හා මැක්ස් වේබර් ය. (2) මැක්ස් වේබර් හා ජෝන් කැල්වින් ය.
(3) මාර්ටින් ලූතර් හා කාල් මාක්ස් ය. (4) මාර්ටින් ලූතර් හා ජෝන් කැල්වින් ය.

3. **එමිල් ඩුර්කයිම්** විසින් සමාජය විද්‍යාත්මකව හැදෑරීමට අධ්‍යයන ක්‍රමවේදයක් හඳුන්වා දුන් ප්‍රධාන කෘතිය මින් කුමක් ද?
(1) ආගමික ජීවිතයේ මූලික හරය (2) සමාජයේ ශ්‍රම විභජනය
(3) සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීති (4) සියදිවි නසා ගැනීම

4. "සමාජ ස්ථිතිකත්වය" යනුවෙන් අදහස් කරන්නේ,
(1) සමාජ වෙනස් වීමයි. (2) සමාජ පැවැත්මයි. (3) සමාජ සංවර්ධනයයි. (4) සමාජ පරිහාණියයි.

5. පුද්ගලයාගේ සමාජයීය කාර්යයන්ට සමාජ විද්‍යාව යොදා ගැනෙන ආකාරය අධ්‍යයනය කෙරෙන්නේ,
(1) ශුද්ධ සමාජ විද්‍යාව මගිනි. (2) සාමාන්‍ය සමාජ විද්‍යාව මගිනි.
(3) සූක්ෂ්ම සමාජ විද්‍යාව මගිනි. (4) ප්‍රායෝගික සමාජ විද්‍යාව මගිනි.

6. විස්තෘත පවුලකට අයත් සාමාජිකයින් පමණක් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) අත්තා, පියා හා පුතා (2) මව, පියා හා පුතා (3) පියා, මව හා දුව (4) මව, දුව හා පුතා

- පහත දැක්වෙන පෞරුෂ ලක්ෂණ උපයෝගී කර ගෙන 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - සිහි නුවණ ඇති බව
B - සිත එකඟ කිරීමට අපහසු බව
C - ඉක්මනින් අදහස් වෙනස් කරන බව
D - සෑම දෙයක් ම ක්‍රමානුකූලව සිදු කරන බව

7. බුද්ධිවාදී චරිතයක් ඇති අයෙකුගේ පෞරුෂ ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

8. තර්කවාදී චරිතයක් ඇති අයෙකුගේ පෞරුෂ ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

9. සමාජ අනුශාසකත්ව භූමිකාව සිදු කරන භික්ෂුවක් වඩාත් ම සැලකිලිමත් විය යුත්තේ,
(1) සමාජ ස්වභාවය කෙරෙහි ය. (2) පුද්ගල ස්වභාවය කෙරෙහි ය.
(3) ආර්ථික ස්වභාවය කෙරෙහි ය. (4) දේශපාලන ස්වභාවය කෙරෙහි ය.

[2 වැනි පිටුව බලන්න.

10. සමාජ සමූහ පිළිබඳ වඩාත් ම නිවැරදි ප්‍රකාශය දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) පුද්ගලයින් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසකි.
(2) පුද්ගල කණ්ඩායම් එකතුවකි.
(3) සමාජ සම්බන්ධතා මගින් එකට එක් වූ සාමාජික එකතුවකි.
(4) සමාන වයසින් යුතු පුද්ගල එකතුවකි.

11. වෙනස් වන සමාජයේ වෙනස් **නොවන** එක ම සාධකය වන්නේ,
(1) වෙනස් වීමයි. (2) අධ්‍යාපනයයි. (3) පරිසරයයි. (4) සාරධර්මයි.

- පහත දැක්වෙන සමාජ ලක්ෂණ උපයෝගී කර ගෙන 12 සහ 13 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - සිරිතට වඩා නීතියට මුල් තැනක් ලැබීම.
B - ඒකීය ජන සමාජයක් වීම.
C - සාධිත තත්ත්වය ප්‍රමුඛ වීම.
D - මට වඩා අපි යන සංකල්පය ප්‍රබල වීම.

12. ප්‍රාථමික සමාජවලට ආවේණික ලක්ෂණ පමණක් දැක්වෙන නිවැරදි වරණය වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

13. නූතන සමාජවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද ?
(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

14. **එමිල් ඩුර්කයිම්** හඳුන්වා දුන් යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් යුතු සමාජයක් යනු,
(1) කාර්මික තාක්ෂණය බහුලව භාවිත වූ සමාජයකි.
(2) තාක්ෂණයෙන් ඉහළ යන්ත්‍ර සූත්‍ර භාවිත කරන නවීන සමාජයකි.
(3) යාන්ත්‍රීකරණය වූ සංකීර්ණ සමාජයකි.
(4) සම්ප්‍රදායයන් මත මෙහෙයවුණු හා සම්ප්‍රදාය නො ඉක්මවූ සමාජයකි.

15. පන්ති ගැටුම නිසා සමාජ පරිණාමය සිදු වන බව දැක්වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා කවුද?
(1) හර්බට් ස්පෙන්සර් (2) කාල් මාක්ස් (3) එමිල් ඩුර්කයිම් (4) ඔගස්ට් කොම්ට්

- පහත (අ) තීරුවේ සමාජ පරිණාමයට බලපෑ හේතු ද (ආ) තීරුවේ සමාජ විද්‍යාඥයින්ගේ නම් ද දැක්වේ. ඒ ඇසුරින් 16 වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

| (අ) තීරුව | (ආ) තීරුව |
|---|---|
| (1) තර්කානුකූලව කටයුතු කිරීම | (A) එමිල් ඩුර්කයිම් |
| (2) සමාජය දෙස යථාර්ථවාදීව බැලීම | (B) මැක්ස් වේබර් |
| (3) වැඩ බෙදා ගෙන සිදු කිරීම | (C) ඔගස්ට් කොම්ට් |

16. ඉහත (ආ) තීරුවේ දැක්වෙන සමාජ විද්‍යාඥයින්ගේ නම් (අ) තීරුවේ අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන වඩාත් නිවැරදි වරණය තෝරන්න.
(1) A, B හා C (2) B, A හා C (3) B, C හා A (4) C, A හා B

- පහත සඳහන් A, B, C හා D යන සිද්ධි යුගල අධ්‍යයනය කර අංක 17 සහ 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A - | (i) | සමානාත්මතාව |
| | (ii) | සමාජ ගැටුම් |
| B - | (i) | හිංසනය |
| | (ii) | ජීවත්වීමේ බිය |
| C - | (i) | පරිත්‍යාගශීලීභාවය |
| | (ii) | සතුට |
| D - | (i) | ආත්මාර්ථය |
| | (ii) | පරෝපකාරය |

17. අංක (i) හි වැඩි වීම අංක (ii) හි වැඩි වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක වන්නේ,
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) B සහ D ය.

18. අංක (i) හි වැඩි වීම අංක (ii) හි අඩු වීම කෙරෙහි බලපාන සිද්ධි යුගල දෙක තෝරන්න.
(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) C සහ D

[3 වැනි පිටුව බලන්න.

19. පිරිවෙන් අධ්‍යාපන පරමාර්ථවල දැක්වෙන "පටිවේධ ශාසනය" යන්නෙන් අදහස් වන්නේ,
(1) උගත් ත්‍රිපිටක දැනුම ක්‍රියාවට නැංවීමයි.
(2) ත්‍රිපිටක දැනුම ලබා ගැනීමයි.
(3) ත්‍රිපිටකය අධ්‍යයනය කිරීමයි.
(4) ත්‍රිපිටක දැනුම භාවිතයෙන් ලබන අවබෝධයයි.

20. ප්‍රාචීන විභාග පාඨමාලාවට අයත් ප්‍රධාන විෂය තුන දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) සිංහල, පාලි, ඉංග්‍රීසි
(2) සිංහල, පාලි, සංස්කෘත
(3) සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි
(4) පාලි, සංස්කෘත, ඉංග්‍රීසි

21. සංස්කෘතියට අයත් **නොවන** දේවල් ඇතුළත් වරණය මින් කුමක්ද ?
(1) ත්‍රිපිටකය, බයිබලය, අල් කුරාණය
(2) ස්තූපය, මුරගල, සඳකඩපහණ
(3) නීතිය, සාරධර්ම, සිරිත්
(4) ඉර, හඳ, තාරකා

22. කුඩා දරුවකුගේ පෞරුෂත්ව වර්ධනය කෙරෙහි බෙහෙවින් ම බලපාන සාධකය මින් කුමක් ද?
(1) දෙමාපියන්ගෙන් ලැබෙන ආදරය හා සෙනෙහස
(2) සමපදස්ථයින් සමග සෙල්ලම් කිරීම
(3) පරිසරයෙන් ලබා ගන්නා විවිධ අත්දැකීම්
(4) රූපවාහිනී කාටූන් නැරඹීම

- පහත දැක්වෙන උත්සව උපයෝගී කර ගෙන 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - තෛපොංගල් උත්සවය
B - හජ්ජි උත්සවය
C - රාමසාන් උත්සවය
D - දීපවාලී උත්සවය

23. හින්දු සංස්කෘතියට අයත් උත්සව පමණක් දැක්වෙන නිවැරදි වරණය වනුයේ,
(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

24. ඉස්ලාම් සංස්කෘතික උත්සව පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

- පහත දැක්වෙන සංස්කෘතිකාංග උපයෝගී කර ගෙන 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - රෝම ලන්දේසි නීතිය
B - ඇන්ග්ලිකන් නිකාය
C - රෙපරමාදු නිකාය
D - කතෝලික පල්ලි මුල් කර ගත් අධ්‍යාපනය

25. ඕලන්ද ජාතිකයින්ගෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එක් වූ සංස්කෘතිකාංග පමණක් නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

26. ඉංග්‍රීසීන්ගෙන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට එක් වූ සංස්කෘතිකාංග පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා D

- පහත දැක්වෙන තත්ත්වයන් උපයෝගී කර ගෙන 27වෙනි ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A - පැවිදි සහෝදර හිමිවරුන්ට පැවිදි සහෝදරයෙකි.
B - යහළු හිමිවරුන්ට යහළුවෙකි.
C - පිරිවෙනේ දී ගුරුවරයෙකි.
D - ලොකු හාමුදුරුවන්ට කීකරු ගෝලයෙකි.

27. සාමණේර නමකට අවස්ථානුරූපීව ආරෝපණය වන තත්ත්වයන් පමණක් දැක්වෙන වරණය කුමක් ද?
(1) A, B හා C (2) A, B හා D (3) A, C හා D (4) B, C හා D

28. ගෝත්‍රික සමාජවලට ආවේණික ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
(1) සරල කෘෂිකාර්මික කටයුතුවල යෙදීම
(2) දියුණු තාක්ෂණයක් භාවිත කිරීම
(3) අනෙකුත් සමාජවලින් හුදෙකලාව ජීවත් වීම
(4) නගර නිර්මාණය කිරීම

29. රටකින් රටකට පැමිණ එම නව සමාජ චාරිත්‍ර වාරිත්‍ර රටාවට අනුගත කරලීමේ සමාජානුයෝජන ක්‍රියාවලිය,
(1) තෘතීයික සමාජානුයෝජනයයි.
(2) සාවද්‍ය සමාජානුයෝජනයයි.
(3) පුනර් සමාජානුයෝජනයයි.
(4) ප්‍රාථමික සමාජානුයෝජනයයි.

30. අවිධිමත් සමාජ පාලන කාරක පමණක් නිවැරදි ව දැක්වෙන වර්ණය කුමක් ද?
(1) සිරිත් විරිත්, සාරධර්ම, නීතිය
(2) සිරිත් විරිත්, සාරධර්ම, අගයන්
(3) නීතිය, අගයන්, සාරධර්ම
(4) සිරිත් විරිත්, නීතිය, විශ්වාස

[4 වැනි පිටුව බලන්න.

31. සමාජ පාලනයට මග පෙන්වන, කුසල් දියුණු කිරීම හා අකුසල් බැහැර කිරීම සම්බන්ධ ව ඉගැන්වෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයට අයත් අංගය වනුයේ මින් කුමක් ද?
(1) සම්මා සති (2) සම්මා ආජීව (3) සම්මා වායාම (4) සම්මා කම්මන්ත

32. **එමිල් ඩුර්කයිම්** විසින් ඉදිරිපත් කරන ලද අනෝමියත්වය යනු,
(1) ප්‍රතිමාන විරහිතතාවයි. (2) සාර ධර්ම ඇගයීමයි.
(3) ධර්මතා පිළිගැනීමයි. (4) ප්‍රතිමානයන්ට අනුගත වීමයි.

- පහත දැක්වෙන පිරිහීමට හා වසල බවට පත් වීමට බලපාන කරුණු ඇසුරින් 33 හා 34 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - ගමෙහි හෝ වනයෙහි හෝ තිබෙන අන්සතු දෙයක් සොර සිතින් ගැනීම
B - නිසරු කතාබහෙහි යෙදෙමින් අලස ව සිටීම
C - මගීන් නසා ඔවුන් සතු දේ පැහැර ගැනීම
D - ගැහැනුන් කෙරෙහි ලොල් ව තමන් සතු දේ විනාශ කර ගැනීම
E - ණයක් ගෙන එම ණය ආපසු නො ගෙවා මග හැරීම
F - සුරාවට ලොල් ව තමන් සතු දේ විනාශ කර ගැනීම

33. පරාභව සූත්‍රයට අනුව දුගී බවට පත් වීමට හේතු වන කරුණු පමණක් ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.
(1) A, B හා C (2) B, D හා F (3) C, D හා E (4) D, E හා F

34. දුප්පත් රාජ්‍යක් නිර්මාණය වීම කෙරෙහි බලපාන, වසල සූත්‍රයේ දැක්වෙන කරුණු පමණක් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) A, C හා E ය. (2) B, C හා E ය. (3) B, D හා F ය. (4) C, D හා F ය.

35. **හර්බට් ස්පෙන්සර්**ට අනුව රාජ්‍ය විසින් දුගියන්ට සහනාධාර සැපයීමෙන්,
(1) සමාජය තුළ කම්මැළිකම වර්ධනය වේ. (2) සමාජය සංවර්ධනය ඇති වේ.
(3) රාජ්‍ය ආර්ථිකය වර්ධනය වේ. (4) පුද්ගල සංවර්ධනය සිදු වේ.

36. ශ්‍රී ලාංකේය සමාජ තුළ ධනය පාදක කර ගෙන ඉහළ පහළ තත්ත්වයන් නිර්මාණය වීමට බලපෑ මූලික සාධකය කුමක් ද?
(1) කාර්මීකරණයේ ව්‍යාප්තිය (2) ඉන්දියානු ආක්‍රමණ (3) ධනවාදයේ නැගීම (4) බටහිර ආක්‍රමණ

37. සිවුපිරිසෙන් යුතු බෞද්ධ සමාජය නිර්මාණය වීමට පාදක වූ බෙදීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) ගිහි හා පැවිදි (2) ගිහි හා කුල (3) ජාති හා ගිහි (4) ජාති හා කුල

- පහත සඳහන් සිද්ධිය ඇසුරින් අංක 38 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
තම පිරිවෙනේ සිසුන් සමග සමාජ විද්‍යා පර්යේෂණයක් සිදු කිරීමට කටයුතු සැලසුම් කිරීමේ දී නන්ද හිමියන් සිදු කළ මූලික කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - සිසුන් සමග සාකච්ඡා කර ගොඩනගා ගත් ගැටලුවට බලපානු ලබන්නේ යැයි සිතිය හැකි හේතු හඳුනා ගැනීම
B - සමාජයට ගොස් පුද්ගලයින් සමග කතාබහ කර තොරතුරු ලබා ගැනීම
C - එකතු කර ගත් දත්ත ක්‍රමානුකූලව පෙළගස්වා ඒවායින් පිළිබිඹු වන යථා තත්ත්වය අනාවරණය කර ගැනීම

38. ඉහත A අක්ෂරය යටතේ සිදු කළ විද්‍යාත්මක පර්යේෂණ පියවර හඳුන්වන්නේ,
(1) දත්ත විශ්ලේෂණය ලෙස ය. (2) උපන්‍යාස ගොඩනැගීම ලෙස ය.
(3) දත්ත එකතු කිරීම ලෙස ය. (4) ගැටලුව හඳුනාගැනීම ලෙස ය.

39. ඉහත B අක්ෂරය යටතේ දත්ත ලබා ගත් ක්‍රමය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
(1) සම්මුඛ සාකච්ඡා (2) නිරීක්ෂණ (3) ප්‍රශ්නාවලී (4) ප්‍රක්ෂේපණ

40. ඉහත C අක්ෂරයෙන් දැක්වෙන පර්යේෂණ පියවර කුමක් ද?
(1) නිගමන (2) දත්ත විශ්ලේෂණය (3) යෝජනා (4) කල්පිත ගොඩ නැගීම

* * *

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - பிரிவெனாக் கல்விப் பிரிவு

| 08 | S | I, II |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 03 ශ්‍රේණිය

## (8) සමාජ විද්‍යාව - II

- පළමුවන ප්‍රශ්නය සහ තවත් **ප්‍රශ්න හතරක්** ද තෝරාගෙන, **ප්‍රශ්න පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. i. සමාජ විද්‍යාව විෂයයේ දී සමාජය අධ්‍යයනය කරන ප්‍රධාන තේමා **දෙක** සඳහන් කරන්න.
   ii. **මැක්ස් වේබර්ගේ** අධ්‍යයනයට ලක්වූ මූලික සමාජ සංකල්ප **දෙකක්** සඳහන් කරන්න.
   iii. කාර්මීකරණයේ බලපෑම නිසා ශ්‍රී ලාංකේය සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** ලියන්න.
   iv. ප්‍රාථමික සමාජයෙන් වෙන්ව නූතන සමාජය හඳුනා ගත හැකි ප්‍රධාන ලක්ෂණ **දෙකක්** ලියන්න.
   v. ශ්‍රී ලාංකේය සමාජයේ අන්තර් සංස්කෘතික සහයෝගිතාව ප්‍රදර්ශනය වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න.
   vi. මහා මංගල සූත්‍රයේ සඳහන්, සමාජ සම්බන්ධතා තහවුරු වන ධර්ම කරුණු **දෙකක්** ලියන්න.
   vii. නීති පද්ධතියක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
   viii. වයස්ගතභාවය සමාජ ගැටලුවක් වීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.
   ix. පෘතුගීසීන් පෙරදිග රටවලට පැමිණීමට බලපෑ හේතු **දෙකක්** ලියන්න.
   x. සමාජ සමූහයක පවතින පොදු ලක්ෂණ **දෙකක්** ලියන්න.

(ලකුණු 02 × 10 = 20යි)

2. i. "සමාජ විද්‍යාව" යන්නෙහි අර්ථය කුමක් ද? (ලකුණු 02 යි)
   ii. සමාජ විද්‍යාව විෂයයේ දී සාකච්ඡා කෙරෙන මූලික සංකල්ප **තුනක්** ලියන්න (ලකුණු 03 යි)
   iii. සමාජ විද්‍යාව ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

3. i. සමාජ පරිණාමය නිසා ඇති වන යහපත් ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   ii. සමාජ වෙනස් වීමට බලපාන සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
   iii. ශ්‍රී ලාංකේය සමාජයේ සංවර්ධනය සඳහා පිරිවෙනෙන් සිදු වී ඇති සේවාවන් **පහක්** දක්වන්න. (ලකුණු 05 යි)

4. i. ක්‍රිස්තියානි ආගමේ දසපනතට අයත් ඉගැන්වීම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
   ii. සංස්කෘතිය පවරා දීමේ කාර්යයේ නියුතු ජන සන්නිවේදන මාධ්‍ය **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. බුදු දහමේ බලපෑම නිසා ශ්‍රී ලාංකේය සංස්කෘතියේ සිදු වූ වෙනස්කම් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

5. i. සමාජය යනු කුමක් ද? (ලකුණු 02 යි)
   ii. සංස්කෘතිය පවරා දීමේ කාර්යයේ නියුතු ජන සන්නිවේදන මාධ්‍ය **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. සමාජ ආයතන **පහක්** උපයෝගි කර ගෙන ඒවා අතර ඇති අන්තර් සම්බන්ධතාව ඇඳ දක්වන්න. (ලකුණු 05 යි)

6. i. සමාජ පාලනය සිදු වන ප්‍රධාන ක්‍රම **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)
   ii. සමාජ පාලනයේ දී භික්ෂූන් වහන්සේලාගෙන් අපේක්ෂා කරන කාර්යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. සාරධර්ම **පහකින්** යුතු, ඔබට ම සමාජයකට පිළිගත හැකි සාරධර්ම පද්ධතියක් නිර්මාණය කරන්න. (ලකුණු 05 යි)

7. i. සමාජ ගැටලුවක් ඇති වීමට බලපාන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   ii. වකුගඩු රෝගය සමාජ ගැටලුවක් වන්නේ ඇයි? කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. මදිරාබාධය නම් සමාජ ගැටලුව නිවාරණයට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

8. i. සමාජ විද්‍යා පර්යේෂණයක් යනු කුමක් ද? (ලකුණු 02 යි)
   ii. සමාජ විද්‍යා පර්යේෂණ සිදු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   iii. ග්‍රාම සංවර්ධන වැඩසටහනක් සැලසුම් කිරීමේ දී සිදු කළ යුතු මූලික කාර්යයන් **පහක්** ලියන්න. (ලකුණු 05 යි)

* * *